International Federation of
Library Associations and Institutions

# ඉෆ්ලා පාසල් පුස්තකාල මාර්ගෝපදේශය

**ඉෆ්ලා පාසල් පුස්තකාල අංශයේ ස්ථාවර කමිටුව විසින් සම්පාදනය කරන ලදී**

සංස්කරණය: පාසල් පුස්තකාලයාධිපතීන්ගේ අන්තර්ජාතික සංගමයේ විධායක මණ්ඩලයේ සහයෝගයෙන් බාබරා සුල්ට් ජොන්ස් සහ ඩයනි ඕබර්ග් විසිනි

**දෙවන ප්‍රතිශෝධන සංස්කරණය**

2015 ජූනි

**ඉෆ්ලා IFLA විද්වත් කමිටුව මඟින් ස්ථිර කරන ලදී.**



**සිංහල පරිවර්තනයකි. Sinhalese Translation**

**පරිවර්තනය:** උදිත අලහකෝන් [B.A. (Hons), MLS]
ඔක්තෝබර් 2017

ඉංග්‍රීසියෙන් රචිත මුල් ප්‍රකාශය සිංහලට පරිවර්තනය කිරීමේ දී මුල් පිටපතට වඩා වෙනස්කම් ඇති විය හැක. මෙම පරිවර්තනය හුදු විමර්ශන කටයුතු සඳහා පමණි.

cc BY අන්තර්ජාතික පුස්තකාල සංගම් හා ආයතන සම්මේලනය, 2015.

**සංස්කාරක මණ්ඩලය** (2016/2017)

- නීතා දමයන්ති පීරිස් (ප්‍රධාන සංස්කාරක)
- ඩිල්මණී වර්ණසූරිය
- තුෂාරි සෙනවිරත්න
- සුනේත්‍රා කාරියවසම්
- මෂ්රූෆා මොහමඩ් මජීඩ්
- සුබ්‍රමනියන් නවණීදක්‍රිෂ්නන්

**ග්‍රන්ථ සමීක්ෂණය :** ආචාර්ය පී.ඩී. අමරසිරි [B.A. (Sri Jayawardenepura), MLS (Colombo, Ph.D. (Kalaniya)]

**ISBN: 978-955-9075-26-4**

© පුස්තකාල සංගම් සහ ආයතනවල අන්තර්ජාතික සම්මේලනය

This work is licensed under the Creative Commons Attribution 4.0 International(CC BY 4.0) license. To view a copy of this license, visit: http://creativecommons.org/licenses/by/4.0

IFLA
P.O. Box 95312
2509 CH Den Haag
Netherlands

www.ifla.org

## සංස්කාරක සටහන

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ 2017-2022 උපායමාර්ගික සැලැස්මට සමගාමීව 2016/2017 ප්‍රකාශන කමිටුව විසින් ඉෆ්ලා ආයතනය මගින් ප්‍රකාශිත විද්වත් වාර්තා 4ක් සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

උපායමාර්ගික සැලැස්මේ දක්වා ඇති පරිදි මෙම පරිවර්තන කර්තව්‍යයේ මූලික අරමුණ වූයේ දේශීය භාෂාවලින් පුස්තකාල විද්‍යා ප්‍රකාශන හිඟවීමත්, ඒ හේතුවෙන් පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය හදාරණ සිසුවන්ට මෙන්ම, පුස්තකාලයාධිපතීන්ට විවිධ දුෂ්කරතා රැසකට මුහුණ පෑමට සිදු වී ඇති බැවින් එම අපහසුතා මගහරවා ගැනීමේ පිළියමක් ලෙසිනි. තවද අන්තර්ජාතික මට්ටමේ ඇති තොරතුරු පුස්තකාලයාධිපතීන්ට සහ පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය හදාරණ ශිෂ්‍යයන්ට දැනගැනීමට සැලැස්වීමත් මෙම ව්‍යාපෘතියේ තවත් එක් අරමුණක් විය.

මෙම ව්‍යාපෘතිය මගින් සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද ***'ඉෆ්ලා පාසල් පුස්තකාල මාර්ගෝපදේශය'*** යන ඉෆ්ලා ලේඛනය තුළින් පුස්තකාලයාධිපතීන්ට සහ පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය හදාරණ ශිෂ්‍යයන්ට සහ අනිකුත් පාඨකයන් හට පාසල් පුස්තකාල මාර්ගෝපදේශ පිළිබඳ විශාල දැනුම් සම්භාරයක් ලබා ගත හැකි වේ යැයි විශ්වාස කරමි.

මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම සඳහා සහාය වූ සංස්කාරක මණ්ඩල සාමාජිකයින්ටත්, එහි සෝදුපත් බලා සමීක්ෂණ කටයුතු සිදු කළ සමීක්ෂකවරුන්ටත් ස්තූතිය පුද කරමි. එසේම මෙම පරිවර්තන ව්‍යාපෘතිය ඉදිරියට ගෙනයාමට මහඟු පිටුවහලක් ලබාදුන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපතිනිය ඇතුළු විධායක මණ්ඩල සාමාජිකයින්ටත් මාගේ කෘතඥතාව ස්තූතිය පිරිනමමි.

**නීතා දමයන්ති පීරිස්**
ප්‍රධාන සංස්කාරක
ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

පටුන

**විධායක සාරාංශය ........................................................................................... 7**

**නිර්දේශ ........................................................................................................ 11**

**හැඳින්වීම ...................................................................................................... 14**

**01 පරිච්ඡේදය පාසල් පුස්තකාලයක මෙහෙවර සහ අභිප්‍රායන් ...................................... 19**

1.1 හැඳින්වීම ........................................................................................... 19

1.2 සන්දර්භය ........................................................................................... 19

1.3 පාසල් පුස්තකාලයක් පිළිබඳ නිර්වචනය ........................................................ 20

1.4. පාසලක් තුළ පාසල් පුස්තකාලයක භූමිකාව ..................................................... 21

1.5 ඵලදායී පාසල් පුස්තකාල වැඩසටහනක් සඳහා කොන්දේසි ......................................... 22

1.6 පාසල් පුස්තකාලයක දැක්ම ප්‍රකාශය ............................................................. 22

1.7 පාසල් පුස්තකාලයක මෙහෙවර ප්‍රකාශය ......................................................... 23

1.8 පාසල් පුස්තකාල සේවා .......................................................................... 23

1.9 පාසල් පුස්තකාල සේවා සහ වැඩසටහන් ඇගැයීම ................................................ 24

ප්‍රයෝජනවත් මූලාශ්‍ර.................................................................................... 24

**02 පරිච්ඡේදය පාසල් පුස්තකාලයක් සඳහා නීතිමය සහ මූල්‍යමය රාමුව ................................ 26**

2.1 හැඳින්වීම ........................................................................................... 26

2.2. නීතිමය පදනම් සහ ගැටලු ........................................................................ 26

2.3 ආචාරධාර්මික පදනම් සහ ගැටලු ................................................................. 27

2.4 පාසල් පුස්තකාල සංවර්ධනය සඳහා යටිතල සහායන් ............................................. 27

2.5 ප්‍රතිපත්ති ........................................................................................... 28

2.6 සැලසුම්කරණය ..................................................................................... 29

2.7 අරමුදල් සම්පාදනය ................................................................................ 29

ප්‍රයෝජනවත් මූලාශ්‍ර.................................................................................... 30

**03 පරිච්ඡේදය පාසල් පුස්තකාලයක මානව සම්පත ............................................................ 32**

3.1 හැඳින්වීම ........................................................................................... 32

3.2 කාර්යමණ්ඩල භූමිකා සහ තර්කයන් ............................................................. 32

3.3 පාසල් පුස්තකාලයාධිපතිවරයකු පිළිබඳ නිර්වචනය ............................................. 33

3.4 පාසල් පුස්තකාල වැඩසටහනක් සැපයීමට අවශ්‍ය නිපුණතා ...................................... 34

3.5 වෘත්තීය පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ භූමිකා ............................................ 35

3.5.1 උපදේශකත්වය ................................................................................ 35

3.5.2 කළමනාකරණය ................................................................................ 35

3.5.3 නායකත්වය සහ සහයෝගීතාව .............................................................. 36

3.5.4 ප්‍රජා සබඳතා .................................................................................. 37

3.5.5 පුස්තකාල වැඩටසහන් සහ සේවා ප්‍රවර්ධනය ........ 38
3.6 පාසල් පුස්තකාල අර්ධ වෘත්තීය කාර්යමණ්ඩලයේ භූමිකාව සහ නිපුණතා ........ 38
3.7 පාසල් පුස්තකාල ස්වේච්ඡා සේවකයකුගේ භූමිකාව සහ නිපුණතා ........ 38
3.8 ආචාරධාර්මික ප්‍රමිති ........ 39
ප්‍රයෝජනවත් මූලාශ්‍ර ........ 40

**04 පරිච්ඡේදය පාසල් පුස්තකාලයක භෞතික හා ඩිජිටල් සම්පත් ........ 41**
4.1 හැඳින්වීම ........ 41
4.2 පහසුකම් ........ 41
4.2.1 පිහිටීම සහ අවකාශය ........ 41
4.2.2 අවකාශය සංවිධානය ........ 42
4.2.3 භෞතික සහ ඩිජිටල් ප්‍රවේශය ........ 42
4.3 එකතු සංවර්ධනය සහ කළමනාකරණය ........ 42
4.3.1 එකතු සංවර්ධන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපටි ........ 43
4.3.2 ඩිජිටල් සම්පත්වලට සම්බන්ධ ගැටලු ........ 44
4.3.3 එකතු ප්‍රමිති ........ 45
4.3.4 සම්පත් බෙදාහදා ගැනීම ........ 46
ප්‍රයෝජනවත් මූලාශ්‍ර ........ 46

**05 පරිච්ඡේදය පාසල් පුස්තකාලයක වැඩසටහන් සහ ක්‍රියාකාරකම් ........ 48**
5.1 හැඳින්වීම ........ 48
5.2 වැඩසටහන් සහ ක්‍රියාකාරකම් ........ 49
5.3 සාක්ෂරතාව සහ කියවීම් ප්‍රවර්ධනය ........ 50
5.4 මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා උපදේශකත්වය ........ 51
5.5 විමසුම් පාදක ඉගෙනුම් ආදර්ශන ........ 52
5.6 තාක්ෂණ සමෝධානය ........ 56
5.7 ගුරුවරුන් සඳහා වෘත්තීය සංවර්ධනය ........ 56
5.8 පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ උපදේශාත්මක භූමිකාව ........ 57
ප්‍රයෝජනවත් මූලාශ්‍ර ........ 57

**06. පරිච්ඡේදය පාසල් පුස්තකාල ඇගැයීම සහ මහජන සබඳතා ........ 59**
6.1 හැඳින්වීම ........ 59
6.2 පාසල් පුස්තකාල ඇගැයීම සහ සාක්ෂි පාදක ව්‍යවහාරය ........ 60
6.3 පාසල් පුස්තකාල ඇගැයීම වෙතට එළඹුම් ........ 60
6.3.1. වැඩසටහනෙහි ගුණාත්මකභාවය ........ 61
6.3.2 උනන්දු වන්නන්ගේ සංජානනයන් ........ 61

6.3.3. වැඩසටහන් අන්තර්ගතය ........................................................................................... 62
6.3.4 වැඩසටහනෙහි බලපෑම ............................................................................................ 62
6.3.5. සාක්ෂි පාදක ව්‍යවහාර ............................................................................................. 63
6.4 පාසල් පුස්තකාල ඇගැයීමේ බලපෑම් ................................................................................ 64
6.5. පාසල් පුස්තකාලයේ මහජන සබඳතා ............................................................................... 64
6.5.1. ප්‍රවර්ධනය සහ අලෙවිකරණය .......................................................................................... 65
6.5.2. උද්දේශනය ................................................................................................................... 65
ප්‍රයෝජනවත් මූලාශ්‍ර.............................................................................................................. 67

**ශබ්දමාලාව ..........................................................................................................................69**
**ග්‍රන්ථ නාමාවලිය.....................................................................................................................72**

**A ඇමුණුම ඉෆ්ලා/යුනෙස්කෝ පාසල් පුස්තකාල ප්‍රඥප්තිය (1999) ..............................................76**
**B ඇමුණුම පාසල් පුස්තකාලය සඳහා ඇයවැය සැලැස්ම ..........................................................79**
**C ඇමුණුම විමසුම් පාදක ඉගෙනුම සඳහා උපදේශාත්මක ආදර්ශන ...........................................80**
**D ඇමුණුම පාසල් පුස්තකාලය ඇගැයීමට අදාළ පරීක්ෂා කිරීම් ලැයිස්තුවක නියැදියක් ...............81**
**E ඇමුණුම පාසල් විදුහල්පතිවරුන් සඳහා පාසල් පුස්තකාල ඇගයීම පරීක්ෂා කිරීමේ ලැයිස්තුව..84**

# ඉෆ්ලා පාසල් පුස්තකාල මාර්ගෝපදේශය

# විධායක සාරාංශය

## පාසල් පුස්තකාල ප්‍රඥප්තිය

1999 ප්‍රකාශිත ඉෆ්ලා/යුනෙස්කෝ පාසල් පුස්තකාල ප්‍රඥප්තියෙහි දක්වෙන පරිදි ලොව වටා පාසල් පුස්තකාල පොදු අභිප්‍රායක් බෙදාහදා ගනී. එනම්, ඉගැන්වීමේ දී හා ඉගෙනීමේදී සියල්ලන් සඳහා පාසල් පුස්තකාලය යන්නය. පාසල් පුස්තකාල වෘත්තිකයන් ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (1959), ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (1989), ස්වදේශික ජනතාවගේ අයිතීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශය (2007) යනාදියේ වටිනාකම් සහ අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ (ඉෆ්ලා) හර වටිනාකම් දිරි ගන්වයි. ප්‍රඥප්තියෙහි පාසල් පුස්තකාලය නිරූපණය කර ඇත්තේ පාසල් ප්‍රජාව පුරා (අධ්‍යාපනඥයන් සහ සිසුන්) ඉගැන්වීම සහ ඉගෙනුම වර්ධනය කිරීම හා දියුණු කිරීම සඳහා වන බලවේගයක් ලෙසය.

## පාසල් පුස්තකාල මාර්ගෝපදේශ

සියලුම මාර්ගෝපදේශ, සාක්ෂාත් කිරීමට අප අපේක්ෂා කරන දෑ සහ අපට සාධාරණ ලෙස සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කළ හැකි දෑ අතර එකඟතාවක් නියෝජනය කරයි. මෙම ලේඛනයේ සම්පාදකයන් පාසල් පුස්තකාලවල අන්තර්ගත මෙහෙවර සහ වටිනාකම් මඟින් අනුප්‍රාණය ලබා ඇත. එමෙන්ම සම්පත්වලින් පිරිපුන් සහ හොඳින් ආධාර ලැබෙන පාසල් පුස්තකාල සහිත රටවල පවා ද පාසල් පුස්තකාල වෘත්තිකයන් සහ අධ්‍යාපනික තීරකයන් පවා සමස්ත පාසල් ප්‍රජාවේ ඉගෙනුම් අවශ්‍යතාවලට අදාළ වීමටත් ඔවුන්ගේ කාර්යයන් තුළ වෙනස් වන පරිසරයට කල්පනාකාරීව ප්‍රතිචාර දක්වීමටත් අරගලයක යෙදිය යුතු බව හඳුනා ගනී.

## පාසල් පුස්තකාලවල අභිමතාර්ථ

පාසල් පුස්තකාලවල අභිමතාර්ථ වන්නේ සමාජය තුළ වගකිව යුතු සහ සදාචාරාත්මක සහභාගිත්වය සහිත තොරතුරු සාක්ෂරතාවෙන් යුත් සිසුන් සංවර්ධනය කිරීමය. තොරතුරු සාක්ෂරතාවෙන් යුත් සිසුන් යනු නිපුණතාවෙන් යුත් ස්වයං මෙහෙයුමක් සහිත ඉගෙනුම්කරුවන්ය. ඔවුන් තමන්ගේ තොරතුරු අවශ්‍යතා පිළිබඳ දැනුවත් අතර අදහස් ලෝකය තුළ සක්‍රීයව සම්බන්ධ වේ. ඔවුන් ගැටලු විසඳීමට තමන්ගේ හැකියාවන් තුළ විශ්වාසය ප්‍රදර්ශනය කරන අතර අදාළ සහ විශ්වසනීය තොරතුරු සොයා ගන්නා ආකාරය දනී. එමෙන්ම ඔවුනට තාක්ෂණික මෙවලම් හසුරුවාලීමටත් ඉගෙන ගත් දෙය සන්නිවේදනය කිරීමටත් හැකියාව ඇත. බහුවිධ පිළිතුරු සහිත සහ පිළිතුරු නොමැති අවස්ථාවල දී තත්ත්වය පහසුවෙන් මෙහෙයවා ගැනීමට ඔවුනට හැකියාව පවතී. ඔවුන් තමන්ගේ කාර්යයන්හි දී ඉහළ ප්‍රමිතියක් පවත්වා ගෙන යන අතර ගුණාත්මක නිමැවුම් නිර්මාණය කරයි. තොරතුරු සාක්ෂරතාවෙන් යුත් සිසුන් නම්‍යශීලීය; වෙනසට අනුගත විය හැකිය; තනිව මෙන්ම කණ්ඩායමක් තුළ ද කටයුතු කළ හැකිය.

## පාසල් පුස්තකාල සඳහා මූලික ව්‍යුහ

පාසල් පුස්තකාල පවතිනුයේ දැනුම සමාජය තුළ සහභාගිත්වය සඳහා අවශ්‍ය හැකියාවන් ඉගෙනීමට සහ සංවර්ධනය කිරීමට සම අවස්ථා සැපයීම සඳහා වූ ප්‍රාදේශීය, කලාපීය සහ ජාතික ව්‍යුහයක් තුළය. පරිණාමය වෙමින් පවතින අධ්‍යාපනික සහ සංස්කෘතික පරිසරයක් පවත්වා ගෙන යාමට සහ ඊට අඛණ්ඩව ප්‍රතිචාර දැක්වීමට පාසල් පුස්තකාලවලට නීතිමය රාමු සහ තිරසාර අරමුදල්වලින් සහාය දීම අත්‍යවශ්‍ය වේ.

එමෙන්ම පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ ආචාරධාර්මික රාමුවක් තුළය. එය සිසුන්ගේ සහ ඉගෙනුම් ප්‍රජාවේ අනෙක් සාමාජිකයන්ගේ අයිතීන් සහ වගකීම් සැලකිල්ලට ගනී. ස්වේච්ඡා සේවකයන් ද ඇතුළු පාසල් පුස්තකාලවල සේවය කරන සියල්ලන්ට ඔවුන් එකිනෙකා සහ පාසල් ප්‍රජාවේ සියලු සාමාජිකයන් සමඟ කටයුතු කිරීමේදී උසස් ආචාරධාර්මික ප්‍රමිතීන් නිරීක්ෂණය කිරීමට වගකීමක් තිබේ. තමන්ගේ සුවපහසුවට පෙර පුස්තකාල පාඨකයන්ගේ අයිතීන් සලකා බැලීමට උත්සාහ ගනී. එමෙන්ම පුස්තකාල සේවා සැපයීමේ දී ඔවුන්ගේ පෞද්ගලික ආකල්ප සහ විශ්වාස වෙත පක්ෂග්‍රාහී වීමෙන් වලකියි. එමෙන්ම ඔවුහු පාඨකයන්ගේ පෞද්ගලිකත්වයට මෙන්ම දැනගැනීමට ඇති අයිතිය පවත්වා ගෙන යමින් ඔවුන්ගේ හැකියාවන් සහ පසුබිම් පිළිබඳ තැකීමකින් තොරව සමාන පදනමක් මත ළමයින්, තරුණයන් සහ වැඩිහිටියන් යන සියල්ලන් සමඟ කටයුතු කරති.

## පාසල් පුස්තකාල සඳහා කාර්යමණ්ඩල සම්පාදනය

භූමිකාව ඉගැන්වීම සහ ඉගෙනුම් පහසුකම් සැලසීම පාසල් පුස්තකාලයේ නිසා පාසල් පුස්තකාලවල සේවා සහ ක්‍රියාකාරකම්, සමාන මට්ටමේ අධ්‍යාපනය සහිත වෘත්තීය කාර්යමණ්ඩලයක මෙහෙයවීම යටතේ සිදුවීම අවශ්‍යය. ඔවුන් පන්තිකාමර ගුරුවරුන් ලෙසම සූදානම් වීම අවශ්‍ය වේ. පාසලේ නායකත්ව භූමිකාවක් ගැනීම අපේක්ෂිත හෙයින් ඔවුන් පාසල් පරිපාලකයන් සහ ඉගෙනුම් විශේෂඥයන් වැනි පාසලේ අනෙකුත් නායකයන් ලෙස සූදානම් විය යුතු අතර ඊට සමාන අධ්‍යාපනික මට්ටමක් පැවතීම අවශ්‍ය වේ. උපදෙස් දීම, කළමනාකරණය, සහයෝගීතාව සහ නායකත්වය පිළිබඳ වෘත්තීය භූමිකාවන් සඳහා අවශ්‍ය කාලය පාසල් පුස්තකාලයාධිපතීන්ට ලබාදීම සහතික කිරීමට පාසල් පුස්තකාලයේ මෙහෙයුම් අංශ පුහුණු ලිපිකාර සහ තාක්ෂණික කාර්යමණ්ඩලයක් මඟින් මනාව හසුරුවාලනු ලබයි.

පාසල් පුස්තකාල සඳහා වන කාර්යමණ්ඩල රටාවන් රඳා පවතින්නේ නීතිරීති, ආර්ථික සංවර්ධනය, සහ අධ්‍යාපනික යටිතල පහසුකම් මඟින් ජනිත කරන ලද ප්‍රාදේශීය සන්දර්භය මතය. කෙසේ වෙතත්, වසර 50කට වැඩි ජාත්‍යන්තර පර්යේෂණ පෙන්වා දෙන්නේ උපදෙස් දීම, කියවීම් සහ සාක්ෂරතා සංවර්ධනය, පාසල් පුස්තකාල කළමනාකරණය, ගුරුවරුන් සමඟ සහයෝගිතාව සහ අධ්‍යාපනික ප්‍රජාව සමඟ සම්බන්ධ වීම පිළිබඳ සංකීර්ණ භූමිකා සඳහා අවශ්‍ය වෘත්තීය විශේෂඥතාව සංවර්ධනය කිරීමට පාසල් පුස්තකාලයාධිපතීන්ට, පාසල් පුස්තකාලයාධිපතිත්වය සහ පන්තිකාමර ඉගැන්වීම පිළිබඳ විධිමත් අධ්‍යාපනයක් අවශ්‍ය බවයි.

## පාසල් පුස්තකාල එකතු

පාසල් පුස්තකාලයාධිපතීන්, අධ්‍යාපනික ද්‍රව්‍ය පිළිබඳ පුස්තකාල එකතු නිර්මාණය කිරීමට සහ පවත්වා ගෙන යාමට මඟපෙන්වන ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමට පරිපාලකයන් සහ ගුරුවරුන් සමඟ කාර්යයේ නියැළෙයි. එකතු කළමනාකරණ ප්‍රතිපත්තිය විෂයමාලාව සහ පාසල් ප්‍රජාවේ නියත අවශ්‍යතා සහ රුචිකත්වයන් මත පදනම් විය යුතු අතර එයින් පාසලෙන් පරිබාහිර සමාජයේ විවිධත්වය එයින් පිළිබිඹු විය යුතුය. එකතුව ගොඩනැංවීම සාමූහික ප්‍රයත්නයක් බව එම ප්‍රතිපත්තියෙන් පැහැදිලි වීම අවශ්‍යය. තම සිසුන්ගේ අවශ්‍යතා පිළිබඳ වටිනා දැනුමක් සහිත විෂය විශේෂඥයන් ලෙස පුස්තකාල එකතු සංවර්ධනයට සහාය වීමේ දී ඉටුකළ යුතු වැදගත් භූමිකාවක් ගුරුවරුන්ට ඇත. තවද, දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද නිර්මාණය වූ සම්පත් පාසල් පුස්තකාලයට ලබා ගැනීමට සහතික වීම ද වැදගත් වේ. එමෙන්ම මෙම එකතුවෙන් ප්‍රජාවේ සාමාජිකයන්ගේ ජාතික, වාර්ගික, සංස්කෘතික, භාෂාමය, ස්වදේශික සහ වෙනත් සුවිශේෂ අනන්‍යතා පිළිබිඹු වීම අත්‍යවශ්‍යය.

## පාසල් පුස්තකාලවල උපදේශාත්මක වැඩසටහන්

පාසල් පුස්තකාල පහත සඳහන් ප්‍රධාන ඉගැන්වීම් ක්‍රමවිද්‍යාත්මක වැඩසටහන් වෙත අවධානය යොමු කළ යුතුය.

- ★ සාක්ෂරතා සහ කියවීම් වැඩසටහන්
- ★ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව (උදා - තොරතුරු සාක්ෂරතාව, තොරතුරු කුසලතා, තොරතුරු නිපුණතා, තොරතුරු චාතුර්ය, මාධ්‍ය සාක්ෂරතාව, සීමාමායිම් ඉක්මවූ සාක්ෂරතාව)
- ★ විමසුම් පාදක ඉගෙනුම (උදා - ගැටලු පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය)
- ★ තාක්ෂණය සමෝධානය
- ★ ගුරුවරුන් සඳහා වෘත්තීය සංවර්ධනය
- ★ සාහිත්‍ය සහ සංස්කෘතික රසවින්දනය

මාධ්‍ය සහ තොරතුරු කුසලතා ඉගැන්වීම සඳහා විධිමත් රාමුවක් තිබීමේ වැදගත්කම පාසල් පුස්තකාලයාධිපතීන් හඳුනා ගනී. එමෙන්ම ගුරුවරුන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම හරහා සිසුන්ගේ කුසලතා ඉහළ නැංවීමට ඔවුන් දායක වේ.

## පාසල් පුස්තකාල ඇගැයීම

ඇගැයීම යනු අඛණ්ඩ වර්ධනයේ නොනිමි චක්‍රයෙහි තීරණාත්මක අංගයකි. පුස්තකාලයේ අභිමතාර්ථ සමඟ එහි වැඩසටහන සහ සේවාවන් එක පෙළට තැබීමට ඇගැයීම උපකාරී වේ. ඇගැයීම, පාසල් පුස්තකාල වැඩසටහන් සහ සේවාවන් වෙතින් ලද ප්‍රයෝජන සිසුන්ට සහ ගුරුවන්ටත්, පුස්තකාල කාර්යමණ්ඩලයටත්, පුළුල් අධ්‍යාපනික ප්‍රජාවටත් පැහැදිලි කරයි. ඇගැයීම, වැඩටසහන් හා සේවා දියුණු කර ගැනීමට අවශ්‍ය සාධක සපයන අතර වැඩසටහන හා සේවා අවබෝධ කර ගෙන තක්සේරු කිරීමට පුස්තකාල කාර්යමණ්ඩලයටත් පුස්තකාල

පාඨකයන්ටත් සහාය වේ. සාර්ථක ඇගැයීම වැඩසටහන් හා සේවා අලුත් කිරීම සහ නව වැඩටසටහන් හා සේවා සංවර්ධනය කිරීම වෙතට යොමු වේ.

## පාසල් පුස්තකාලය සඳහා සහාය පවත්වා ගෙනයාම

මහජන සබඳතා සහ උපදේශනයට සම්බන්ධ නව ඇරඹුම් සඳහා මඟපෙන්වීමට ද ඇගැයීම අත්‍යවශ්‍ය වේ. ඉගැන්වීමේ දී සහ ඉගෙනුමේ දී පාසල් පුස්තකාලයේ භූමිකාව හැමවිටම හොඳින් තේරුම් ගෙන නොමැති නිසා පුස්තකාල අරමුදල් සහ වෙනත් සහායන් පවත්වා ගෙන යාම සහතික කිරීමට පාසල් පුස්තකාලයේ හවුල්කාර කණ්ඩායම් සහ සහායකයන් සමඟ සබඳතා ගොඩනංවා ගැනීම අවශ්‍ය වේ.

## මෙම ලේඛනය ගැන

මෙය ඉෆ්ලා හි පාසල් පුස්තකාල අංශය විසින් ප්‍රකාශයට පත්කරන ලද පාසල් පුස්තකාල මාර්ගෝපදේශනයෙහි දෙවන සංස්කරණයයි. මෙම මාර්ගෝපදේශ සංවර්ධනය කර ඇත්තේ සුදුසුකම්ලත් පාසල් පුස්තකාල කාර්යමණ්ඩල මඟින් සපයන ලද ඵලදායී පාසල් පුස්තකාල වැඩසටහන් සහ සේවා වෙත සියලු සිසුන්ට සහ ගුරුවරුන්ට ප්‍රවේශය ලබාදෙන ස්වකීය උත්සාහයේ දී පාසල් පුස්තකාල වෘත්තිකයන්ට සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ තීරකයන්ට සහාය වීම සහතික කිරීමටය. මෙම මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීමට ඉෆ්ලා සමුළුව සහ මධ්‍ය වාර්ෂික රැස්වීම් අතරතුර පවත්වන වැඩමුළුවල දී බොහෝ රටවලින් පැමිණි බොහෝ පුද්ගලයන් සමඟ පැවති සාකච්ඡා, විවාද සහ උපදේශනයන් යොදා ගැණිනි. එමෙන්ම අඛණ්ඩ පුද්ගල හමුවීම් මෙන්ම මාර්ගගත ආකාරයෙන් කරන ලද ලිවීම් සහ විවරණයන් හරහා මෙය සිදු කෙරිණි. ඉෆ්ලා පාසල් පුස්තකාල අංශයේ ස්ථාවර කමිටුවේ සාමාජිකයන්ට ද අන්තර්ජාතික පාසල් පුස්තකාල සංගමයේ විධායක මණ්ඩලයට ද මෙම වාර්තාව සඳහා ස්වකීය විශේෂඥතාව මෙන්ම උද්‍යෝගය බෙදාහදා ගත් අන්තර්ජාතික පාසල් පුස්තකාල ප්‍රජාවේ අනෙකුත් සාමාජිකයන්ට ද සංස්කාරකවරු සිය කෘතඥතාව පළ කර සිටී.

බාබරා සුල්ට් - ජොන්ස්, සභාපති ඩයනි ඕබර්ග්, ලේකම් ඉෆ්ලා පාසල් පුස්තකාල අංශය

2015 ජුනි

## නිර්දේශ

පහත සඳහන් නිර්දේශ සංවර්ධනය කර ඇත්තේ සුදුසුකම්ලත් පාසල් පුස්තකාල කාර්යමණ්ඩලය මඟින් ලබා දෙන ලද ඵලදායි පාසල් පුස්තකාල වැඩසටහන් හා සේවා වෙත සියලු සිසුන්ට සහ ගුරුවරුන්ට ප්‍රවේශය සපයන ස්වකීය උත්සාහයේ දී පාසල් පුස්තකාල වෘත්තිකයන් සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ තීරකයන් විසින් භාවිත කිරීම සඳහාය. මාර්ගෝපදේශ පඨිතය සමග පෙළ ගැසෙන ආකාරයට මෙම නිර්දේශ ඉදිරිපත් කර ඇත. නිර්දේශවලට සහාය දක්වන පඨිතයෙහි අංශ සෑම නිර්දේශයක් අවසානයේම දක්වා ඇත.

පාසල් පුස්තකාලයක සැලසුම්කරණය, සංවර්ධනය, ප්‍රවර්ධනය හෝ ඇගැයීම පිළිබඳ තනි අංගයක් ලෙස මෙම නිර්දේශ භාවිත කිරීමට අපේක්ෂා කරන්නන්ට, නියත පාසල් පුස්තකාලයකට හෝ පාසල් පුස්තකාල පද්ධතියට සම්බන්ධව මෙම සෑම නිර්දේශයකම තත්ත්වය තක්සේරු කිරීමට මිනුමක් භාවිත කිරීමට අවශ්‍ය විය හැකිය. (උදා 'ඔව්', තරමක්, 'නැත' (D උපග්‍රන්ථය බලන්න, ආදර්ශන ඇගැයීම් පරීක්ෂක ලැයිස්තුව) නැතහොත්, අනාගතය වෙතට ගවේෂණය, උද්භවනය, පරිණාමය, ස්ථාපනය, මෙහෙයවීම (බලන්න Leading Learning - Standards and Practice For School Library Learning Commons in Canada 2014, 9 පි.)

### නිර්දේශය 1

පාසල් පුස්තකාලයේ මෙහෙවර සහ අභිප්‍රායන් ඉෆ්ලා/යුනෙස්කෝ පාසල් පුස්තකාල ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශයේ ස්වදේශික ජනතාවගේ අයිතීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශයේ සඳහන් වටිනාකම් සහ ඉෆ්ලාහි හර වටිනාකම් සමඟ ගැලපෙන පරිදි පැහැදිලි දැක්විය යුතුය. **(හැඳින්වීම, 1.7)**

### නිර්දේශය 2

පාසල් පුස්තකාලයේ මෙහෙවර සහ අභිප්‍රායන් ජාතික, කලාපීය සහ ප්‍රාදේශීය අධිකාරීන්ගේ මෙන්ම පාසලේ විෂයමාලාවේ ප්‍රතිඵල සමඟ ගැලපෙන පරිදි අර්ථ දැක්විය යුතුය.

### නිර්දේශය 3

පාසල් පුස්තකාලයක සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය ත්‍රිවිධ ගුණාංගවල සංවර්ධනයට සැලැස්මක් දියත් කළ යුතුය. සුදුසුකම්ලත් පාසල් පුස්තකාලයාධිපතිවරයෙක්, පාසලේ විෂයමාලාවට සහාය වන එකතුවක් සහ පාසල් පුස්තකාලයේ අඛණ්ඩ වෘද්ධිය සහ සංවර්ධනය සඳහා පැහැදිලි සැලැස්මක් යන්න එම ත්‍රිවිධ ගුණාංග වේ.

### නිර්දේශය 4

පාසල් පුස්තකාලය පාසල් ප්‍රජාවගේ වෙනස් වන අවශ්‍යතා සපුරාලන බව සහතික කිරීමට එම සේවාව සහ වැඩටසහන් මෙන්ම පාසල් පුස්තකාල කාර්යමණ්ඩලයේ වැඩකටයුතු අධීක්ෂණය සහ ඇගැයීම ක්‍රමානුකූල පදනමක් මත පවත්වා ගෙන යා යුතුය.

**නිර්දේශය 5**

සියලු සිසුන්ට ප්‍රවේශය සපයන පාසල් පුස්තකාලවල ස්ථාපනය, සහාය සහ අඛණ්ඩ සංවර්ධනය වෙනුවෙන් පැහැදිලිව නිර්වචනය කරන නෛතික වගකීම් සහතික කිරීමට පාසල් පුස්තකාල ව්‍යවස්ථා සුදුසු රාජ්‍ය මට්ටමේ හෝ මට්ටම්වල පැවතිය යුතුය.

**නිර්දේශය 6**

සමාන ප්‍රවේශය, තොරතුරු සහ පෞද්ගලික නිදහස, ප්‍රකාශන හිමිකම හා බුද්ධිමය දේපළ සහ දැන ගැනීමට ඇති ළමයින්ගේ අයිතිය වැනි අයිතීන් ඇතුළු පැහැදිලිව නිර්වචනය කරන ලද පාසල් පුස්තකාලයේ සියලු සාමාජිකයන්ගේ ආචාරධාර්මික වගකීම් සහතික කිරීමට සුදුසු රාජ්‍ය මට්ටමේ හෝ මට්ටම්වල පාසල් පුස්තකාල ව්‍යවස්ථා පැවතිය යුතුය.

**නිර්දේශය 7**

පාසල් පුස්තකාල සේවා සහ වැඩසටහන් පාසල් පුස්තකාලයාධිපතිත්වය සහ පන්තිකාමර ඉගැන්වීම පිළිබඳ විධිමත් අධ්‍යාපනය සහිත වෘත්තීය පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ මෙහෙය වීම යටතේ පැවතිය යුතුය.

**නිර්දේශය 8**

උපදෙස් දීම (උදා - සාක්ෂරතාව සහ කියවීම ප්‍රවර්ධනය, විමසුම් කේන්ද්‍රීය සහ  සම්පත් පාදක), පුස්තකාල කළමනාකරණය, සමස්ත පාසල් නායකත්වය සහ සහයෝගීතාව, ප්‍රජා සබඳතා සහ පුස්තකාල සේවා ප්‍රවර්ධනය ඇතුළු වෘත්තීය පාසල් පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව පැහැදිලිව නිර්වචනය කළ යුතුය.

**නිර්දේශ 9**

වෘත්තීය, අර්ධ වෘත්තීය සහ ස්වේච්ඡා යන සියලු පාසල් පුස්තකාල කාර්යමණ්ඩල, සමාන ප්‍රවේශය, පෞද්ගලිකත්වයට අයිතිය සහ සියලු පුස්තකාල පාඨකයන් සඳහා දැන ගැනීමට ඇති අයිතිය යනාදියට සම්බන්ධ පුස්තකාල ප්‍රතිපත්තිවලට අනුව ක්‍රියා කිරීමට ස්වකීය භූමිකාවන් සහ වගකීම් පැහැදිලිව අවබෝධ කර ගත යුතුය.

**නිර්දේශය 10**

සියලු පාසල් පුස්තකාල කාර්යමණ්ඩල පාසල් ප්‍රජාවේ සාමාජිකයන්ගේ ජාතික, ජාතිකත්ව සහ සංස්කෘතික අනන්‍යතා සමඟ මෙන්ම පාසල් විෂයමාලාව සමඟ ගැලපෙන භෞතික සහ ඩිජිටල් එකතු සංවර්ධනයට  උත්සාහ ගත යුතුය. එමෙන්ම ඔවුන් සූචිකරණය, භාරකාරත්වය සහ සම්පත් බෙදාහදා ගැනීම වැනි ව්‍යවහාරයන් මඟින් සම්පත් වෙත ප්‍රවේශය ඉහළ නැංවීමට ප්‍රයත්න දැරිය යුතුය.

**නිර්දේශ 11**

පාසල් පුස්තකාලයේ පහසුකම්, උපකරණ, එකතු සහ සේවා සිසුන්ගේ සහ ගුරුවරුන්ගේ ඉගෙනුම් සහ ඉගැන්වීම් අවශ්‍යතාවලට සහාය විය යුතුය. මෙම පහසුකම්, උපකරණ, එකතු සහ සේවා, ඉගෙනුම් සහ ඉගැන්වීම් අවශ්‍යතාවල වෙනස්වීම්වලට අනුව පරිණාමය විය යුතුය.

**නිර්දේශය 12**

සම්පත් සහ සේවා වෙත ප්‍රවේශය ශක්තිමත් කිරීමටත් ප්‍රජාවේ සියලු සාමාජිකයන්ගේ යාවජීව ඉගෙනුම සඳහා වන බෙදාහදා ගන්නා ලද වගකීම් පෝෂණය කිරීමටත් පාසල් පුස්තකාල අතර මෙන්ම මහජන සහ ශාස්ත්‍රීය පුස්තකාල සමඟ සබඳතා වර්ධනය කළ යුතුය.

**නිර්දේශය13**

පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ ප්‍රධාන උපදේශාත්මක ක්‍රියාකාරකම්, සාක්ෂරතාව සහ කියවීම් ප්‍රවර්ධනය, මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා උපදේශනය, විමසුම් පාදක ඉගැන්වීම, තාක්ෂණය සමෝධානය සහ ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය වෙත නාභිගත විය යුතුය.

**නිර්දේශය 14**

පාසලේ ශාස්ත්‍රීය, සංස්කෘතික සහ සමාජීය අභිමතාර්ථ සපුරාලීමට දායකත්වය දැක්වීම සඳහා වෘත්තීය පුස්තකාලයාධිපති විසින් විදුහල්පති, විෂයමාලා නායකයන්, ගුරුවරුන්, වෙනත් පුස්තකාල කණ්ඩායම්වල සාමාජිකයන් සහ සංස්කෘතික, භාෂාමය සහ වෙනත් සුවිශේෂ ජන කණ්ඩායම් සමඟ සහයෝගයෙන් පාසල් පුස්තකාලය මඟින් සපයන ලද සේවා සහ වැඩසටහන් සංවර්ධනය කළ යුතුය.

**නිර්දේශය 15**

සාක්ෂි පාදක ව්‍යවහාරයන් පාසල් පුස්තකාලයක සේවා හා වැඩසටහන්වලට මඟ පෙන්විය යුතු අතර වෘත්තීයවේදී ව්‍යවහාරය වර්ධනය කිරීම සඳහාත් පාසලේ ඉගෙනුමට හා ඉගැන්වීමට ධනාත්මකව දායක වන පාසල් පුස්තකාලයක සේවා සහ වැඩසටහන් සහතික කිරීම සඳහාත් අවශ්‍ය දත්ත සැපයිය යුතුය.

**නිර්දේශය 16**

පාසල් පුස්තකාලයේ භාවිතය මෙන්ම සේවා හා වැඩසටහන්වල සහාය පාසල් පුස්තකාලයේ වත්මන් සහ විභව පාඨකයන් සමඟත් පුස්තකාලයේ හවුල්කරුවන් සහ තීරකයන් සමඟත් සිදු කරන සැලසුම් සහගත වූත් විධිමත් වූත් සන්නිවේදනය මඟින් වැඩිදියුණු කළ යුතුය.

## හැඳින්වීම

විවිධ මාදිලිවලින් ලෝකය පුරා ඇති පාසල් පුස්තකාල පොදු අභිප්‍රායක් බෙදා හදා ගනී එනම්, 'සියල්ලන් සඳහා ඉගැන්වීම සහ ඉගෙනුම වර්ධනය කිරීමයි'

මෙම හේතුව නිසා, පාසල් පුස්තකාල වෘත්තිකයෝ සියල්ලන් සඳහා ඇති අවස්ථාවන්ගේ සමානත්වය වෙනුවෙන් පෙනී සිටිති. මේ අනුව ඔවුහු ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශයේ (1959), ස්වදේශික ජනතාවගේ අයිතීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශයේ (2007) වටිනාකම් සහ අන්තර්ජාතික පුස්තකාල සංගම් හා ආයතන සම්මේලනයේ (ඉෆ්ලා) හර වටිනාකම් අනුමත කරති.

- ★ මානව හිමිකම් පිළිබඳ විශ්වීය ප්‍රකාශනයෙහි 19 වගන්තියේ නිරූපණය කරන ලද තොරතුරු, අදහස් සහ නිර්මාණාත්මක කෘති වෙත ප්‍රවේශ වීමේ නිදහස සහ ප්‍රකාශනයේ නිදහස පිළිබඳ මූලධර්ම ඇතුළත් වීම
- ★ ජනතාව, ප්‍රජාව සහ සංවිධාන ඔවුන්ගේ සමාජීය, අධ්‍යාපනික, සංස්කෘතික, ප්‍රජාතන්ත්‍රීය සහ ආර්ථික යහපැවැත්ම සඳහා තොරතුරු, අදහස් සහ නිර්මාණාත්මක කෘති වෙත විශ්වීය සහ සමාන ප්‍රවේශය අවශ්‍ය බව විශ්වාස කිරීම
- ★ ඉහළ තත්ත්වයේ පුස්තකාල හා තොරතුරු සේවා සැපයීම, එම ප්‍රවේශය සහතික කරන බව වටහා ගැනීම.
- ★ සම්මේලනයේ සියලු සාමාජිකයන්ට මෙයට සම්බන්ධ වීමට මාර්ග සැලසීම සඳහා සහ පුරවැසිභාවය, දුබලතාව, ජාතික ප්‍රභවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, භූගෝලීය පිහිටීම, භාෂාව, දේශපාලන දර්ශනය, ජනවර්ගය හෝ ආගම පිළිබඳ සැලකීමකින් තොරව එහි ක්‍රියාකාරකම්වලින් ප්‍රතිලාභ ලැබීමට මාර්ග සැලසීම සඳහා කැපවීම.

මෙම මාර්ගෝපදේශ"ඉෆ්ලා/යුනෙස්කෝ පාසල් පුස්තකාල ප්‍රඥප්තිය - ඉගැන්වීමේදී සහ ඉගෙනුමේ දී සියල්ලන් සඳහා පාසල් පුස්තකාලය' යන්නෙහි ප්‍රකාශිත පාසල් පුස්තකාල සංවර්ධනයේ මූලික ප්‍රතිපත්ති මත පදනම් වී ඇත. 1999 දී පළමුවෙන්ම ප්‍රකාශිත පාසල් පුස්තකාල ප්‍රඥප්තිය භාෂා බොහොමයකට පරිවර්තනය වී ඇති අතර, ස්වකීය පාසල්වල සහ ස්වකීය කලාප සහ රටවල පාසල් පුස්තකාලවල තත්ත්වය ඉහළ නැංවීම සඳහා පාසල් පුස්තකාල වෙනුවෙන් පෙනී සිටින්නන් විසින් අඛණ්ඩව භාවිත කරනු ලබයි.

## ප්‍රඥප්තියේ මෙසේ දැක්වේ.

"අධ්‍යාපනය වෙනුවෙන් වගකියන ස්වකීය අමාත්‍යවරුන් හරහා මෙම ප්‍රඥප්තියේ මූලධර්ම ක්‍රියාවට නංවන උපායමාර්ග, ප්‍රතිපත්ති සහ සැලසුම් සංවර්ධනය කිරීමට පොළඹවනු ලැබේ" මෙම ලේඛනයෙහි මාර්ගෝපදේශ සකස් කර ඇත්තේ ලොව වටා ජාතික සහ ප්‍රාදේශීය මට්ටම්වල තීරකයන් දැනුවත් කිරීමට සහ පුස්තකාල ප්‍රජාවට මඟ පෙන්වීම සහ සහාය ලබා දීමට වේ. ප්‍රඥප්තිය මගින් ප්‍රකාශිත මූලධර්ම ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් නායකයන්ට සහාය වීමට මේවා රචනා කර ඇත. පාසල් සහ පාසල් පුස්තකාල රටින් රටට විශාල විවිධත්වයක් ගන්නා නිසා මෙම මාර්ගෝපදේශ කියවිය යුත්තේ ප්‍රාදේශීය සන්දර්භ පිළිබඳ දැනුවත් බවකින් සහ ඊට සංවේදීවය.

මෙම ලේඛනය අනුප්‍රාණිය මෙන්ම අභිලාශීය වීම අපේක්ෂා කරයි. මෙම ලේඛනයට දායකත්වය දක් වූ බොහෝ දෙනෙක් පාසල් පුස්තකාලයේ මෙහෙවර සහ වටිනාකම් මඟින් අනුප්‍රාණය ලැබූහ. එමෙන්ම සමස්ත පාසල් ප්‍රජාවේ ඉගෙනුම් අවශ්‍යතාවලට අදාළ වීමට සහ ඔවුන් සේවය කරන වෙනස් වන තොරතුරු පරිසරයට කල්පනාකාරීව ප්‍රතිචාර දක්වීමට හොඳින් සම්පත් සහිත මෙන්ම මනා සහාය ලද පුස්තකාල සහිත රටවල පවා පාසල් පුස්තකාල වෘත්තිකයන් සහ අධ්‍යාපන තීරකයන් අරගල කළ යුතු බව මෙම ලේඛනයට දායක වුවන් මැනවින් හඳුනා ගත්හ.

මෙම සියලුම මාර්ගෝපදේශ, සපුරා ගැනීමට අප අපේක්ෂා කරන දෙය සහ අපට සාධාරණව සපුරා ගැනීමට හැකි දෙය අතර සම්මුතියක් නියෝජනය කරයි. පාසල් පුස්තකාලයාධිපතීන්ට ස්වකීය ව්‍යවහාරයන්ට මඟපෙන්විය හැකි සහ පාසල් පුස්තකාල සේවා හා වැඩටසහන්වල අනාගත සංවර්ධනය වෙනුවෙන් පෙනී සිටීමේ දී භාවිත කළ හැකි මෙම ප්‍රමිති සහ මාර්ගෝපදේශ ප්‍රාදේශීය තත්වයන්ට යොදා ගත හැකි වීම වැදගත් වේ. ප්‍රමිති සහ මාර්ගෝපදේශ ප්‍රාදේශීය තත්ත්වය හොඳින් දන්නා පුද්ගලයන් සමඟ 'අනුනාද' දිය යුතුය. අරමුදල් සහ කාර්යමණ්ඩලය ඉහළ නංවන විට හෝ පහසුකමක් ප්‍රතිසංස්කරණය සඳහා යෝජනා කරන විට, එවන් වෙනස්කම්වලට දායක වීමට සම්බන්ධ ප්‍රමිති සාධක සමූහයක් සාක්ෂාත් කර ගැනීමට අදාළ තර්කයන්ට වඩා, සිසු ඉගෙනුම සහ ගුරු සාර්ථකත්වයේ අර්ථයෙන් සැකසීම වඩාත් අවධානයට පාත්‍ර වන තර්කයන් සපයනු ඇත.

අරමුදල්, තාක්ෂණය, එකතුන්, කාර්යමණ්ඩලකරණය සහ පහසුකම් සඳහා වන සියලු ප්‍රමිති සපුරාලීම හොඳම ඉගැන්වීම් සහ ඉගෙනුම් පරිසරය අත්‍යවශ්‍යයෙන්ම සහතික නොකරයි. වඩාත් වැදගත් දෙය වන්නේ පාසල් ප්‍රජාවේ සාමාජිකයන් පාසල් පුස්තකාල පිළිබඳ සිතන ආකාරයයි. එනම්, පාසල් පුස්තකාලවල සදාචාරාත්මක අභිප්‍රායන්ගේ (උදා-යෞවනයන්ගේ ජීවිතවල වෙනසක් ඇති කිරීම) සහ පාසල් පුස්තකාලවල අධ්‍යාපනික අරමුණුවල (උදා-සියල්ලන් සඳහා ඉගැන්වීම සහ ඉගෙනුම වර්ධනය කිරීම) සේවාව තුළ වැඩකටයුතු කිරීමය. පහසුකම්, එකතුන්, කාර්යමණ්ඩලය සහ තාක්ෂණය එම අරමුණු ඉටු කර ගැනීමට පවත්නා මාර්ගයන් පමණි.

පාසල් පුස්තකාල කාර්යමණ්ඩලය ඇතුළු විදුහල්පතීන් සහ අනෙක් හවුල්කරුවන් වැදගත් ප්‍රශ්නයක් සිහියේ තබා ගැනීම අවශ්‍ය වේ. එනම්, පාසල් පුස්තකාල සේවා සහ වැඩසටහන්වලට ප්‍රවේශ වීම වෙතින් සිසුන්ට හා ගුරුවරුන්ට ලබා ගත හැකි සහ ඔවුන් ලබා ගන්නා වටිනාකම් කුමක්ද? යන්නය. පසුගිය දශක හතර පුරා සිදු කරන ලද පර්යේෂණවලින් පෙන්වා දී ඇත්තේ මනා කාර්යමණ්ඩලයක් සහ සම්පත් සහිත පාසල් පුස්තකාලවලට ශිෂ්‍ය සාධනය වෙත කැපී පෙනෙන බලපෑමක් කළ හැකි බවය. පාසල් පුස්තකාලයක වඩාත් තීරණාත්මක සම්පත වන්නේ සිසුන් සඳහා හොඳම දැනුම ගොඩනැංවීම සහ අර්ථාන්විත ඉගෙනුම් අත්දැකීම් නිර්මාණයට අනෙක් ගුරුවරුන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන සුදුසුකම්ලත් වෘත්තීය පාසල් පුස්තකාලයාධිපතිය.

ඉෆ්ලා පාසල් පුස්තකාල මාර්ගෝපදේශය වෙනස් කලාපවල වෙනස් ආකාරවලින් පාසල් පුස්තකාල සංවර්ධනය හා වැඩිදියුණු කිරීමට සහාය කර ගත හැකිය. සංවර්ධනය වෙමින් පවතින, ගොඩනැගෙමින් පවතින රටවල පාසල් පුස්තකාල සඳහා හැකියාවන් සොයා බැලීම අභියෝගයක් විය හැකි වුව ද පාසල් පුස්තකාලවල සදාචාරාත්මක අභිප්‍රාය සහ අධ්‍යාපනික අභිප්‍රාය විවිධ වූත් නිර්මාණශීලී වූත් ආකාරයෙන් මෙකී පරිසරයන්හි දී ආමන්ත්‍රණය කළ හැකිය. ඇතැම් විට පාසල් පුස්තකාල සංවර්ධනයට මූලික වන සාක්ෂරතාවේ ප්‍රධාන මෙවලම් සැපයීම හරහා මෙය කළ

හැකිය. නවෝත්පාදක සාක්ෂරතා ව්‍යාපෘතිවල උදාහරණ ඉෆ්ලා අනුග්‍රහයෙන් මෑතක දී පළ කරන ලද 'පාසල් පුස්තකාල පිළිබඳ ගෝලීය පර්යාලෝකයන්: ව්‍යාපෘති සහ ව්‍යවහාර (Marquardif සහ Oberg, 2011) යන කෘතියෙන් සොයා ගත හැකිය. පාසල් පුස්තකාල මාර්ගෝපදේශ සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වන නවෝත්පාදන මුලපිරීම් පිළිබඳ නිදසුන් ඉෆ්ලා අනුග්‍රහයෙන් මෑතකදී පළ කරන ලද පාසල් පුස්තකාල මාර්ගෝපදේශය පිළිබඳ ගෝලීය ක්‍රියාමාර්ග (Schultz – Jones සහ Oberg, 2015) නම් කෘතියෙහි ඇතුළත් වේ.

ඉෆ්ලා/යුනෙස්කෝ පාසල් පුස්තකාල ප්‍රඥප්තිය පාසල් පුස්තකාල සංවර්ධනයේ පදනම් මූලධර්ම පැහැදිලි කරයි. පාසල් පුස්තකාල මාර්ගෝපදේශය මෙම පදනම් මූලධර්මවල ප්‍රායෝගික ක්‍රියාත්මකභාවයට මඟ පෙන්වන ලබයි. සියල්ලන් සඳහා ඉගැන්වීම සහ ඉගෙනුම වෙත සහාය වීමේ දී හොඳම පාසල් පුස්තකාල සේවා සැපයීමට ගන්නා අපගේ ප්‍රයත්නයන් තුළ ගෝලීයව සිතීමට සහ දේශීයව ක්‍රියා කිරීමට පාසල් පුස්තකාල මාර්ගෝපදේශය අපට අභියෝග කරයි.

## ගෝලීයව සිතීම

මෙම පාසල් පුස්තකාල මාර්ගෝපදේශ පෙන්වා දෙන්නේ අන්තර්ගත කිරීමේ, සමාන අවස්ථාවන්ගේ සහ සමාජ සාධාරණත්වයේ ලෝකයකි. ඒවා 21 සියවසේ සන්දර්භය තුළ ක්‍රියාත්මක කළ හැකි වනු ඇත. එමෙන්ම ඒවා වෙනස, සංචලතාවය සහ වෙනස් මට්ටම් හා අංශ හරහා අන්තර්සබඳතාව මූර්තිමත් කරනු ඇත. ගෝලීයකරණය, ආර්ථික හා සමාජ අස්ථාවරත්වය හා වෙනස, වර්ධනය වන ඩිජිටල් සහ ජංගම තාක්ෂණයන් සහ තිරසාරත්වය හෙවත් පරිසරයේ 'හරිතකරණය' වැනි ප්‍රවණතා ලෝක ව්‍යාප්තව මිනිසුන්ගේ ජීවිත වෙත බලපා ඇත.

අධ්‍යාපනය විෂයමාලාවන්හි සහ වර්ධිත තාක්ෂණයේ (වළාකුළු පරිගණනය, ක්‍රීඩා, ස්මාර්ට් දුරකථන,එකට එක පරිගණක) වෙනස්කම් හරහා වෙනසට ලක් වේ. බොහෝ රටවල මූල්‍යමය සහ නීතිමය සන්දර්භයන් තුළ අධ්‍යාපනය සඳහා නව අරමුදල් ආදර්ශන අවශ්‍ය වේ. ඒවා පාසල් සහ විශ්වවිද්‍යාල සම්බන්ධ පිරිවැය සහ පොදු වියදම් අඩු කිරීම අවධාරණය කරයි. උසස් පාසල් උපාධිධාරීන්ගේ සංඛ්‍යාව ලෝක ව්‍යාප්තව වර්ධනය වුව ද තෘතියික උපාධිධාරීන්ගේ සංඛ්‍යාව බොහෝ රටවල තවමත් පවත්නේ පහළ මට්ටමකය. ආර්ථික සහ සමාජ වෙනස්කම් හේතු කොට ගෙන පාසල් සහ විශ්වවිද්‍යාලවල විදේශීය සිසුන්ගේ සහ දෙවන භාෂාව ඉගෙන ගන්නා සිසුන්ගේ සංඛ්‍යාව වර්ධනය වෙමින් පවතී. තාක්ෂණයේ සර්වත්‍රවර්තී බව (එක විට හැම තැන පැවතීම) ඉගෙනුම්කරුවන් තොරතුරු වෙත ප්‍රවේශ වන ආකාරයත් අන්‍යයන් සමඟ අන්තර්ක්‍රියා කරන ආකාරයත් වෙනස් කර ඇත (OECD,2016) .

ඩිජිටල් න්‍යායපත්‍රය මඟින් ද විවෘත ප්‍රවේශ දත්ත, ඉගෙනුම් මුලපිරීම් සහ අභිසරණය වැනි ප්‍රවණතා මඟින් ද පුස්තකාල වෙත බලපෑම් එල්ල කර තිබේ. ලෝකයේ බොහෝ කොටස්වල රාජ්‍යයන් යුරෝපීය සංගමයේ ඩිජිටල් න්‍යායපත්‍රයට සමාන සැලසුම්කරණ ලේඛන සංවර්ධනය කර ඇත. (http;//ec.europa.eu/digital.agende/eu) එය කුළුණු හතක් මත පදනම් වී ඇත.

1. ඩිජිටල් කේවල වෙළෙඳපොළ - ජාතික දේශසීමා හරහා මාර්ගගත සේවාවල සහ අන්තර්ගතයේ නිදහස් ගලායාමට ඇති බාධක බිඳ දැමීම

2. අන්තර් මෙහෙයුම් සහ ප්‍රමිති - හුදෙක් අන්තර්ජාලය වැනි ඕනෑම ස්ථානයක අඛණ්ඩ අන්තර්ක්‍රියා සහතික කරන තොරතුරු තාක්ෂණ උපාංග, ව්‍යවහාර, දත්ත තැන්පතු සහ සේවා සඳහා නව ප්‍රමිතිය.
3. විශ්වාසය සහ ආරක්ෂාව - පෞද්ගලික දත්ත ආරක්ෂාව සහ සයිබර් සොරකම්වලට සම්බන්ධීකරණය සහිත ප්‍රතිචාර දැක්වීම පිළිබඳ ශක්තිමත් කරන ලද නීති.
4. වේගවත් සහ අධිවේගී අන්තර්ජාලය - වේගවත් ප්‍රවේශය සහ වේගවත් බාගත කිරීම් සැපයීමට වර්ධිත ආයෝජනය
5. පර්යේෂණ සහ නවෝත්පාදන - නව සොයාගැනීම් වානිජකරණය කිරීමට තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ වර්ධිත ආයෝජනය
6. ඩිජිටල් සාක්ෂරතාව, කුසලතා සහ අඩංගුව ඉහළ නැංවීම - විශේෂයෙන් අවවරප්‍රසාදිත අය සඳහා ඩිජිටල් බෙදුම ආමන්ත්‍රණය කිරීමට අධ්‍යාපනය සහ පුහුණුව
7. තොරතුරු සන්නිවේදන තාක්ෂණය මංසැලසු ප්‍රතිලාභ - බලශක්ති පරිභෝජනය අඩු කිරීම, රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීමට සහ සංස්කෘතික උරුමයට ප්‍රවේශය සැපයීමට

පාසල් පුස්තකාල කාර්යමණ්ඩලයට තම ඩිජිටල් කුසලතා සංවර්ධනය කර ගැනීමට සහ ඉහළ නංවා ගැනීමටත් සිසුන්ගේ සහ ගුරුවරුන්ගේ ඩිජිටල් කුසලතා සහ දැනුම සංවර්ධනය කිරීමට සහ ඉහළ නංවා ගැනීමටත්, පාසල් ප්‍රජාව තුළ අන්‍යයන් සමඟ කටයුතු කිරීමට සුදානම් වීමටත් ඩිජිටල් න්‍යාය පත්‍රයේ අවශ්‍යතාව වර්ධනය කරයි. පාසල් පුස්තකාලයේ සේවා සහ වැඩසටහන් ඩිජිටල් සහ ජංගම තාක්ෂණයේ වෙනස්කම් මඟින් බලපෑමට ලක්ව ඇත. නැතහොත් ඉක්මනින්ම බලපෑමට ලක් වනු ඇත. එමෙන්ම මෙම වෙනස්කම් ඩිජිටල් පුරවැසිභාවයේ මූලධර්ම ඉගැන්වීම සඳහා ඇති අවශ්‍යතාව ඉහළ නංවයි.

## දේශීයව ක්‍රියාකිරීම

පාසල් පුස්තකාල මාර්ගෝපදේශය අනුගත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනුයේ දේශීය සන්දර්භයන්ට විශේෂයෙන් නීතිමය සහ විෂයමාලා සන්දර්භයන්ට ගැලපෙන ආකාරයෙනි. පාසල් පුස්තකාල සංවර්ධනය මෙහෙයවන නීති, අධ්‍යාපන පනතක හෝ පුස්තකාල පනතක හෝ මෙම දෙකෙහිම හෝ ඇතුළත් විය හැකිය. නැතහොත් මෙම දෙකෙහිම ඇතුළත් නොවිය හැකිය. පාසල් විෂයමාලා ලේඛන ජාතිකමය හෝ ප්‍රාදේශීය වශයෙන් සංවර්ධනය විය හැකිය. මෙම ලේඛන විශේෂයෙන් පාසල් පුස්තකාලයේ මෙහෙවර, භූමිකාව සහ අභිප්‍රායන් නිර්වචනය කරයි. නැතහොත් ඒවා මෙම කරුණු පිළිබඳ මුළුමනින්ම නිහඬ විය හැකිය.

පාසල් පුස්තකාල ප්‍රාදේශීය අධ්‍යාපනික ප්‍රතිඵල, පාසල් ප්‍රජාවගේ තොරතුරු අවශ්‍යතා, පාසල තුළ සහ ඉන් ඔබ්බෙහි සමාජ, ජාතිකත්ව, සංස්කෘතික, භාෂාමය, ස්වදේශික සහ වෙනත් සුවිශේෂ ජනගහන මානයන් සමඟ එක පෙළට සිටීමේ ක්‍රියාවලියේ දී, රාජ්‍යයන්ට, පුස්තකාල සංගම්වලට, පාසල්වලට, පාසල් නායකයන්ට සහ ප්‍රාදේශීය ප්‍රජාවට මඟ පෙන්වීමට පාසල් පුස්තකාල මාර්ගෝපදේශය අපේක්ෂා කරයි.

පාසලේ යෞවනයන්ගේ අධ්‍යාපනික සාර්ථකත්වයට පාසල් පුස්තකාල සේවාවන්ට කළ හැකි දායකත්වයන්ගේ ගුණාත්මක බව පෙන්වන පර්යේෂණ සාධක සලකා බැලීමට, පාසල් පුස්තකාල මාර්ගෝපදේශය ව්‍යවස්ථාදායකයන් සහ පාසල් පරිපාලකයන් ඇතුළු අධ්‍යාපනික තීරකයන් වෙත ආමන්ත්‍රණය කරනු ලබයි. එමෙන්ම අධ්‍යාපනයෙහි සහ සමාජයෙහි සිදු වන අඛණ්ඩ වෙනස්වීම සමඟ ගමන් කිරීමට ඔවුනට අවශ්‍ය නිපුණතා සංවර්ධනය හා වැඩිදියුණු කිරීමටත් වෙනස පිළිබඳ නියෝජිතයන් සහ වෙනස සඳහා උත්ප්‍රේරකයන් බවට පත් වීමටත් මෙම මාර්ගෝපදේශ පාසල් පුස්තකාල කාර්යමණ්ඩල වෙත ආයාචනා කරනු ලබයි.

## මූලාශ්‍ර


Marquardt, L., & Oberg, D. (2011). *Global perspectives on school libraries: Projects and practices.* The Hague, Netherlands: De Gruyter Saur.

Schultz-Jones, B. & Oberg, D. (2015). *Global action on school library guidelines.* The Hague, Netherlands: De Gruyter Saur.

OECD (Organization for Economic Co-operation and Development). (2014). *Education at a glance 2014: OECD indicators.* Paris: OECD Publishing. Retrieved from dx.doi.org/10.1787/eag-2014-en

# 01 පරිච්ඡේදය

## පාසල් පුස්තකාලයක මෙහෙවර සහ අභිප්‍රායන්

*"පාසල් පුස්තකාලය අද්‍යතන තොරතුරු සහ දැනුම පාදක සමාජය තුළ සාර්ථක ලෙස ක්‍රියා කිරීමට මූලික වන තොරතුරු හා අදහස් සපයනු ලබයි. පාසල් පුස්තකාලය සිසුන්ට වගකිව යුතු පුරවැසියන් ලෙස ජීවත් වීමට හැකියාව ලබා දෙමින් ඔවුන් යාවජීව ඉගෙනුම් කුසලතාවලින් සන්නද්ධ කරන අතර ඔවුන්ගේ පරිකල්පනය සංවර්ධනය කරයි."* පාසල් පුස්තකාල ප්‍රඥප්තිය

### 1.1 හැඳින්වීම

මෙම පරිච්ඡේදය ඉෆ්ලා/ යුනෙස්කෝ පාසල් පුස්තකාල ප්‍රඥප්තිය (1999) විසින් සංවර්ධනය කර ඇති පරිදි පාසල් පුස්තකාලයක මෙහෙවර සහ අභිප්‍රායන් පිළිබඳ සාමාන්‍ය ප්‍රකාශයකි. ප්‍රඥප්තිය තුළ පාසල් පුස්තකාලය නිරූපණය කරනුයේ පාසල් ප්‍රජාව පුරා ඉගැන්වීමෙහි සහ ඉගෙනුමෙහි වර්ධනය සහ වැඩිදියුණු වීම සඳහා පවත්නා බලවේගයක් ලෙසය. (අධ්‍යාපනඥයන් මෙන්ම සිසුන් සඳහා) ප්‍රඥප්තියෙහි හඳුනාගත් ප්‍රධාන කරුණු ඉදිරි පරිච්ඡේදවල දී බෙහෙවින් සවිස්තරාත්මකව සංවර්ධනය කර ඇත.

### 1.2 සන්දර්භය

ලොව පුරා පාසල් පුස්තකාල පවත්නේ සිසුන්, ගුරුවරුන් සහ ප්‍රජා ඉගෙනුම දිරිමත් කරන සහ එයට සහාය වන සම්පත් වෙත ප්‍රවේශ වීමටත් ක්‍රියාකාරකම් සේවා වෙත ප්‍රවේශවීමටත් අවකාශය (භෞතික සහ ඩිජිටල්) සපයන ඉගෙනුම් පරිසරයන් ලෙසය. පාසල් පුස්තකාලවල වර්ධනය අධ්‍යාපනයේ වර්ධනයට සමාන්තර වේ. එය සමාජය තුළ ක්‍රියා කිරීමටත් සමාජයේ යහපත වෙතට දායක වීමටත් සිසුන් දැනුමෙන් සන්නද්ධ කිරීමට උත්සාහ දරයි. පාසල් පුස්තකාල පහසුකම් සහ මෙහෙයුම් පරාසය ලොව පුරා විවිධත්වයෙන් යුක්ත වුව ද සෑම තැනම පාසල් පුස්තකාල නාභිගතව ඇත්තේ සිසු ඉගෙනුමට සහාය වීම සහ එය ඉහළ නැංවීම වෙතටය. පාසල් පුස්තකාලයක් තනි පුද්ගලයන්, කුඩා කණ්ඩායම් මෙන්ම විශාල කණ්ඩායම් සඳහා ද ඉගෙනුම් අවස්ථා පරාසයක් සපයයි. එසේ කිරීමේ දී එය බුද්ධිමය අන්තර්ගතය, තොරතුරු සාක්ෂරතාව සහ සංස්කෘතික හා සමාජ සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කරයි. පාසල් පුස්තකාලයක ඉගෙනුම්කරුවා වෙතට යොමු වූ අවධානය පාසල් විෂයමාලාවට සහාය වන අතර එය ව්‍යාප්ත කර පුද්ගලකරණය කරයි.

#### නිදසුන

ලුබුටෝ පුස්තකාල ව්‍යාපෘතිය සැම්බියාවේ අනාථ සහ අවදානමට ලක් වූ දරුවන් සහ තරුණයන් වෙත සංස්කෘතිකමය වශයෙන් අදාළ සම්පත් හා අධ්‍යාපනික අත්දැකීම් සපයයි.

## 1.3 පාසල් පුස්තකාලයක් පිළිබඳ නිර්වචනය

පාසල් පුස්තකාලය යනු පාසලේ භෞතික සහ ඩිජිටල් ඉගෙනුම් අවකාශයකි. එහිදී තොරතුරුවල සිට දැනුම දක්වා යන සිසුන්ගේ චාරිකාවට සහ ඔවුන්ගේ පෞද්ගලික, සමාජීය සහ සංස්කෘතික වර්ධනයට කරනු ලබන කියවීම, විමසීම, පර්යේෂණ, සිතීම, පරිකල්පනය සහ නිර්මාණශීලිත්වය කේන්ද්‍රීය වේ. මෙම භෞතික සහ ඩිජිටල් ස්ථානය විවිධ නාමයන්ගෙන් (උදා - පාසල් මාධ්‍ය මධ්‍යස්ථානය, ප්‍රලේඛන හා තොරතුරු මධ්‍යස්ථානය, පුස්තකාල සම්පත් මධ්‍යස්ථානය, පුස්තකාල නිදහස් ඉගෙනුම් කලාපය) දැන සිටිය ද මෙම පහසුකම් සහ ක්‍රියාවන් සඳහා වඩාත් පොදුවේ භාවිත කරන ලද සහ ව්‍යවහාර කරන ලද යෙදුම වන්නේ පාසල් පුස්තකාලයයි. වසර 50කට අධික කාලයක් තුළ සිදු කළ ජාත්‍යන්තර පර්යේෂණ පාසල් පුස්තකාලයක් ප්‍රකට කරන පහත ලක්ෂණ හඳුනා ගනී.

- ⋆ එයට පාසල් පුස්තකාලයාධිපතිත්වය සහ පන්තිකාමර ඉගැන්වීම පිළිබඳ විධිමත් අධ්‍යාපනය සහිත සුදුසුකම් ලත් පාසල් පුස්තකාලයාධිපතිවරයකු සිටී. එය උපදේශනය, කියවීම හා සාක්ෂරතා සංවර්ධනය, පාසල් පුස්තකාල කළමනාකරණය, ඉගැන්වීම් කාර්යමණ්ඩල සමඟ සහයෝගිතාව සහ අධ්‍යාපනික ප්‍රජාව සමඟ සබඳතාව පිළිබඳ සංකීර්ණ භූමිකා සඳහා අවශ්‍ය වෘත්තීය විශේෂතාවට හැකියාව ලබා දෙයි.
- ⋆ එය ඉලක්කගත, ඉහළ ගුණාත්මක බවින් යුත් විවිධ එකතු සපයයි. (මුද්‍රිත, බහුමාධ්‍ය, ඩිජිටල්) එය කේවල ව්‍යාපෘති සහ පුද්ගල සංවර්ධනය ඇතුළු පාසලේ විධිමත් සහ අවිධිමත් විෂයමාලාවට සහාය වේ.
- ⋆ එයට අඛණ්ඩ වෘද්ධිය සහ සංවර්ධනය සඳහා පැහැදිලි ප්‍රතිපත්තියක් හා සැලැස්මක් තිබේ.

අධ්‍යාපනික පද්ධතියේ අනෙක් අංග මෙන්ම පාසල් පුස්තකාල ද වෘද්ධියේ සහ සංවර්ධනයේ අවධි හරහා ගමන් කරයි. කෙසේ වෙතත්, පාසල් පුස්තකාලයක මෙහෙවර සහ අභිප්‍රාය සපුරාලීමට පාසල් පුස්තකාලයේ මෙම ලක්ෂණ තුන අත්‍යවශ්‍ය වේ. පර්යේෂණ පෙන්වා දෙන්නේ සිසු ඉගෙනුම වෙත බලපෑම් කිරීම සඳහා වන පාසල් පුස්තකාලයක විභවය, මෙම ලක්ෂණ පාසලේ කොතරම් දුරට පවතීද ද යන්න මත රඳා පවත්නා බවය.

- ⋆ මුද්‍රිත, බහුමාධ්‍ය සහ පාලනය කරන ලද ඩිජිටල් එකතුන් ඇතුළු සියලු මාධ්‍යවල ගුණාත්මක තොරතුරු සම්පත් වෙතට සමාන හා විවෘත ප්‍රවේශය සපයන තොරතුරු අවකාශයක් ලෙස ක්‍රියා කරයි.
- ⋆ පුද්ගල කුතුහලය, නිර්මාණශීලීත්වය සහ ඉගෙනුම වෙතට අනුස්ථාපනය දිරිමත් කරන සහ ඊට සහාය වන මෙන්ම සිසුන්ට විවාදාත්මක මාතෘකා ද ඇතුලු විවිධත්වයෙන් යුත් මාතෘකා පෞද්ගලිකව සහ ආරක්ෂාකාරීව ගවේෂණය කළ හැකි සුරක්ෂිත අවකාශයක් ලෙස ක්‍රියා කරයි.
- ⋆ සිසුන් තොරතුරු සමඟ සම්බන්ධ වීම සහ දැනුම නිර්මාණයට ඇති හැකියාවන් සහ නැඹුරුතා ඉගෙන ගන්නා උපදේශාත්මක අවකාශයක් ලෙස ක්‍රියා කරයි.
- ⋆ දැනුම නිර්මාණය, නියෝජනය සහ බෙදාහදා ගැනීම සඳහා තාක්ෂණ මෙවලම්, මෘදුකාංගවල සහ විශේෂඥතාවේ විවිධත්වයෙන් යුත් පරාසයක් සපයන තාක්ෂණික අවකාශයක් ලෙස ක්‍රියා කරයි.

- ★ කියවීම සහ සාක්ෂරතාව සංවර්ධනයේ සියලු මාදිලි තුළ පාසල් ප්‍රජාව පෝෂණය කරන සාක්ෂරතා මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරයි.
- ★ ඉගෙනුම් ප්‍රජාව යෝග්‍ය පරිදි, සදාචාරාත්මකව සහ ආරක්ෂිතව ඩිජිටල් මෙවලම් භාවිත කිරීමට ඉගෙන ගන්නා සහ අනන්‍යතාව හා පෞද්ගලිකව තොරතුරු ආරක්ෂා කිරීමට උපායමාර්ග ඉගෙන ගන්නා ඩිජිටල් පුරවැසිභාවය සඳහා වන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරයි.
- ★ නිවසේ දී හැම විටම නොමැති සම්පත්, තාක්ෂණය වෙත සමාන ප්‍රවේශය සපයන සහ තොරතුරු කුසලතා සංවර්ධනය හරහා ප්‍රජාවේ සියල්ලන් සඳහා තොරතුරු පරිසරයක් ලෙස ක්‍රියා කරයි.
- ★ පොදු ප්‍රජාව සඳහා ඇති සංස්කෘතික, වෘත්තීය සහ අධ්‍යාපනික ඉසව් (උදා - ඉසව්, රැස්වීම, ප්‍රදර්ශන, සම්පත්) වෙනුවෙන් විවෘත සමාජීය අවකාශයක් ලෙස ක්‍රියා කරයි.

## 1.4. පාසලක් තුළ පාසල් පුස්තකාලයක භූමිකාව

ඉගැන්වීම් සහ ඉගෙනුම් මධ්‍යස්ථානයක් ලෙස පාසලක් තුළ පාසල් පුස්තකාලය ක්‍රියාත්මක වේ. එය විෂයමාලා අන්තර්ගතයට සමෝධානිත සක්‍රීය උපදේශාත්මක වැඩසටහනක් සපයයි. එහි මූලික අවධාරණයන් පහත දැක්වේ.

- ★ සම්පත් පාදක හැකියාවන් - මූලාශ්‍ර ලෙස පුද්ගලයන් සහ සංස්කෘතික වස්තු ඇතුළු විවිධ මාදිලිවල සම්පත් සෙවීමට, අත්පත් කර ගැනීමට සහ ඇගැයීමට සම්බන්ධ හැකියාවන් සහ නැඹුරුතා. මෙම මූලාශ්‍ර සෙවීමට, අත්පත් කර ගැනීමට සහ ඇගයීමට තොරතුරු තාක්ෂණික මෙවලම් භාවිත කිරීම මෙන්ම ඩිජිටල් සහ මුද්‍රිත පාදක සාක්ෂරතාවන් සංවර්ධනය කිරීම ද මීට ඇතුළත් වේ.
- ★ චින්තන පාදක හැකියාවන් - පර්යේෂණ සහ විමසුම් ක්‍රියාවලිය හරහා දත්ත සහ තොරතුරු සමඟ ස්ථාවර සබඳතාවක් වෙත නාභිගත වන හැකියාවන් සහ නැඹුරුතා, ගැඹුරු දැනුම සහ ගැඹුරු අවබෝධය විදහා දක්වන නියෝජනයන්/ නිෂ්පාදන නිර්මාණය කිරීම වෙත මෙහෙයවන උසස් මට්ටමේ සිතීමේ සහ විචාරත්මක චින්තනයේ ක්‍රියාවලීන්.
- ★ දැනුම පාදක හැකියාවන් - ගැඹුරු දැනුම හා අවබෝධය විදහා දක්වන දැනුම නිෂ්පාදනයේ නිර්මාණය,ගොඩනැංවීම සහ බෙදාහදා ගන්නා ලද භාවිතය වෙත නාභිගත වන පර්යේෂණ හා විමසුම් හැකියාවන් සහ නැඹුරුතා
- ★ කියවීම සහ සාක්ෂරතා හැකියාවන් - කියවීමේ විනෝදය, වින්දනය සඳහා කියවීම බහුවිධ තලයන් හරහා සහ අර්ථය සහ අවබෝධය සංවර්ධනය කිරීමට තොරතුරු එහි බහුවිධ ආකෘති සහ මාදිලි තුළ පරිවර්තනය, සන්නිවේදනය සහ බෙදාහැරීම
- ★ පුද්ගල සහ අන්තර්පුද්ගල හැකියාවන් - පර්යේෂකයන්, තොරතුරු භාවිත කරන්නන්, දැනුම නිෂ්පාදකයන් සහ වගකිව යුතු පුරවැසියන් ලෙස තමා සහ අන්‍යයන් පිළිබඳ සම්පත් පාදක විමසුමේ දී සහ ඉගෙනුමේ දී, සමාජීය හා සංස්කෘතික සහභාගිත්වයට සම්බන්ධ හැකියාවන් සහ නැඹුරුතා

- ඉගෙනුම් කළමනාකරණ හැකියාවන් - විෂයමාලා පාදක විමසුම් ඒකකයක් සූදානම් කිරීමට, සැලසුම් කිරීමට සහ සාර්ථකව පවත්වා ගෙන යාමට සිසුන්ට හැකියාව ලබා දෙන හැකියාවන් සහ නැඹුරුතා

විෂයමාලා අන්තර්ගතයට සහ ඵලවලට පැහැදිලිව සම්බන්ධිත කේවල සහ සාමූහික උපදේශකත්වය සහ පහසුකම් හරහා මෙම හැකියාවන් සංවර්ධනයේ දී, පාසල් පුස්තකාලයාධිපතිවරයෙක් නායකත්ව භූමිකාවක යෙදෙයි.

## 1.5 ඵලදායී පාසල් පුස්තකාල වැඩසටහනක් සඳහා කොන්දේසි

ඵලදායී පාසල් පුස්තකාල වැඩසටහනක් සඳහා වඩාත් තීරණාත්මක කොන්දේසිය වන්නේ සුදුසුකම්ලත් පාසල් පුස්තකාල වෘත්තිකයෙකු වෙත ප්‍රවේශය බව පර්යේෂණ මඟින් පෙන්වා දී ඇත. ඉගැන්වීම් වැඩසටහනකින් තොර පාසල් පුස්තකාලයක් (උදා - ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාකාරකම්වල සැලසුම් සහගත විස්තරාත්මක පිළිගැන්වීම) ඉගැන්වීම සහ ඉගෙනුම වෙත බලපෑමක් නොකරනු ඇත. පර්යේෂණ විදහා දක්වනුයේ 3.4 කොටසෙහි දක්වා ඇති භූමිකාවන් පවත්වා ගෙන යාමට හැකියාව ඇත්තේ සුදුසුකම්ලත් පාසල් පුස්තකාල වෘත්තිකයෙකුට බවය.

කියවීම, විමසීම සහ සහයෝගිත්ව නිෂ්පාදනවල මධ්‍යස්ථානයක් ලෙස පුස්තකාලය හඳුනා ගන්නා පැහැදිලිව ව්‍යුහගත වූ ප්‍රතිපත්ති රාමුවක් තුළ පාසල් පුස්තකාලයක් කළමනාකරණය කළ යුතුය. පුස්තකාල ප්‍රතිපත්තියක් සකස් කළ යුත්තේ පාසලේ සමස්ත ප්‍රතිපත්ති සහ අවශ්‍යතා සිත්හි තබා ගෙන වන අතර එයින් එහි අන්තර්ගත ආකල්ප, මෙහෙවර, අභිමතාර්ථ සහ අරමුණු මෙන්ම යථාර්ථය ද පිළිබිඹු විය යුතුය. පාසල් පුස්තකාල වැඩසටහනක සමස්ත ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීමට පුස්තකාල ප්‍රතිපත්තිය හරහා පාසල් පුස්තකාලයක භූමිකාව සඳහා වන පරිපාලන සහාය අත්‍යවශ්‍ය වේ. ඊළඟ පරිච්ඡේදවල දී සාකච්ඡා කරන ඵලදායි පාසල් පුස්තකාල වැඩසටහනක් සක්‍රීය කිරීමට පහසුකම්, භෞතික සහ ඩිජිටල් සම්පත් මෙන්ම මානව සම්පත් ද අවශ්‍ය වේ.

## 1.6 පාසල් පුස්තකාලයක දැක්ම ප්‍රකාශය

දැක්ම ප්‍රකාශය පෙන්නුම් කරනුයේ පාසල් පුස්තකාලයක් සඳහා අපේක්ෂිත අනාගත තත්ත්වයයි. මෙම දැක්ම පාසල් පුස්තකාලයේ ආරම්භක තත්ත්වය මත රඳා පවතිමින් ලොව පුරා විවිධත්වයක් ගනී. අවසාන වශයෙන්, අධ්‍යාපනයේ දී කේන්ද්‍රීය භූමිකාවක් රඟදැක්වීමට පාසල් පුස්තකාලය සඳහා දැක්මක් ගොඩනංවයි. එය වත්මන් සීමාවන් ඉක්මවා යන අතර බහු කෘත්‍යාත්මක ඉගෙනුම් අවකාශයක් සැපයීමට අනාගතය වෙතට යොමු වූ අභිලාෂයක් නිර්මාණය කරයි.

මෙම දැක්මට 2013 ඉෆ්ලා ප්‍රවණතා වාර්තාවේ හඳුනා ගන්නා ලද ප්‍රධාන ප්‍රවණතා පහක් ඇතුළත් වේ. (Trends - ifla org)

1. නව තාක්ෂණයන් තොරතුරු වෙත ප්‍රවේශය සහිත පුද්ගලයෙකු ව්‍යාප්ත කිරීම මෙන්ම සීමා කිරීම ද සිදු කරනු ඇත.
2. මාර්ගගත අධ්‍යාපනය ගෝලීය ඉගෙනුම විදහා දැක්වීම මෙන්ම ව්‍යාකූල කිරීම ද සිදු කරනු ඇත.

3. පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂණය පිළිබඳ දේශසීමා යළි අර්ථ දක්වෙනු ඇත.
4. අධි සබඳතා සහිත සමාජයක් නව හඬවලට සහ කණ්ඩායම්වලට සවන් දෙනු ඇති අතර ඒවා සවිබල ගන්වනු ඇත.
5. නව තාක්ෂණයන් මඟින් ගෝලීය තොරතුරු ආර්ථිකය පරිවර්තනයට ලක් කරනු ඇත.

## 1.7 පාසල් පුස්තකාලයක මෙහෙවර ප්‍රකාශය

මෙහෙවර යනු පාසලේ බෙදාහදා ගන්නා ලද අභිප්‍රායයේ සහ කැපවීමෙහි කොටස ලෙස පාසල් පුස්තකාලයේ ස්වභාවය, අභිප්‍රාය සහ භූමිකාව පිළිබඳ නිර්වචනයකි. ලොව පුරා පාසල් පුස්තකාල සඳහා මෙහෙවර 1999 ඉෆ්ලා/යුනෙස්කෝ පාසල් පුස්තකාල ප්‍රඥප්තිය විසින් පැහැදිලි කර ඇත. (A ඇමුණුම) තනි පාසල් පුස්තකාලයක් සඳහා වන මෙහෙවර ප්‍රකාශය අධ්‍යාපනික සන්දර්භය සමඟ පෙළ ගැසීමට ප්‍රඥප්තියේ මෙහෙවරෙහි සංරචකයන් පිළිබිඹු කළ යුතුය. පාසල සහ පාසල් පුස්තකාලය රඳා පවත්නේ මෙම සන්දර්භය තුළය. එය සම්පත් සහ මඟ පෙන්වන සැලසුම්කරණයක් වෙත නාභිගත වීමටත් එහි සාමාජිකයන්ගේ අවශ්‍යතා අවබෝධ කර ගැනීම නිර්වචනය කිරීම මඟින් ප්‍රජාවට සේවා සැපයීමේ අපේක්ෂාව සන්නිවේදනය කිරීමටත් මඟපෙන්වීම සැපයිය යුතුය. එමෙන්ම එම අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය කුසලතා, සම්පත් සහ ධාරිතාව ද ප්‍රජාවට ප්‍රතිලාභ ලද හැකි අපේක්ෂිත ඵලය ද සැපයිය යුතුය. මෙය සිසුන් ඔවුන්ගේ අනාගත කාර්ය සඳහා සහ පුරවැසියන් ලෙස සූදානම් කිරීමේ අධ්‍යාපනික අවශ්‍යතාව සමඟ පෙළ ගැසිය යුතුය.

## 1.8 පාසල් පුස්තකාල සේවා

ඉගෙනුම් ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීමට පාසල් පුස්තකාලය සේවා පරාසයක් සපයයි. මෙම සේවාවන් පාසල් පුස්තකාලයක් තුළ දී හෝ එහි පහසුකම් වෙතින් සැපයේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීමේ සේවාවන් පාසලේ සියලු අංශ වෙතට මෙන්ම නිවෙස් වෙතට ද පුස්තකාලයේ ළඟා වීම ව්‍යාප්ත කිරීමට අවස්ථා ඉදිරිපත් කෙරේ. ශක්තිමත් ජාලගත තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් විසින් එකතුන්, ප්‍රජා සම්පත් සහ පාලිත ඩිජිටල් එකතුන් වෙත ද පර්යේෂණ පාදක විමසුම් පවත්වා ගෙන යාමට සහ දැනුම ගොඩනැංවීම, ඉදිරිපත් කිරීම සහ බෙදහදා ගැනීම වෙත ද ප්‍රවේශය සපයනු ලබයි.

පාසල් පුස්තකාල සේවාවන්වල පහත සඳහන් දෑ ඇතුළත් වේ.

- ඉගැන්වීම් කාර්යමණ්ඩලය සඳහා වෘත්තීය සංවර්ධනය (උදා - කියවීම සහ සාක්ෂරතාව, තාක්ෂණය, විමසුම් පර්යේෂණ ක්‍රියාවලි)
- අධ්‍යයන ජයග්‍රහණ සඳහා සහ පුද්ගල විනෝදය සහ පෝෂණය සඳහා විශිෂ්ට සාහිත්‍ය/ කියවීම් වැඩසටහන
- විමසුම් පාදක ඉගෙනුම සහ තොරතුරු සාක්ෂරතා සංවර්ධනය සහ
- අනෙක් පුස්තකාල (මහජන, රජයේ, ප්‍රජා සම්පත්) සමඟ සහයෝගීතාව

පාසල් පුස්තකාල, අධ්‍යාපනික ප්‍රජාව වෙත කැපී පෙනෙන වටිනාකමක් සපයයි. මෙම එකතු කළ අගය පාසල් පුස්තකාල එකතුවෙහි ද්‍රව්‍ය ඉක්මවා විශිෂ්ට පාසල් පුස්තකාල වැඩසටහනක් සහ සුදුසුකම්ලත් පාසල් පුස්තකාලයාධිපතිවරයෙක් හරහා සපයන ලද සේවාවන් දක්වා ව්‍යාප්ත වේ.

## 1.9 පාසල් පුස්තකාල සේවා සහ වැඩසටහන් ඇගැයීම

පාසල් පුස්තකාල සේවා සහ වැඩසටහන් ඇගැයීම පාසල් පුස්තකාල සංවර්ධනයේ අත්‍යවශ්‍ය අංගයකි. ඇගැයීම, වගවීමේ අභිප්‍රායන්ට සේවය කරයි. එය පාසල් පුස්තකාල සේවා සහ වැඩසටහන් පාසල් ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලන්නේ දැයි නිශ්චය කිරීමට සහාය වේ. පාසල් පුස්තකාලය සහ පාසල් පුස්තකාලය සඳහා වන ස්වකීය සහයෝගය සංවර්ධනය කිරීම පිළිබඳ හවුල්කරුවන්ගේ සිතීමට බලපෑම මඟින් පාසල් පුස්තකාල සේවා සහ වැඩසටහන්වල සිදුවෙමින් පවතින පරිවර්තනයට ඇගැයීම දායක විය යුතුය. ඇගයීම් ක්‍රමවේදයක් හෝ එළඹුමක් තෝරා ගැනීම පාසල් ප්‍රජාවගේ අවශ්‍යතාව සහ පුස්තකාලයේ සංවර්ධන අවධිය මත රඳා පවතිනු ඇත. (උදා - වැඩසටහන්වල ගුණාත්මක බව, හවුල්කරුවන්ගේ සංජානනය, වැඩසටහන් අන්තර්ගතය සහ වැඩසටහන්වල බලපෑම)

සමස්ත වැඩසටහනෙහි ගුණාත්මක බව වෙත නාභිගත වන ඇගැයීමක දී පාසල් පුස්තකාලයේ බොහෝ අංශ පරීක්ෂා කිරීමට සහ ශ්‍රේණිගත කිරීමට ජාත්‍යන්තර, ජාතික හා ප්‍රාදේශීය ප්‍රමිති යොදා ගත හැකිය.

(උදා - කාර්යමණ්ඩලකරණය, පහසුකම්, තාක්ෂණය, සහ එකතුන් මෙන්ම උපදේශාත්මක වැඩසටහන්) බොහෝ විට සාක්ෂි පාදක ව්‍යවහාර යනුවෙන් හඳුන්වන පාසල් පුස්තකාල ව්‍යවහාරයන්ගේ වර්ධනය වෙත අවධානය යොමු කරන ඇගැයීමක දී සිසු ඉගෙනුම් නිෂ්පාදන, උපදේශනාත්මක රටා (පන්තිය, ශ්‍රේණිය හෝ විෂය මඟින්), සිසුන්, ගුරුවරුන් සහ /දෙමාපියන් පිළිබඳ සමීක්ෂණ හෝ පුස්තකාලයේ සංසරණ පද්ධතියෙන් සහ සූචිකරණ පද්ධතියෙන් ගන්නා වාර්තා වැනි දත්ත යොදා ගත හැකිය.

කළමනාකරණයේ දී සහ මහජන සබඳතාවේ දී (ප්‍රවර්ධනය, අලෙවිකරණය, උද්දේශනය) ඇගැයීමේ අවශ්‍යතාව සහ එහි ප්‍රයෝජනවත් බව සඳහා වන අවශ්‍යතාව මෙම ලේඛනයේ 6 පරිච්ඡේදයේ දී වඩාත් ගැඹුරින් ගවේෂණය කරනු ඇත.

## ප්‍රයෝජනවත් මූලාශ්‍ර

American Association of School Librarians. (2014). *Governing documents*. Retrieved from www.ala.org/aasl/about/governing-docs

American Association of School Librarians. (2011). *Standards for the 21st century learner*. Retrieved from www.ala.org/aasl/standards-guidelines/learning-standards

Hay, L., & Todd, R. J. (2010). *School libraries 21C*. NSW Department of Education and Training. Retrieved from www.curriculumsupport.education.nsw.gov.au/schoollibraries/assets/pdf/21c_report.pdf

Haycock, K. (1992). *What works: Research about teaching and learning through the school's library resource center*. Seattle, WA: Rockland Press.
*IFLA/UNESCO School Library Manifesto.* (1999). Retrieved from www.ifla.org/publications/iflaunesco-school-library-manifesto-1999

Library Research Service [Colorado State Library, Colorado Department of Education]. *School libraries impact studies*. Retrieved from www.lrs.org/data-tools/school-libraries/impact-studies/

Groupe de Recherche sur la Culture et la Didactique de l'information. (2010). *Parcours de formation à la culture de l'information* [The learning path to an information culture]. Retrieved from http://culturedel.info/grcdi/?page_id=236

Williams, D., Wavell, C., & Morrison, K. (2013). *Impact of school libraries on learning: Critical review of published evidence to inform the Scottish education community.* Aberdeen, Scotland: Robert Gordon University, Institute for Management, Governance & Society (IMaGeS). Retrieved from www.scottishlibraries.org/storage/sectors/schools/SLIC_RGU_Impact_of_School_Libraries_2013.pdf).

## 02 පරිච්ඡේදය

## පාසල් පුස්තකාලයක් සඳහා නීතිමය සහ මූල්‍යමය රාමුව

***"ප්‍රාදේශීය, කලාපීය සහ ජාතික අධිකාරීන්ගේ වගකීම ලෙස නියත නීති සහ ප්‍රතිපත්ති මගින් (පාසල් පුස්තකාලවලට) සහාය ලබා දිය යුතුය. පුහුණුව ලත් කාර්ය මණ්ඩල, ද්‍රව්‍ය, තාක්ෂණයන් සහ පහසුකම් සඳහා පාසල් පුස්තකාලවලට ප්‍රමාණවත් සහ තිරසාර අරමුදල් පැවතිය යුතුය. ඒවාට අය කිරීමක් නොකළ යුතුය."*** පාසල් පුස්තකාල ප්‍රඥප්තිය

### 2.1 හැඳින්වීම

පාසල් පුස්තකාලයක් අධ්‍යාපනික ප්‍රජාවගේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වයි. එම ප්‍රජාවෙහි සියලු සාමාජිකයන්ගේ ප්‍රයෝජනය සඳහා එය පිහිටා ඇත්තේ සහ කටයුතු කරනුයේ එකී ප්‍රජාව තුළය. පාසල් පුස්තකාලයක් පවතිනුයේ ඉගෙනුම සඳහා සමාන අවස්ථා සැපයීමටත් දැනුම සමාජය තුළ සහභාගිත්වයට අවශ්‍ය හැකියාව සංවර්ධනය කිරීමටත් ප්‍රාදේශීය, කලාපීය සහ ජාතික අධිකාරිත්ව රාමුවක් තුළය. පරිණාමය වෙමින් පවතින අධ්‍යාපනික සහ සංස්කෘතික පරිසරයක් තුළ පැවතීමටත් ඊට අඛණ්ඩව ප්‍රතිචාර දැක්වීමටත් පාසල් පුස්තකාලවලට නීති සහ තිරසාර අරමුදල් මඟින් සහාය වීම අවශ්‍ය වේ.

### 2.2. නීතිමය පදනම් සහ ගැටලු

පාසල් පුස්තකාල හා රාජ්‍යයන් අතර සබඳතාවේ බොහෝ වෙනස් මාදිලි ලොව පුරා පවතී. එමෙන්ම ඔවුන්ගේ ක්‍රියාකාරකම් සහ අරමුදල් ලබා ගැනීම් පාලනය කරන නීති විවිධ මෙන්ම සංකීර්ණ වේ. නිදසුනක් ලෙස, පාසල් පුස්තකාල නීති, ප්‍රතිපත්ති සහ ප්‍රමිති රටක අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ සංස්කෘතික අමාත්‍යාංශයේ වගකීමක් විය හැකිය. නැතහොත් මෙම අමාත්‍යාංශ දෙක අතර බෙදාහදා ගන්නා ලද වගකීමක් විය හැකිය. ලෝකයේ සමහර රටවල පාසල් පුස්තකාල සඳහා වන වගකීම සමස්තයක් හෝ කොටසක් වශයෙන් විවිධ පළාත්වලට, ප්‍රාදේශීය සභාවලට සහ පළාත් පාලන ආයතනවලට ලබා දෙයි.

ව්‍යවහාරයේ මූලධර්මයක් ලෙස ඉගෙනුම් පරිසරයක් සැපයීමට පාසල් පුස්තකාල ස්වකීය නීතිමය සහ දේශපාලනික තත්ත්වයන් කාලයත් සමඟ අනුගත කරනු ලබයි. එය, විමසුම, නව සොයා ගැනීම්, නිර්මාණශීලීත්වය, විචාරාත්මක සබඳතාව සහ නවෝත්පාදක ඉගැන්වීම් ක්‍රමවල මධ්‍යස්ථානයක් ලෙස පාසල් පුස්තකාලය ස්ථානගත කර පවත්වා ගෙන යයි. සම්පත්වල තිරසාර මට්ටමක් පිළිබඳ අඛණ්ඩ ඇගැයීම, බුද්ධිමය සංවර්ධනය සඳහා වන සිසු සහායේ ප්‍රමිතියක් සපුරාලීමටත් පුස්තකාල පද්ධතිය තුළ සහ ඉන් ඔබ්බෙහි පවතින, ක්‍රමානුකූල මාර්ගෝපදේශ අවශ්‍ය වන කුසලතා අභිවර්ධනය සපුරාලීමටත් පාසල් පුස්තකාලයට හැකියාව ලබා දෙයි.

## 2.3 ආචාරධාර්මික පදනම් සහ ගැටලු

පාසල් පුස්තකාලය සිසුන්ගේ සහ ඉගෙනුම් ප්‍රජාවේ අනෙකුත් සාමාජිකයන්ගේ අයිතීන් සහ වගකීම් සැලකිල්ලට ගන්නා ආචාරධාර්මික රාමුවක් තුළ පවතී. සියලු සංස්කෘතික, භාෂාමය, ස්වදේශික සහ වෙනත් සුවිශේෂ ජනගහනයන් සාදරයෙන් පිළිගැනීම සහතික කිරීමට පාසල් පුස්තකාලයක් සාකල්‍යවාදී එළඹුමක් යොදා ගනී. වාර්තාගත දැනුම සහ තොරතුරු වෙත සමාන ප්‍රවේශය පිළිබඳ සහ බුද්ධිමය නිදහස පිළිබඳ හර වටිනාකම් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සහ ඉෆ්ලාහි වටිනාකම් තුළ අන්තර්ගත වේ.

අනෙක් සලකා බැලීම් පහත දැක්වේ. එහෙත් ආචාරධාර්මික පදනම් ඒවාට පමණක් සීමා නොවේ.

- ⋆ අයිතීන් පිළිබඳ පුස්තකාල පනත
- ⋆ තොරතුරුවල සහ පෞද්ගලිකත්වයේ නිදහස
- ⋆ ප්‍රකශන හිමිකම්, බුද්ධිමය දේපළ සහ ලේඛන චෞරත්වය පිළිබඳ ප්‍රකාශ
- ⋆ ළමා අයිතීන්
- ⋆ ස්වදේශික ජනතාවගේ අයිතීන්

පාසල් පුස්තකාලයක් වැඩසටහන් හරහා වගකිව යුතු පුරවැසිභාවයට අවශ්‍ය කුසලතා සහ අවබෝධයන් සංවර්ධනය කරයි. එය තොරතුරු නිදහස, බුද්ධිමය දේපළ සහ ලේඛන චෞරත්වය වැනි ආචාරධාර්මික කරුණු පිළිබඳ සිසුන් සහ ඉගෙනුම් ප්‍රජාව දැනුවත් කරයි.

## 2.4 පාසල් පුස්තකාල සංවර්ධනය සඳහා යටිතල සහායන්

ජාතික සහ /හෝ කලාපීය/ ප්‍රාදේශීය මට්ටමේදී අධ්‍යාපනය සඳහා වගකියන පරිපාලන ඒකකය තුළ පාසල් පුස්තකාල ක්‍රියාත්මක කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා සහායක පද්ධතියක් ස්ථාපිත කිරීම අවශ්‍යය. පාසල් පුස්තකාල සේවා සහ ක්‍රියාකාරකම්වල මූලික මට්ටමක් අර්ථදැක්වීමට සහ ක්‍රියාත්මක කිරීමට ප්‍රයත්නයන් දැරිය යුතුය. එවිට ඉගැන්වීම සහ ඉගෙනුම සඳහා සම්පතක් ලෙස පාසල් පුස්තකාලය අවබෝධ කර ගැනීමටත් ඊට ප්‍රවේශ වීමටත් සිසුන්ට සහ ගුරුවරුන්ට හැකියාව ලැබේ. එවන් අධ්‍යාපනික සේවා මධ්‍යස්ථානවල කාර්යයට මතු දැක්වෙන කරුණු වෙත අවධානය යොමු කිරීම ඇතුළත් කළ හැකිය. එනම්, පාසල් පුස්තකාලයාධිපතීන්ගේ මූලික සහ අඛණ්ඩ අධ්‍යාපනය, වෘත්තීය උපදෙස් ලබා දීම, පර්යේෂණ අධ්‍යයන, පාසල් පුස්තකාලයාධිපතීන්ගේ කණ්ඩායම් සහ ඔවුන්ගේ වෘත්තීයවේදී සංගම් සමග සහයෝගිතාව සහ ප්‍රමිති හා මාර්ගෝපදේශ සංවර්ධනය යනාදියයි.

පාසල් පුස්තකාල සේවා සහ ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ ව්‍යාප්තිය රටින් රටට සහ පාසලෙන් පාසලට විවිධ වේ. කෙසේ වෙතත්, සිසුන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සංචලතාවයේ වර්ධනය අදහස් කරනුයේ පාසල්වල සංගත බව සහ පාසල් පුස්තකාල වෙත ප්‍රවේශය, පාසල් ප්‍රජාවේ සාමාජිකයන්ගේ අවශ්‍යතා සපුරාලීමට අධ්‍යාපනික පද්ධතියේ ධාරිතාව ඉහළ නංවන බවය.

**නිදසුන**

ඇමෙරිකා එක්සත් ජනපදයේ ටෙක්සාස් විධායකය විසින් 1967 දී ප්‍රාන්තයේ සියලු පාසල් දිස්ත්‍රික්කවලට සහාය වීමට කලාපීය අධ්‍යාපනික සේවා මධ්‍යස්ථාන 20ක පද්ධතියක් නිර්මාණය කරන ලදී. මෙම අධ්‍යාපනික සේවා මධ්‍යස්ථානවල භූමිකාව වන්නේ ප්‍රධාන අරමුණු තුනක් ක්‍රියාවට නැංවීමට පාසල් දිස්ත්‍රික්ක සමඟ එක පෙළට කටයුතු කිරීමය. එනම්, (I) පද්ධතියේ සෑම කලාපයකම ශිෂ්‍ය සාධනය වර්ධනය කිරීමේ දී පාසල් දිස්ත්‍රික්කවලට සහාය වීම, (II) වඩාත් කාර්යක්ෂම සහ සකසුරුවම් ලෙස ක්‍රියා කිරීමට පාසල් දිස්ත්‍රික්කවලට හැකියාව ලබාදීම සහ (III) ව්‍යවස්ථාදායකය හෝ කොමසාරිස් විසින් නියම කරන මුලපිරීම් ක්‍රියාත්මක කිරීම වේ. අධ්‍යාපනික සේවා මධ්‍යස්ථාන සහායක පරිපාලකයන්ට, පාසල් පුස්තකාලයාධිපතීන්ට සහ ගුරුවරුන්ට වෘත්තීය සංවර්ධනය, තාක්ෂණික සහාය සහ අධ්‍යාපනික වැඩසටහන් කළමනාකරණය සපයනු ලැබේ.

## 2.5 ප්‍රතිපත්ති

හර සම්පතක් ලෙසත් කියවීම හා විමසීම සඳහා මධ්‍යස්ථානයක් ලෙසත් පුස්තකාල හඳුනා ගන්නා, පැහැදිලිව ව්‍යුහගත කරන ලද ප්‍රතිපත්ති රාමුවක් තුළ පාසල් පුස්තකාලයක් කළමනාකරණය කළ යුතුය. පාසල් පුස්තකාලයක ප්‍රතිපත්තිය සම්පාදනය කළ යුත්තේ පාසලේ සමස්ත ප්‍රතිපත්ති සහ අවශ්‍යතා සිහියේ තබා ගෙන වන අතර පාසලේ අන්තර්ගත ආකල්ප, මෙහෙවර, අභිමතාර්ථ සහ අරමුණු මෙන්ම යථාර්ථය ද පිළිබිඹු වන පරිදිය.

පුස්තකාලය සියල්ලන් සඳහාය යන්න මෙම ප්‍රතිපත්තියෙන් පැහැදිලි විය යුතුය. එය පරිපාලකයන් (උදා - විදුහල්පතිවරුන්, පාසලේ ප්‍රධානීන්, අධ්‍යාපනික කාර්යමණ්ඩලය) සහ ගුරුවරුන් සමඟ එක්ව කටයුතු කරමින් පාසල් පුස්තකාලයාධිපති විසින් සංවර්ධනය කළ යුතුය. ප්‍රතිපත්ති කෙටුම්පත පාසල් ප්‍රජාව අතර පුළුල් ලෙස බෙදා හදා ගෙන විවෘත සාකච්ඡා මඟින් සහාය ලබා ගත යුතුය. ව්‍යවහාරය සහ සංවර්ධනය සඳහා වන දර්ශනය, සංකල්පය සහ අපේක්ෂා වටහා ගත්, අනුමත කළ සහ භාවිතයට සූදානම් අවසන් ප්‍රතිපත්තිය පුළුල් ලෙස බෙදා හදා ගත යුතුය.

ප්‍රතිපත්තිය මත පදනම්ව සංවර්ධනය කරන ලද ප්‍රතිපත්ති ලේඛනය සහ සැලසුම් පහත සංරචකයන්ට සම්බන්ධව පාසල් පුස්තකාල භූමිකාව නිශ්චිත කළ යුතුය.

- ★ පාසලෙහි විධිමත් සහ අවිධිමත් විෂයමාලාව
- ★ පාසලෙහි ඉගෙනුම් ක්‍රමවේද
- ★ ජාතික සහ ප්‍රාදේශීය ප්‍රමිති සහ නිර්ණායක
- ★ සිසුන්ගේ ඉගෙනුම සහ පුද්ගල සංවර්ධනය
- ★ ගුරුවරුන්ගේ අවශ්‍යතාව
- ★ අධ්‍යයන ජයග්‍රහණයන්ගේ වර්ධනය වන මට්ටම්
- ★ විමසුම් කුසලතා සංවර්ධනය කිරීම
- ★ කියවීම ප්‍රවර්ධනය සහ අභිප්‍රේරණය
- ★ විවෘත මානසිකත්වය සහ ප්‍රජා සබඳතා

යථාර්ථවාදී ප්‍රතිපත්ති රාමුවක් සහ අනතුරුව ක්‍රියාකාරී සැලසුම් නිර්මාණයේ දී මෙම සියල්ල අත්‍යවශ්‍ය වේ. ක්‍රියාකාරී සැලැස්ම අභිමතාර්ථ, කාර්යයන් සහ උපායමාර්ග මෙන්ම අධීක්ෂණ සහ ඇගැයීම් පිළිවෙළකින් නිමවිය යුතුය. ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලසුම් ක්‍රමානුකූල විමසුමට යටත් සක්‍රීය ලේඛන විය යුතුය.

## 2.6 සැලසුම්කරණය

පාසල් පුස්තකාලයක් සැලසුම් කිරීමේ දී පාසල් ඉගෙනුම් ප්‍රජාවේ සෙසු සාමාජිකයන්ට පාසල් පුස්තකාලයේ සබඳතාව නිශ්චය කිරීමට පරිපාලකයන්, ගුරුමණ්ඩලය සහ සිසුන් සමඟ වන උපදේශකත්වය සහිත පාසල් පුස්තකාලයාධිපතිගේ සක්‍රීය දායකත්වය අවශ්‍ය වේ. සැලසුම්කරණ ක්‍රියාවලිය තුළ සලකා බැලීමට වැදගත් මානයන්ට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

- ★ ජාතික සහ ජාත්‍යන්තර කණ්ඩායම් විසින්, අනාගතය වෙතට යොමු වූ අධ්‍යයනයන් මඟින් හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අභිමතාර්ථ
- ★ ජාතික සහ පාසල් මට්ටමේ අධ්‍යාපනික මෙහෙවර, දර්ශනය, අභිමතාර්ථ සහ අරමුණු
- ★ පාසලට පාසල් පුස්තකාලයේ වටිනාකමත් අධ්‍යාපනික ක්‍රියාවලියේ දී උනන්දුව දක්වන්නන්, සංස්කෘතික හවුල්කරුවන් සහ අරමුදල් සපයන්නන්ගේ භූමිකාවත් පැහැදිලි කරන දැක්ම ප්‍රකාශයක්.
- ★ වර්තමානයේ පාසල් පුස්තකාලයේ භූමිකාව හඳුනාගන්නා සහ ඉගෙනුම් මධ්‍යස්ථානයක් ලෙස අනාගතයේ දී එය පැවතිය යුතු ස්ථානය පෙන්වා දෙන අවශ්‍යතා තක්සේරුවක්
- ★ ගුණාත්මක සම්පත් පහසුකම් සහ භෞතික සහ ඩිජිටල් පරිසරයන් වෙතට ප්‍රවේශය සමඟ පාසල් ප්‍රජාව සම්බන්ධ කරන සැලැස්මක්
- ★ තාක්ෂණයේ අනාගත ප්‍රක්ෂේපණයන් සහ තොරතුරු හා සේවා බෙදාහැරීමේ දී විභව වෙනස්කම් සමඟ තාක්ෂණික සැලැස්මක්
- ★ ශිෂ්‍ය කේන්ද්‍රීය සහ ප්‍රජා කේන්ද්‍රීය ක්‍රියාකාරකම් පිළිබඳ ගතික ක්‍රියාකාරී සැලැස්මක්
- ★ පාසල් පුස්තකාල කාර්යමණ්ඩලවල වෘත්තීය කුසලතා සංවර්ධනයට සැලැස්මක්
- ★ සිසු සාර්ථකත්වය වෙත පුස්තකාල සේවාවන්ගේ බලපෑම විදහා දක්වන සාක්ෂි පාදක පර්යේෂණ හරහා අඛණ්ඩ වර්ධනය වෙනුවෙන් සපයන ඇගැයීම් සැලැස්මක්.

### නිදසුන

ඉන්දුනීසියාවේ ග්‍රාමීය කලාපයක දී පුස්තකාල කාර්යමණ්ඩලය ආදර්ශ පාසල් පුස්තකාලයක් සංවර්ධනය කිරීමට පුස්තකාල පාසල් ගුරු මණ්ඩලයක්, රජයේ අමාත්‍යාංශයක් සහ අන්තර්ජාතික සංවර්ධන නියෝජිතායතනයක් සමඟ කටයුතු කරයි.

## 2.7 අරමුදල් සම්පාදනය

පාසල් පුස්තකාලයේ උපදේශනාත්මක සහ තොරතුරුමය පදනමක කාලීනත්වය සහ වැදගත්කම සහතික කිරීමට, ප්‍රාදේශීය යථාර්ථය සැලකිල්ලට ගනිමින් යෝග්‍ය අයවැය ප්‍රතිපාදනයක් පුස්තකාලයට අවශ්‍යය. අයවැය වියදම් පාසල් පුස්තකාලය වෙනුවෙන් පාසලේ ප්‍රතිපත්ති රාමුවට

සම්බන්ධව විය යුතු අතර සිසුවා ගුරුවරයා සහ කාර්යමණ්ඩලය තුළ ආයෝජනයක් පිළිබිඹු විය යුතුය.

පාසල් පුස්තකාලයාධිපතිවරයෙක් අයවැය සංවර්ධනයට ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සමඟ කටයුතු කරන අතර සමස්ත පාසල් ප්‍රජාවට ගුණාත්මක සම්පත් හා සේවා බෙදාහැරීම සඳහා වගකිව යුතු විකල්ප ගවේෂණය කරයි. පාසල් පුස්තකාලයක් සඳහා වන මූල්‍යමය පර්යේෂණවලින් මෙසේ පිළිබිඹු වේ.

★ පාසල් පුස්තකාලයේ ඉගැන්වීම්/ සහාය කාර්යමණ්ඩලයේ සහ එහි එකතුවේ ප්‍රමාණය සහ ගුණාත්මක බව අධ්‍යයන ජයග්‍රහණයේ හොඳම පාසල් පුරෝකථනයන් වේ.
★ ප්‍රාථමික පරීක්ෂණවල දී ඉහළ ලකුණු ලබා ගන්නා සිසුන් වැඩි වැඩියෙන් පාසල් පුස්තකාල කාර්යමණ්ඩලය සමඟ පාසල්වල සිට පැමිණීමටත්, ආර්ථික වැනි වෙනත් සාධක පිළිබඳ තැකීමකින් තොරව පොත්, සඟරා සහ  මාර්ගගත ද්‍රව්‍ය වැනි සේවා සහ සම්පත් වෙත වැඩි ප්‍රවේශයක් ගැනීමටත් නැඹුරු වේ.

සමස්ත වර්ෂය සඳහා අයවැය වියදම් ප්‍රවේශමෙන් සැලසුම් කරන අතර එය ප්‍රතිපත්ති රාමුවට සම්බන්ධ වේ. අයවැය සැලැස්මක සංරචක B ඇමුණුමෙන් ඉදිරිපත් කෙරේ. පුස්තකාලය අයවැය භාවිත කරන ලද ආකාරය මෙන්ම  එහි කාර්යයන් ආවරණය කිරීමටත් ප්‍රතිපත්ති ඉලක්ක සපුරා ගැනීමටත් පුස්තකාල වැඩසටහන සහ එහි සම්පත් වෙත වැය කළ මුදල ප්‍රමාණවත් ද යන්න වාර්ෂික වාර්තාවලින් පැහැදිලි කරයි. පාසල් පුස්තකාල සේවාවන්ගේ සහ වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ පාසලේ ඉගැන්වීම සහ ඉගෙනුම වෙත එහි බලපෑම පිළිබඳ සාධක වාර්ෂික වාර්තාවල ඇතුළත් විය යුතුය. ඇගැයීම සඳහා ඇති අවශ්‍යතාව සහ පාසල් පුස්තකාල කළමනාකරණයේ දී එහි ප්‍රයෝජනවත් බව මෙම ලේඛනයේ 6 පරිච්ඡේදයේ දී වඩාත් ගැඹුරින් ගවේෂණය කෙරේ.

## ප්‍රයෝජනවත් මූලාශ්‍ර


American Association of School Librarians. (2011). *Standards for the 21st century learner*. Retrieved from www.ala.org/aasl/standards-guidelines/learning-standards

American Library Association. (2010). *Intellectual Freedom Manual* (8th ed.). Retrieved from www.ala.org/advocacy/intfreedom/iftoolkits/ifmanual/intellectual

American Library Association. (1996). *Library Bill of Rights*. Retrieved from www.ala.org/advocacy/intfreedom/librarybill

Australian School Library Association. (2000). *School Library Bill of Rights*. Retrieved from www.asla.org.au/policy/bill-of-rights.aspx

Hay, L. & Todd, R. J. (2010). *School libraries 21C.* NSW Department of Education and Training. Retrieved from www.curriculumsupport.education.nsw.gov.au/schoollibraries/assets/pdf/21c_report.pdf

International Federation of Library Associations. (2015). *Indigenous Matters Special Interest Group*. Retrieved from www.ifla.org/indigenous-matters

International Federation of Library Associations. (2015). *Lesbian, Gay, Bisexual, Transgender and Queer/Questioning Users Special Interest Group*. Retrieved from www.ifla.org/lgbtq

International Federation of Library Associations. (2015). *IFLA/UNESCO Multicultural Library Manifesto*. Retrieved from www.ifla.org/node/8976 25

Kachel, D. E., & Lance, K. C. (2013). Latest study: A full-time school librarian makes a critical difference in boosting student achievement. *School Library Journal, 59*(3), 28.

# 03 පරිච්ඡේදය

## පාසල් පුස්තකාලයක මානව සම්පත්

*"පාසල් පුස්තකාලයාධිපති යනු පාසල් ප්‍රජාවේ සියලු සාමාජිකයන් සමග එක්ව කටයුතු කරමින් මහජන පුස්තකාල සහ අන්‍යයන් සමග සම්බන්ධීකරණයේ යෙදෙමින් ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක සහාය ලද, පාසල් පුස්තකාලයේ සැලසුම්කරණය සහ කළමනාකරණය සඳහා වගකියන වෘත්තීමය වශයෙන් සුදුසුකම්ලත් කාර්යමණ්ඩල සාමාජිකයෙකි."* පාසල් පුස්තකාල ප්‍රඥප්තිය

### 3.1 හැඳින්වීම

පාසල් පුස්තකාලයක ප්‍රධාන කාර්ය වන්නේ තොරතුරු සහ අදහස් වෙත භෞතික හා බුද්ධිමය ප්‍රවේශය සැපයීමය. පාසල් පුස්තකාලයක් තුළ සහ ඉන් ඔබ්බෙහි පවත්නා මානව සම්පත් මත පාසල් පුස්තකාල වැඩසටහනක පොහොසත් බව හා ගුණාත්මක බව රඳා පවතී. පාසල් ප්‍රජාවකගේ ඉගැන්වීම් සහ ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීමට පාසල් පුස්තකාලයේ ප්‍රමාණයට සහ එහි සුවිශේෂ අවශ්‍යතාවලට අනුව ප්‍රමාණවත්, හොඳින් පුහුණුවලත් සහ අභිප්‍රේරණය සහිත කාර්යමණ්ඩලයක් සිටීම අත්‍යවශ්‍ය වේ. පාසල් පුස්තකාලයක සේවය කරන සියල්ලන්ට පුස්තකාල සේවා සහ ප්‍රතිපත්ති පිළිබඳවත්, මනාව නිර්වචනය කරන ලද රාජකාරී සහ වගකීම් පිළිබඳවත් ස්වකීය තනතුරුවල භූමිකා අපේක්ෂාවන් පිළිබිඹු වන රැකියා සහ හානිපූරණයේ හොඳින් නියාමනය කරන ලද තත්ත්වයන් පිළිබඳවත් පැහැදිලි අවබෝධයක් පැවතිය යුතුය.

### 3.2 කාර්යමණ්ඩල භූමිකා සහ තර්කයන්

පාසල් පුස්තකාලයක් ඉගැන්වීමට සහ ඉගෙනුමට පහසුකම් සලසන හෙයින් එහි වැඩසටහන සමාන අධ්‍යාපන මට්ටමක සහ පන්තිකාමර ගුරුවරුන් ලෙස සුදානම් වීමේ මට්ටමක සිටින වෘත්තිමය කාර්ය මණ්ඩලයක මෙහෙයවීම යටතේ පැවැතීම අවශ්‍ය වේ. පාසල් පුස්තකාලයාධිපතිවරයා පාසලේ නායකත්ව භූමිකාවක් ගැනීමට අපේක්ෂා කරන ස්ථානයක දී පාසල් පරිපාලකයන් සහ ඉගෙනුම් විශේෂඥයන් වැනි පාසලේ අනෙකුත් නායකයන් ලෙස සමාන අධ්‍යාපන සහ සුදානම් වීමේ මට්ටමක් පාසල් පුස්තකාලයාධිපතිට තිබිය යුතුය. පාසල් පුස්තකාලයක මෙහෙයුම් අංශ පුහුණුවලත් ලිපිකාර සහ තාක්ෂණික සහාය කාර්යමණ්ඩලයක් විසින් හැසිරවීම වඩාත් සුදුසු වේ. එමඟින් උපදේශය, කළමනාකරණය, සහයෝගිතාව සහ නායකත්වය පිළිබඳ වෘත්තීමය භූමිකා සඳහා අවශ්‍ය කාලය පාසල් පුස්තකාලයාධිපතිට පැවතීම සහතික කෙරේ.

## 3.3 පාසල් පුස්තකාලයාධිපතිවරයකු පිළිබඳ නිර්වචනය

පාසල් පුස්තකාලයාධිපතිවරයකු ඉගැන්වීම සහ ඉගෙනුමට කේන්ද්‍රීය වන කියවීම, විමසුම, පර්යේෂණ, සිතීම, පරිකල්පනය සහ නිර්මාණශීලීත්වය සහිත පාසලේ භෞතික සහ ඩිජිටල් අවකාශය සඳහා වගකීම දරයි. මෙම භූමිකාව විවිධ යෙදුම්වලින් දන සිටිය ද (උදා - පාසල් පුස්තකාලයාධිපති, පාසල් පුස්තකාල මාධ්‍ය විශේෂඥ, ගුරු පුස්තකාලයාධිපති, වෘත්තීය ප්‍රලේඛන නිලධාරී) වඩාත් පොදුවේ භාවිත කරන යෙදුම වන්නේ පාසල් පුස්තකාලයාධිපතිය. පාසල් පුස්තකාලයාධිපතීන්ගේ සුදුසුකම් ලොව පුරා විවිධ වුව ද ඊට ඉගැන්වීමේ පුහුණුව සහිත හෝ නොමැති පුස්තකාලයාධිපතීන් ද වෙනත් පුස්තකාල විශේෂඥතාවල පුහුණුව සහිත පුස්තකාලයාධිපතීන් ද ඇතුළත් විය හැකිය.

ලොව පුරා පාසල් පුස්තකාල නිර්වචනය කරන ලද ආකාරය බොහෝදුරට විවිධත්වයෙන් යුක්ත වන  අතර මහජන පුස්තකාල හරහා සේවය ලබා දීම ද එයට ඇතුළත් විය හැකිය. පාසල් පුස්තකාල සඳහා වන කාර්යමණ්ඩල රටාවන් ප්‍රාදේශීය සන්දර්භයන් මත ද වෙනස් වේ. ව්‍යවස්ථා, ආර්ථික සංවර්ධනය සහ අධ්‍යාපනික යටිතල ව්‍යුහය මඟින් එයට බලපෑම් එල්ල කෙරේ. කෙසේ වෙතත්, වසර 50කට අධික කාලයක් තුළ සිදු වූ ජාත්‍යන්තර පර්යේෂණ මඟින් පොදුවේ පෙන්වා දෙන්නේ පාසල් පුස්තකාලයාධිපතීන්ට පාසල් පුස්තකාලයාධිපතිත්වය සහ පන්තිකාමර ඉගැන්වීම පිළිබඳ විධිමත් අධ්‍යාපනයක් අවශ්‍ය බවයි. එය උපදේශය, කියවීම සහ සාක්ෂරතා සංවර්ධනය, පාසල් පුස්තකාල කළමනාකරණය, ඉගැන්වීම් කාර්යමණ්ඩලය සමඟ සහයෝගිතාව සහ අධ්‍යාපනික ප්‍රජාව සමඟ සබඳතාව පිළිබඳ සංකීර්ණ භූමිකා සඳහා අවශ්‍ය වෘත්තීමය විශේෂඥතාව ලබා දෙයි.

**නිදසුන්**

ප්‍රංශයේ කණිෂ්ඨ උසස් පාසල්වල සහ උසස් පාසල්වල පාසල් පුස්තකාලයාධිපතීන් බඳවා ගැනීම සහ පුහුණු කිරීම සිදු කරනුයේ අනෙක් ගුරුවරුන්ට සමාන මට්ටමක වන අතර ඔවුනට අනෙක් ගුරුවරුන් හා සමාන තත්ත්වයක් පවතී.

**නිදසුන**

ඉතාලියේ දකුණු ටිරොල්හි බොසෙන් පළාත විසින් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ස්වකීය සුදුසුකම් සහ පුහුණුවට අනුව 1 - 13 මට්ටමේ පාසල්වල සේවය කිරීමට පාසල් පුස්තකාලයාධිපතින් බඳවා ගනු ලැබේ. පාසල් පුස්තකාල සහායකයකු ද්විතීක අධ්‍යාපනය සහ පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ පාඨමාලාවක් (අවම වශයෙන් න්‍යාය හා ප්‍රායෝගික එක් අවුරුදු පාඨමාලාවක්) සම්පූර්ණ කළ යුතුව ඇත. සුදුසුකම්ලත් පාසල් පුස්තකාලයාධිපතිවරයෙකු උසස් අධ්‍යාපනය (අවම වශයෙන් තෙවසරක උපාධියක්) සම්පූර්ණ කර තිබිය යුතුය.

**නිදසුන**

2009 සිට පෘතුගාලයේ පාසල් පුස්තකාලයාධිපති, පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ විශේෂඥතාව සහිත පාසල් ගුරුවරයෙකි.

## 3.4 පාසල් පුස්තකාල වැඩසටහනක් සැපයීමට අවශ්‍ය නිපුණතා

වෘත්තීය පාසල් පුස්තකාලයාධිපතිවරයෙකුගේ සුදුසුකම් මෙසේය.

- ⋆ ඉගැන්වීම සහ ඉගෙනීම, විෂයමාලාව උපදේශාත්මක සැලසුම් සහ බෙදාහැරීම
- ⋆ වැඩසටහන් කළමනාකරණය - සැලසුම්කරණය, සංවර්ධනය/ නිර්මාණය, ක්‍රියාත්මක කිරීම, ඇගැයීම/වර්ධනය
- ⋆ එකතු සංවර්ධනය, ගබඩා කිරීම, සංවිධානය, සමුද්ධරණය
- ⋆ තොරතුරු ක්‍රියාවලි සහ චර්යාවන් - සාක්ෂරතාව, තොරතුරු සාක්ෂරතාව, ඩිජිටල් සාක්ෂරතාව
- ⋆ කියවීමේ නිරත වීම
- ⋆ ළමා හා යොවුන් සාහිත්‍ය පිළිබඳ දැනුම
- ⋆ කියවීමට බලපාන දුබලතා පිළිබඳ දැනුම
- ⋆ සන්නිවේදන සහ සහයෝගීත්ව කුසලතා
- ⋆ ඩිජිටල් සහ මාධ්‍ය කුසලතා
- ⋆ ආචාරධර්ම සහ සමාජීය වගකීම්
- ⋆ පොදු යහපත සඳහා සේවා - මහජනයාට/ සමාජයට වගවීම
- ⋆ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය හරහා යාවජීව ඉගෙනුමට කැපවීම
- ⋆ පාසල් පුස්තකාලයාධිපතිත්වයේ ක්ෂේත්‍රයට සහ එහි ඉතිහාසය සහ වටිනාකම් වෙත සමාජානුයෝජනය

පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ වෘත්තීය නිපුණතා සහ නැඹුරුතාවන්හි සංවර්ධනය විවිධ ආකාරවලින් සපුරා ගත හැකිය. සාමාන්‍යයෙන් ඉගැන්වීම හෝ පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ මූලික සහතිකය ලැබීමෙන් පසු ඩිප්ලෝමාවක් හෝ උපාධියක් හෝ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සම්පූර්ණ කිරීම හරහා මෙකී නිපුණතා සම්පූර්ණ කර ගත හැකිය.

පාසල් පුස්තකාලයාධිපතීන් සඳහා නියත අධ්‍යාපනික වැඩසටහන් පවත්නා රටවල විෂයමාලාවට පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ හර නිපුණතාවලට අමතරව අධ්‍යාපනය (ඉගෙනුම, විෂයමාලාව, ඉගැන්වීම) ඩිජිටල් තාක්ෂණය සහ සමාජ මාධ්‍ය මෙන්ම යෞවනය, සංස්කෘතිය සහ සාක්ෂරතා පිළිබඳ අවබෝධයක් ඇතුළත් කළ යුතුය.

ඒ සමගම, මෙම අධ්‍යයන ක්ෂේත්‍ර විචාරාත්මක චින්තනය සහ ගැටලු විසඳීමේ දක්මක සිට තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ගැඹුරු සහ සවිස්තරාත්මක අවබෝධයක් තුළ ප්‍රතිඵල අත්කර ගත යුතුය. පාසල් පුස්තකාල අධ්‍යාපනය එම පාර්ශ්වයෙහි නායකයකු ලෙසත්, වෙනස්වීම් කාරකයෙකු හෙවත් උත්ප්‍රේරකයකු ලෙසත් පාසල් පුස්තකාල ප්‍රජාවේ සාමාජිකයකු ලෙසත් වෘත්තීය පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ භූමිකාව ආමන්ත්‍රණය කළ යුතු වේ.

**නිදසුන**

ප්‍රංශයේ ගුරුවරුන් සඳහා වන නිපුණතා රාමුව, පාසල් පුස්තකාලයාධිපතීන් ද ඇතුළු ඕනෑම ගුරුවරයෙකු විසින් සපුරා ගත යුතු ප්‍රවීණතා සහිත අධ්‍යාපනික කුසලතා ලැයිස්තුවක් ඉදිරිපත් කරයි. පාසල් පුස්තකාලයාධිපතීන් සඳහා වන සුවිශේෂී පුස්තකාල හා තොරතුරු විද්‍යා කුසලතා මෙම ලැයිස්තුවට ඇතුළත් වේ. පාසල් ප්‍රජාවගේ සෑම සාමාජිකයෙකු සඳහා ම අත්‍යවශ්‍ය කුසලතාවක් ලෙස තොරතුරු සාක්ෂර කුසලතා හඳුනා ගත යුතුය. මෙම සාමාන්‍ය දැනුම ඕනෑම කාර්යක්ෂම ඉගැන්වීම් ක්‍රමවිද්‍යාත්මක සහයෝගිතාවක් සඳහා පූර්ව කොන්දේසියක් වේ.

## 3.5 වෘත්තීය පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ භූමිකා

වෘත්තීය පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ ප්‍රධාන භූමිකා වන්නේ උපදේශය, කළමනාකරණය, නායකත්වය හා සහයෝගිතාව සහ ප්‍රජා සබඳතා වේ. මෙම සෑම භූමිකාවක්ම පහතින් සවිස්තරාත්මක සාකච්ඡා කෙරේ.

### 3.5.1 උපදේශකත්වය

වෘත්තීය පාසල් පුස්තකාලයාධිපතිවරයකුට උපදේශකත්ව භූමිකාව කේවල සිසුන්, කුඩා සිසු කණ්ඩායම්වල සිට සිසුන්ගේ පන්ති සමඟ කරනු ලබන ඉගැන්වීම් තත්ත්වයන් දක්වා පුළුල් විවිධත්වයකින් යුක්ත වේ. එමෙන්ම ඉගැන්වීම් සමපදස්ථයන්ගේ අවිධිමත් සහ විධිමත් වෘත්තීය සංවර්ධනය ද ඊට ඇතුළත් වේ. පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ උපදේශාත්මක කාර්යයෙහි හර ක්‍රියාකාරකම් 5 පරිච්ඡේදයේ විස්තර කර ඇත. එයට පහත සඳහන් කරුණු ඇතුළත් වේ.

- ★ සාක්ෂරතාව සහ කියවීම් ප්‍රවර්ධනය
- ★ තොරතරු නිපුණතා, තොරතුරු ප්‍රවීණතා, මාධ්‍ය සාක්ෂරතාව, බහුවිධ මාධ්‍ය හා සන්දර්භ භාවිත කිරීමේ සාක්ෂරතාව)
- ★ විමසුම් පාදක ඉගෙනුම (ගැටලු පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය)
- ★ තාක්ෂණ සමෝධානය
- ★ ගුරුවරුන් සඳහා වෘත්තීය සංවර්ධනය

**නිදසුන්**

ගුරුවරුන් සඳහා මාර්ගදර්ශක ලෙස නිෂ්පාදිත සහ භාවිත කරන ලද විවිධ ඉගැන්වීම් ක්‍රම විද්‍යාත්මක රාමු තිබේ, ප්‍රංශය - තොරතුරු සංස්කෘතියක් වෙතට ඉගෙනුම් මාවත ක්‍රියාත්මක කිරීම සඳහා කුසලතා ඃ ප්‍රධාන අධ්‍යාපනික අභියෝගයක්, යුනෙස්කෝව - මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව ඃ ගුරුවරුන් සඳහා පුහුණු වැඩටසහනක්.

### 3.5.2 කළමනාකරණය

වෘත්තීය පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ කළමනාකරණ භූමිකාවට ප්‍රලේඛන ක්‍රම සංවිධානය කිරීම සහ උපරිම භාවිතය සඳහා පාසල් පුස්තකාලයක් පිරිසැකසීම අයත් වේ. මෙයට පුස්තකාල පහසුකම් (භෞතික සහ ඩිජිටල් පරිසරයන්) ද්‍රව්‍යමය සම්පත් (භෞතික සහ ඩිජිටල්) සහ ඉගැන්වීම් ක්‍රමවිද්‍යාත්මක වැඩටසහන් හා සේවා (භෞතික සහ ඩිජිටල්) ඇතුළත් වේ. මානව සම්පත්

කළමනාකරණය ද එම භූමිකාවේ කොටසක් විය හැකිය. එනම්, පුස්තකාල කාර්යමණ්ඩලය බඳවා ගැනීම, තෝරා ගැනීම, පුහුණු කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගැයීම වේ.

### 3.5.3 නායකත්වය සහ සහයෝගීතාව

පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ ප්‍රධාන භූමිකාව වන්නේ පාසලේ මෙහෙවර සහ අභිමතාර්ථවලට දායක වීමය. පාසලේ පරිපාලකයන් සහ ගුරුවරුන් සමඟ සහයෝගයෙන් පාසල් පුස්තකාලයාධිපති, ඉගැන්වීමට සහ ඉගෙනුමට සහාය වන විෂයමාලා පාදක පුස්තකාල සේවා සහ වැඩසටහන් සංවර්ධනය කරන අතර ක්‍රියාත්මක කරනු ලබයි. පාසල් පුස්තකාලයාධිපති තොරතුරුවලට සම්බන්ධ දැනුම සහ කුසලතා වෙතටත් විමසුම් හා ව්‍යාපෘති වැඩ, ගැටලු විසඳීමේ ක්‍රියාකාරකම්, සාක්ෂරතා ක්‍රියාකාරකම්, කියවීමේ නිතර වීම සහ සංස්කෘතික ක්‍රියාකාරකම් ලෙස ඉගැන්වීම සහ ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සම්පත් භාවිත කිරීම වෙතටත් දායක වේ. තාක්ෂණය සමෝධානය කිරීමේ දී සහ ගුරුවරුන් හා පරිපාලකයන් සඳහා වෘත්තීය සංවර්ධනය සැපයීමේ දී පාසල් පුස්තකාලයාධිපතිට තනිව හෝ පාසලේ අනෙකුත් විශේෂඥයන් සමඟ සහයෝගීත්ව භූමිකාවක යෙදිය හැකිය.

සහයෝගීතාව, පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ අත්‍යවශ්‍ය කොටසක් වේ. පාසල් පුස්තකාලයාධිපතිවරයෙක් පාසලේ මෙහෙවර සහ අභිමතාර්ථ වෙතට පාසල් පුස්තකාලයේ දායකත්වය පිළිබඳ අවබෝධය හා සහාය සංවර්ධනය කිරීමට පාසලේ පරිපාලකයන් සමඟ කටයුතු කරයි. පාසල් පුස්තකාලයාධිපති ඍජුව ම විදුහල්පතිට, ප්‍රධාන ගුරුභවතාට හෝ පාසලේ නියෝජ්‍ය ප්‍රධානියාට වාර්තා කළ යුතු අතර පාසලේ සමස්ත සැලසුම්කරණය සහ වෙනත් නායකත්ව කණ්ඩායම් ක්‍රියාකාරිත්වයන් තුළ සහභාගීවීම අපේක්ෂා කළ යුතුය. පාසල් ප්‍රජාව තුළ පාසල් පුස්තකාලයාධිපතිවරයෙක් තිරස් විෂයමාලා විමසුම් ව්‍යාපෘති, සහ අන්තර්ශික්ෂණමය ඉගෙනුම් ඒකක වැනි ක්‍රියාකාරකම් හරහා සමස්ත පාසලේ අඛණ්ඩත්වය සහ ඒකාබද්ධතාව වෙතට පහසුකම් සැලසීමට කටයුතු කළ යුතුය. පාසල් පුස්තකාලයාධිපතිවරයෙක් අනෙක් පාසල් පුස්තකාලයාධිපතීන්ගේ වෘත්තීය සංවර්ධනය සහ ඉගෙනුම ව්‍යාප්ත කිරීමටත් අඛණ්ඩව පවත්වා ගෙන යාමටත් ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය.

#### නිදසුන

ඇමෙරිකා එක්සත් ජනපදයේ උතුරු ටෙක්සාස්හි බොහෝ පාසල් පුස්තකාල සඳහා පත් කර ඇති පාසල් පුස්තකාල අධ්‍යක්ෂවරු අදහස් හුවමාරු කර ගැනීමට සහ වැඩටසහන් සහ සේවා වෙත නව එළඹුම් ඉදිරිපත් කිරීමට මාසිකව රැස් වෙති.

#### නිදසුන

පුහුණුව සහ ජාලගත වීමේ අවස්ථා සඳහා සෑම පාසල් වාරයකම හමු වන හොඳින් ස්ථාපිත පාසල් පුස්තකාලයාධිපතීන්ගේ කලාපීය කණ්ඩායම් එක්සත් රාජධානියේ සිටී.

### 3.5.4 ප්‍රජා සබඳතා

වැඩසටහන් සම්පාදනය, එකතු සංවර්ධනය සහ පුස්තකාලයෙන් පිටත සිදු කරනු ලබන ප්‍රයත්න ප්‍රජා සබඳතාවන්ට අයත් වේ. එය අපගේ පුස්තකාල වෙතට විවිධත්වයෙන් යුත් සංස්කෘතික, භාෂාමය, ස්වදේශික සහ වෙනත් සුවිශේෂ ජනගහනයන් සාදරයෙන් පිළිගනු ලබයි. පාසල් පුස්තකාල ළමයින්ගේ අධ්‍යාපනය තුළ පවුල්වල වැදගත්කමත් පරම්පරා අතර දැනුම හුවමාරුවේ වටිනාකමත් හඳුනා ගත යුතුය.

ළමයින්ට පවුල්වල සහ ප්‍රජාවේ සහාය ලැබේ. පාසල් මට්ටම්වලට සහභාගී වීමට සහ දායක වීමටත් ඔවුන්ගේ සමාජීය, අධ්‍යාපනික, සංස්කෘතික, ප්‍රජාතන්ත්‍රීය සහ ආර්ථික යහපැවැත්ම සඳහා තොරතුරු, අදහස් සහ පරිකල්පන කාර්යයන් වෙත සමාන ප්‍රවේශයට සහාය වීමටත් විවිධ පසුබිම්වලින් පැමිණෙන්නන්ට හැකියාව ලබා දෙන සාකල්‍යවාදී එළඹුමක් අවශ්‍යය.

පරම්පරා අතර ධනය සහ දැනුම හුවමාරුවීම බොහෝ ප්‍රජාවන් සතු හර වටිනාකමක් වේ. මෙම ප්‍රජාවන් වෙතින් ළමයින්ට ඵලදායීව හා අර්ථවත්ව දැනුම හුවමාරු වන ආකාරය, පාසල් පුස්තකාලය ක්‍රියාත්මක වන අධිපති සංස්කෘතිය වෙතින් කැපී පෙනන ලෙස වෙනස් විය හැකිය. 'අනන්‍යතාව' සහ 'හිමිකම්' සියලුම දරුවන් සඳහා සාක්ෂරතාව සහ ඉගෙනුම් ජයග්‍රහණවලට අත්‍යවශ්‍ය සංරචක වේ.

පාසල් පුස්තකාලයාධිපතිවරයකු හැකි නම්, මහජන පුස්තකාල සහ පුස්තකාල සංගම් ඇතුළු පුළුල් ප්‍රජාව තුළ අනෙක් පුස්තකාල කණ්ඩායම් සමග සම්බන්ධීකරණය සිදු කළ යුතුය.

කිසියම් ප්‍රජාවක ළමයින් සහ යෞවනයන් සඳහා පුස්තකාල සේවා වර්ධනය කිරීමට පාසල් පුස්තකාල සහ මහජන පුස්තකාල සාමූහිකව ප්‍රයත්න දැරිය යුතුය. ලිඛිත සාමූහික ගිවිසුමක පහත කරුණු ඇතුළත් විය යුතුය. එනම්, සාමූහිකත්වය සඳහා ඇති පොදු ක්‍රියාමාර්ග, සහයෝගීතා ක්ෂේත්‍ර පිළිබඳ පිරිවිතර සහ නිර්වචන, ආර්ථික අනුමැතීන් පිළිබඳ පැහැදිලි කිරීම් සහ පිරිවැය බෙදහදා ගන්නා  ආකාරය යනාදියයි. සාමූහික කාර්යමණ්ඩල පුහුණුව, සාමූහික එකතු සංවර්ධනය සහ වැඩසටහන්කරණය, ඉලෙක්ට්‍රොනික සේවා සහ ජාල සම්බන්ධීකරණය, පන්ති වශයෙන් මහජන පුස්තකාල නැරඹීම, ඒකාබද්ධ කියවීම් සහ සාක්ෂරතා ප්‍රවර්ධනය, ළමයින් සහ යෞවනයන් සඳහා පුස්තකාල සේවාවන්ගේ ඒකාබද්ධ අලෙවිකරණය සාමූහික ක්ෂේත්‍ර පිළිබඳ උදාහරණයන්ට ඇතුළත් වේ.

#### නිදසුන

නෝර්වේහි ඔස්ලෝ නගරයේ පාසල් පරිපාලනය සහ මහජන පුස්තකාල සාමූහික ගිවිසුමකට එළඹ ඇති අතර නගරයේ පාසල් පුස්තකාල 120ට අදාළ මාතෘකා පිළිබඳ සාකච්ඡා කිරීමට ඔවුන් වරින් වර රැස් වේ. මහජන පුස්තකාලයේ පාසල් සේවාව පාසල් සඳහා අතිරේක ද්‍රව්‍ය පිරුළට දීමටත් උපදෙස් දීමටත් කාර්යමණ්ඩලය යොදවා ඇත. ඔවුහු කියවීම සහ සාක්ෂරතාව, එකතු සංවර්ධනය, සහ පාසල් පුස්තකාල අවකාශය සංවිධානය කිරීම වැනි ක්ෂේත්‍රවල දී උපදෙස් ලබා දෙති. සියලු පාසල් පුස්තකාලයාධිපතීන්ට සහ පාසල් ගුරුවරුන්ට විද්‍යුත් තැපැල හෝ දුරකථනය හරහා මෙම පාසල් සේවාවේ සහාය ඉල්ලා සිටිය හැකිය. පාසලට මිල දී ගැනීමට හැකියාවක් නොමැති හෝ ඔවුන් නිතර භාවිත නොකරන ද්‍රව්‍ය පාසල් පුස්තකාලයට හෝ සෘජුව පන්ති කාමරයට යැවිය හැකිය.

### 3.5.5 පුස්තකාල වැඩසටහන් සහ සේවා ප්‍රවර්ධනය

පුස්තකාලය සපයන දේ පිළිබඳවත් පාඨකයන්ගේ අවශ්‍යතා සහ මනාපයට මෙම වැඩටසහන් හා සේවාවන්ගේ ගැලපීම පිළිබඳවත් පාඨකයන් වෙත සන්නිවේදනය කිරීම පුස්තකාල වැඩටසහන් සේවා ප්‍රවර්ධනය කිරීමට ඇතුළත් වේ. ඉගෙනුමෙහි හවුල්කරුවකු ලෙසත් වැඩසටහන් සේවා සහ සම්පත් සපයන්නෙකු ලෙසත් පුස්තකාලයේ භූමිකාව පිළිබඳ ඉලක්ක කණ්ඩායම් දැනුවත් වන හෙයින් පාසල් පුස්තකාලය මඟින් සපයන ලද වැඩසටහන් සේවා සහ පහසුකම් සක්‍රීයව ප්‍රවර්ධනය කළ යුතුය.

පුස්තකාල සේවා ප්‍රවර්ධනය සඳහා වන ඉලක්ක කණ්ඩායම් වන්නේ විදුහල්පති සහ පාසල් පරිපාලනයේ අනෙකුත් සාමාජිකයන්, අංශ ප්‍රධානීන්, ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන්ය. පාසලේ ස්වභාවයට සහ වෙනත් ඉලක්ක කණ්ඩායම්වලට අනුව සන්නිවේදනය ගැලපීම වැදගත් වේ.

පාසල් පරිපාලනය සහ ගුරුමණ්ඩලය සමඟ සාමූහිකව ක්‍රියාවට නංවන ලිඛිත ප්‍රවර්ධන සැලැස්මක් පාසල් පුස්තකාලයට තිබිය යුතුය. මෙම සැලැස්මෙහි පහත අංග ඇතුළත් විය යුතුය. එනම්, අරමුණු, අරමුණු සපුරා ගන්නා ආකාරය දැක්වෙන ක්‍රියාකාරී සැලැස්මක්, ක්‍රියාකාරී සැලැස්මේ සාර්ථකත්වය තක්සේරු කරන ඇගැයීම් ක්‍රමවේදය යනාදිය වේ.

## 3.6 පාසල් පුස්තකාල අර්ධ වෘත්තීය කාර්යමණ්ඩලයේ භූමිකාව සහ නිපුණතා

අර්ධ වෘත්තීය පාසල් පුස්තකාල කාර්යමණ්ඩලය (උදා - පුස්තකාල සහකාරවරුන්, පුස්තකාල තාක්ෂණික ශිල්පීන්) පුස්තකාලයාධිපතින්ට වාර්තා කරන අතර ස්වකීය ලිපිකාර සහ තාක්ෂණික කාර්යයන් හරහා පුස්තකාලයාධිපතිගේ කාර්යයට සහාය වේ. රාක්කගත කිරීම්, බැහැරදීම්, ආපසු භාරගැනීම් සහ පුස්තකාල ද්‍රව්‍ය පිරිසැකසීම් සහ ඩිජිටල් සම්පත්වලට ද ප්‍රවේශය සපයන මාර්ගගත සංසරණ හා සූචිකරණ සේවා කළමනාකරණයට සම්බන්ධ තාක්ෂණික සේවා සැපයීම වැනි පාසල් පුස්තකාලයේ දෛනික මෙහෙයුම් සඳහා අවශ්‍ය පුහුණුව සහ සංවර්ධනය අර්ධ වෘත්තීය පාසල් පුස්තකාල කාර්යමණ්ඩලයට පැවතිය යුතු වේ.

## 3.7 පාසල් පුස්තකාල ස්වේච්ඡා සේවකයකුගේ භූමිකාව සහ නිපුණතා

ස්වේච්ඡා සේවකයන් වැටුප් ගෙවන පුස්තකාල කාර්යමණ්ඩලයට ආදේශකයන් ලෙස කටයුතු නොකරන මුත් පාසල් පුස්තකාලයාධිපති විසින් අධීක්ෂණය කිරීම ඇතුළු පාසල් පුස්තකාලයේ ක්‍රියාකාරකම්වල ඔවුන්ගේ මැදිහත් වීම සඳහා විධිමත් රාමුවක් සපයන එකඟතාවන් මත පදනම් වූ සහාය භූමිකාවන් තුළ ඔවුනට වැඩෙහි යෙදිය හැකිය. හොඳින් නිර්වචනය කරන ලද භූමිකාවන් තුළ සහ අධීක්ෂණයට යටත්ව පාසල් පුස්තකාල ස්වේච්ඡා සේවකයන් ලෙස සිසුන්ට කටයුතු කළ හැකිය. ශිෂ්‍ය ස්වේච්ඡා සේවකයන් ජ්‍යෙෂ්ඨ සිසුන් විය යුතු අතර විධිමත් අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලියක් හරහා තෝරා ගත යුතුය. එමෙන්ම ප්‍රදර්ශන නිර්මාණය, පුස්තකාල ද්‍රව්‍ය යළි රාක්කගත කිරීම, වයසින් අඩු සිසුන් සමඟ කියවීම සහ අනෙක් සිසුන්ට පොත් නිර්දේශ කිරීම යනාදියට සහාය වීම වැනි කාර්යයන් පවත්වා ගෙන යාමට ඔවුන්ට පුහුණුව ලබා දිය යුතුය.

**නිදසුන**

ඇමෙරිකා එක්සත් ජනපදයේ මිචිගන්හි ප්‍රාථමික පාසලේ පුස්තකාල බලකාය පුස්තකාලය මැනවින් පවත්වා ගෙන යන තිරයෙන් පිටුපස කාර්යයන්ට දායක වේ. මෙම සිසුන් සතියකට වරක් ද්‍රව්‍ය රාක්කගත කිරීම, ප්‍රාථමික පන්තිවලින් පොත් එකතු කිරීම සහ ඇතැම් විට නව ද්‍රව්‍යවල ලේබල් ඇලවීම සහ බාකෝඩ් යෙදීම යනාදියට සහාය වේ.

**නිදසුන**

ඉතාලියේ රෝමයෙහි උසස් පාසල් සිසුන් පුස්තකාලය මනාව පවත්වා ගෙන යාමට සහාය වන විශේෂ අවශ්‍යතා වැඩසටහනක් තුළට ඇතුළත් කර ඇත. එය පුස්තකාල කළමනාකරණයට හා සිසුන්ගේ පුද්ගල සංවර්ධනයට දායක වේ. එමෙන්ම සිසුන් පුස්තකාලයේ ප්‍රතිසංස්කරණ අවධිය තුළ සහාය වී ඇත. මෙය වර්ධිත සම්බන්ධීකරණ කුසලතා හා පුළුල් රුචිකත්වයන් උත්තේජනය කර ඇති අතර ඔවුන්ගේ  ආත්මසම්මානය ඉහළ නංවා තිබේ.

**නිදසුන**

හංගේරියාවේ 2012 වසරේ සිට ප්‍රාදේශීය ප්‍රජාවන්ට ප්‍රයෝජනවත් වන ස්වේච්ඡා වැඩ කටයුතුවල යෙදීමට ද්විතීයික පාසල් සිසුන්ට අනිවාර්ය කර තිබේ. මෙම ස්වේච්ඡා වැඩ පාසල් සහ මහජන පුස්තකාල යන දෙකෙහිම සිදු කළ හැකිය.

## 3.8 ආචාරධාර්මික ප්‍රමිති

එකිනෙකා සමඟ සහ පාසල් ප්‍රජාවගේ සියලු සාමාජිකයන් සමඟ කරනු ලබන ස්වකීය ගනුදෙනුවේ දී ඉහළ ආචාරධාර්මික ප්‍රමිති නිරීක්ෂණය කිරීමට පාසල් පුස්තකාලයේ සේවය කරන සියල්ලන්ට වගකීමක් තිබේ. ඔවුන් ස්වකීය සුව පහසුවට පෙර පුස්තකාල පාඨකයන්ගේ අයිතීන්ට ප්‍රමුඛත්වය දීමටත් පුස්තකාල සේවා සැපයීමේ දී තම පෞද්ගලික ආකල්ප සහ විශ්වාස මඟින් සිදු වන පක්ෂග්‍රාහීත්වයන් මඟ හැරීමටත් උත්සාහ කළ යුතුය. ස්වකීය හැකියාවන් සහ පසුබිම පිළිබඳ තැකීමකින් තොරව සමානාත්මතා පදනම මත ළමයින්, යෞවනයන් සහ වැඩිහිටියන් සමඟ කටයුතු කළ යුතුය. පෞද්ගලිකත්වය සහ දැන ගැනීම සඳහා ඇති ඔවුන්ගේ අයිතිය පවත්වා ගෙන යා යුතුය.

ස්වේච්ඡා සේවකයන් ඇතුළු පාසල් පුස්තකාලයේ සේවය කරන සියල්ලන් පාසල් පුස්තකාලයාධිපතිත්වයේ හර වටිනාකම් මූර්තිමත් කිරීමට උත්සාහ කළ යුතු වේ. භාරකාරත්වය, සේවය, බුද්ධිමය නිදහස, බුද්ධිවාදය, සාක්ෂරතාව හා ඉගෙනුම, වාර්තාගත දැනුම සහ තොරතුරු වෙත සමාන ප්‍රවේශය, පෞද්ගලිකත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදය මෙකී හර වටිනාකම් වේ. වාර්තාගත දැනුම සහ තොරතුරු වෙත සමාන ප්‍රවේශ හා බුද්ධිමය නිදහස පිළිබඳ හර වටිනාකම් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වගන්තියේ සහ ඉෆ්ලා හි වටිනාකම් තුළ අන්තර්ගත වේ.

## ප්‍රයෝජනවත් මූලාශ්‍ර


American Library Association. (2010). *ALA/AASL Standards for initial preparation of school librarians.* Retrieved from www.ala.org/aasl/education/ncate

CLEMI: Centre de liaison de l'enseignement et des médias d'information. (2013). *Proposition pour un référentiel enseignant en éducation aux médias* [Proposal for a repository in teaching media literacy] [pdf en ligne]. Retrieved from www.clemi.org/fichier/plug_download/29480/download_fichier_fr_referentiel_clemi_version2.pdf

Conseil supérieur de l'éducation aux médias. (2013). *Les compétences en éducation aux medias: Un enjeu éducatif majeur* [Media literacy skills: A major educational challenge]. Belgique: CSEM.

Gorman, M. (2000). *Our enduring values: Librarianship in the 21st century.* Chicago: American Library Association.

International Federation of Library Associations. (2012). *Professional Codes of Ethics for Librarians.* Retrieved from www.ifla.org/faife/professional-codes-of-ethics-for-librarians

International Federation of Library Associations. (2015). *Indigenous Matters Special Interest Group.* www.ifla.org/indigenous-matters

International Federation of Library Associations. (2015). *Lesbian, Gay, Bisexual, Transgender and Queer/Questioning Users Special Interest Group.* Retrieved from www.ifla.org/lgbtq

International Federation of Library Associations. (2015). *IFLA/UNESCO Multicultural Library Manifesto.* Retrieved from www.ifla.org/node/8976

Markless, S. (Ed.). (2009). *The innovative school librarian: Thinking outside the box.* London: Facet Publishing. [See Chapters 1 & 2, pp. 1-46.]

Ministère de l'éducation nationale. (2013). Référentiel de compétences des enseignants [Competency framework for teachers]. *Bulletin officiel de l'éducation nationale,* n°30, 25/07/2013.

National Forum on Information Literacy. (2014). *Policy statement on the importance of certified school librarians.* Retrieved from http://infolit.org/nfil-policy-statement-school-librarians

Simpson, C. (2003). *Ethics in school librarianship: A reader.* Worthington, OH: Linworth.

Wilson, C., Grizzle, A., Tuazon, R., Akyempong, K., & Cheung, C.K. (2012). *Education aux médias et à l'information: programme de formation pour les enseignants* [Media education and information: A training program for teachers]. Paris: UNESCO.

## 04 පරිච්ඡේදය

## පාසල් පුස්තකාලයක භෞතික හා ඩිජිටල් සම්පත්

*"ප්‍රබන්ධමය සිට වාර්තාමය දක්වාත් මුද්‍රිත සිට ඉලෙක්ට්‍රොනික දක්වාත්, පුස්තකාලය තුළ මෙන්ම ඉන් දුරස්ථව පුළුල් පරාසයක විහිදෙන පොත් සහ වෙනත් තොරතුරු සම්පත්වල භාවිතයට පුස්තකාල කාර්යමණ්ඩලය සහාය වේ."* පාසල් පුස්තකාල ප්‍රඥප්තිය.

### 4.1 හැඳින්වීම

පාසල් පුස්තකාලයක භෞතික සහ ඩිජිටල් සම්පත්වලට, ඉගැන්වීම සහ ඉගෙනුම සඳහා වන පහසුකම්, උපකරණ සහ එකතූන් ඇතුළත් වේ. තාක්ෂණය, සමස්තයක් ලෙස පාසල වෙතට මෙන්ම ප්‍රජාව වෙතට ද පාසල් පුස්තකාලයක ළඟාවීම වැඩි වැඩියෙන් ව්‍යාප්ත කරයි. තාක්ෂණය පාසල් පුස්තකාලයේ සම්පත් වෙතට 24/7 ප්‍රවේශය මෙන්ම පාසල් දිනය සහ පාසල් පවත්වන දින දර්ශනය ඉක්මවා යන සම්පත් වෙත ප්‍රවේශයට පහසුකම් සලසයි. පාසල් පුස්තකාලයක පහසුකම්, උපකරණ සහ එකතූන් ගුරුවරුන්ගේ හා සිසුන්ගේ ඉගැන්වීම් සහ ඉගෙනුම් අවශ්‍යතාවල සිදු වන වෙනස්කම්වලට ප්‍රතිචාර දැක්වීමේ දී පරිණාමය වීම අවශ්‍යය.

### 4.2 පහසුකම්

වර්තමානයේ බොහෝ පාසල් පුස්තකාල සැලසුම් කර ඇතතේ සහභාගිත්ව සංස්කෘතිකයක් තුළ පවත්නා පාඨක සබඳතාවට ප්‍රතිචාරයක් වශයෙන් 'නිදහස් ඉගෙනුම් අවකාශ' ලෙසය. එය පාඨකයන්ගේ භූමිකාව තොරතුරුවල පාරිභෝගිකයන්ගේ සිට තොරතුරුවල නිර්මාණකරුවන් දක්වා ව්‍යාප්ත කරයි. පුස්තකාල නිදහස් ඉගෙනුම් අවකාශ, තොරතුරු නිෂ්පාදන නිමවීම සඳහා අවශ්‍ය පහසුකම් සහ උපකරණ අවකාශයන් ද සපයයි.

#### 4.2.1. පිහිටීම සහ අවකාශය

පාසල් පුස්තකාලයේ පහුසකම්වල ප්‍රමාණය සහ සැලසුම සඳහා විශ්වීය ප්‍රමිති නොමැති වුව ද මූලික සැලසුම්කරණ ඇස්තමේන්තු සඳහා නිර්ණායක පැවතීම ප්‍රයෝජනවත්ය. සාමාන්‍යයෙන් ඉගෙනුම් කේන්ද්‍රීය ආදර්ශනයකට ගමන් කරමින් සිටින පාසල් සහ ශාස්ත්‍රීය පුස්තකාල බොහෝ විට නිදහස් ඉගෙනුම් අවකාශ ලෙස සැලසුම් කෙරේ. පාසල් පුස්තකාල පහසුකම් සැලසුම් කිරීමේ දී පහත සඳහන් ප්‍රතිෂ්ඨාවන් ඇතුළත් කිරීම අවශ්‍යය.

- ★ මධ්‍යම පිහිටීම, හැකි නම් බිම් මහලේ
- ★ ඉගැන්වීම් කලාප වෙත ප්‍රවේශකත්වය සහ සමීප බව
- ★ ශබ්ද සාධකය, අවම වශයෙන් පුස්තකාලයේ සමහර කොටස් බාහිර ශබ්දවලින් නිදහස්වීම
- ★ යෝග්‍ය සහ/ප්‍රමාණවත් ස්වභාවික සහ/ හෝ කෘත්‍රිම ආලෝකය

- වසර පුරා වැඩ කිරීමට සුදුසු තත්ත්වයක් සහ එකතුන්වල සංරක්ෂණය සහතික කිරීමට යෝග්‍ය කාමර උෂ්ණත්වය (උදා - වායුසමනය, උණුසුම් කිරීම)
- විශේෂ අවශ්‍යතා සහිත පුස්තකාල පාඨකයන් සඳහා යෝග්‍ය සැලසුම්
- ග්‍රන්ථ එකතුව, ප්‍රබන්ධ, ප්‍රබන්ධ නොවන තද සහ මෘදු කවර පොත්, පුවත්පත්, වාර සඟරා, මුද්‍රිත නොවන සම්පත් සහ ගබඩා කිරීම, අධ්‍යයන අවකාශ, කියවීම් කලාප, පරිගණක සේවා ස්ථාන, ප්‍රදර්ශන කලාප, සහ පුස්තකාල කාර්යමණ්ඩලය සඳහා වැඩකටයුතු සිදු කිරීමට අවශ්‍ය කලාප වෙනුවෙන් ප්‍රමාණවත් ඉඩකඩ ලබාදීම
- ක්‍රියාකාරකම්වල බහුවිධත්වයට සහ විෂයමාලාවේ හා තාක්ෂණයේ අනාගත වෙනස්කම්වලට අවකාශ සලසන නම්‍යශීලීත්වය

#### 4.2.2 අවකාශය සංවිධානය

පහත සදහන් කෘත්‍යාත්මක කලාප සැපයීම අවශ්‍ය වේ.

- අධ්‍යයන හා පර්යේෂණ කලාප - තොරතුරු මේසය, සූචි, මාර්ගගත ස්ථාන, අධ්‍යයන සහ පර්යේෂණ මේස, විමර්ශන ද්‍රව්‍ය සහ මූලික එකතුන් සඳහා ඉඩකඩ
- අවිධිමත් කියවීම් කලාප - සාක්ෂරතාව, යාවජීව ඉගෙනුම සහ වින්දනය සඳහා කියවීම දිරිමත් කරන පොත් සහ වාර සඟරා සඳහා ඉඩකඩ
- උපදේශාත්මක කලාප - යෝග්‍ය උපදේශාත්මක තාක්ෂණය සහ ප්‍රදර්ශන අවකාශ සහිතව කුඩා කණ්ඩායම්, විශාල කණ්ඩායම් සහ සමස්ත පන්තිකාමරවලට විධිමත් උපදේශකත්වය සඳහා ආසන සහිත ඉඩකඩ (බොහෝ විට ශිෂ්‍ය ජනගහනයෙන් 10%ක් සඳහා ආසන සැපයීම නිර්දේශ කෙරේ)
- මාධ්‍ය නිෂ්පාදන සහ කණ්ඩායම් ව්‍යාපෘති කලාප - තනි පුද්ගලයන්, කණ්ඩායම් සහ පන්ති සඳහා ඉඩකඩ (මේවා බොහෝ විට රසායනාගාර හෝ 'නිර්මාණ අවකාශ යනුවෙන් හඳුන්වයි.)
- පරිපාලන කලාප - සංසරණ මේසය, කාර්යාල කලාපය සඳහා ඉඩකඩ, පුස්තකාල මාධ්‍ය ද්‍රව්‍ය පිරිසැකසීම සඳහා ඉඩකඩ, උපකරණ සැපයුම් සහ ද්‍රව්‍ය සඳහා ගබඩා ඉඩකඩ

#### 4.2.3 භෞතික සහ ඩිජිටල් ප්‍රවේශය

පුස්තකාලය වෙත භෞතික සහ ඩිජිටල් ප්‍රවේශය උපරිම කළ යුතුය. තාක්ෂණය සමඟ පුස්තකාලයේ තොරතුරු සම්පත් වෙත ඩිජිටල් ප්‍රවේශය පාසල් සහ ඉන් ඔබ්බට මෙන්ම 24/7 පුරා සැපයිය හැකිය. කාර්යමණ්ඩල සම්පත් සීමිත ස්ථානවල පුහුණුවලත් සිසුන් සහ වැඩිහිටි ස්වේච්ඡා සේවකයන්ගේ භාවිතය සහිත අධීක්ෂණ ක්‍රමයක් සලකා බැලිය යුතුය.

### 4.3 එකතු සංවර්ධනය සහ කළමනාකරණය

පාසල් පුස්තකාලය පාඨකයන්ගේ අවශ්‍යතා සපුරාලීමට සහ ඔවුන්ගේ වයස, භාෂාව සහ ජනවිද්‍යාත්මක ලක්ෂණ පිළිබිඹු කිරීමට භෞතික සහ ඩිජිටල් සම්පත්වල පුළුල් පරාසයකට ප්‍රවේශය සපයයි. අලුත් සහ අදාළ ද්‍රව්‍ය වෙත පාඨකයන්ට ප්‍රවේශය ලබා දීම සහතික කිරීමට එකතුව අඛණ්ඩ පදනමක් මත සංවර්ධනය කිරීම අවශ්‍යය. එකතු සංවර්ධන ප්‍රතිපත්තිය එකතුවේ අරමුණු, අභිප්‍රායන්

සහ අන්තර්ගතයන් මෙන්ම බාහිර සම්පත් වෙත ප්‍රවේශය නිර්වචනය කරන අතර උසස් ගුණාත්මක අගයෙන් යුත් සම්පත්වල පුළුල් පරාසයක් සහතික කිරීමට සහාය වේ. ඉලෙක්ට්‍රොනික පොත් (විමර්ශන, ප්‍රබන්ධ සහ ප්‍රබන්ධ නොවන), මාර්ගගත දත්ත පදනම්, මාර්ගගත පුවත්පත් සහ සඟරා වීඩියෝ ක්‍රීඩා සහ බහුමාධ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය වැනි ඩිජිටල් සම්පත් පුස්තකාලයේ සම්පත්වල කැපී පෙනෙන කොටසක් බවට වැඩි වැඩියෙන් පත් වෙමින් තිබේ.

සිසුන්ගේ ඉගෙනුම් අවශ්‍යතා සපුරාලන එකතුවට අමතරව පාසල් පුස්තකාල කාර්යමණ්ඩලය සහ ගුරුවරුන් සඳහා වන වෘත්තීය සම්පත් එකතුවක් ද (උදා - අධ්‍යාපනය, උගන්වන විෂයන්. නව ඉගැන්වීම්/ ඉගෙනුම් ශෛලීන් සහ ක්‍රමවේද) දෙමාපියන් සහ භාරකරුවන් ආමන්ත්‍රණය කරන එකතුවක් ද පාසල් පුස්තකාලයට ඇතුළත් විය යුතුය.

**නිදසුන**

ඉතාලියේ රෝමයෙහි ප්‍රාථමික පාසලක පුස්තකාලය 'දෙමාපිය රාක්කයක්' සංවර්ධනය කර ඇත. එහි ළමා මනෝවිද්‍යාව, අධ්‍යාපනය සහ ළමයින්ගේ භීතිකාවන් සහ ආත්ම සම්මානනයන් වැනි නියත මාතෘකා පිළිබඳ සම්පත් එක්රැස් කර ඇත.

### 4.3.1 එකතු සංවර්ධන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපටි

පාසල් පුස්තකාලයාධිපති එකතු කළමනාකරණ ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීමට පාසල් පරිපාලකයන් සහ ගුරුවරුන් සමඟ කටයුතු කරයි. එවන් ප්‍රතිපත්ති ප්‍රකාශයක් විෂයමාලාව සහ පාසල් ප්‍රජාවේ නියත අවශ්‍යතා සහ රුචිකත්වයන් මත පදනම් විය යුතු අතර පාසලෙන් බාහිර සමාජයේ විවිධත්වය පිළිබිඹු විය යුතුය. එකතු කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයක පහත සඳහන් අංග ඇතුළත් විය යුතුය.

- (ඉෆ්ලා/යුනෙස්කෝ පාසල් පුස්තකාල ප්‍රඥප්තිය සමඟ ගැලපෙන) පාසල් පුස්තකාලයක මෙහෙවර
- බුද්ධිමය නිදහස සහ තොරතුරු නිදහස පිළිබඳ ප්‍රකාශ
- එකතු කළමනාකරණ ප්‍රතිපත්තියේ අභිප්‍රාය සහ විෂයමාලාවට මෙන්ම එහි පාඨකයන්ගේ ජාතික, වාර්ගික, භාෂාමය, සංස්කෘතික සහ ස්වදේශික අනන්‍යතාවලට ඇති එහි සබඳතාව
- සම්පත්වලට සම්බන්ධ දිගුකාලීන සහ කෙටිකාලීන අරමුණු
- එකතු කළමනාකරණ තීරණ සඳහා වගකීම්

එකතුව ගොඩනැංවීම යනු සහයෝගීත්ව ප්‍රයත්නයක් බවත් තම සිසුන්ගේ අවශ්‍යතා පිළිබඳ වටිනා දැනුම සමඟ විෂය විශේෂඥයන් ලෙස, පුස්තකාල එකතු ගොඩනැංවීමට සහාය වීමේ දී ගුරුවරුන්ට ඉටු කිරීමට වැදගත් භූමිකාවක් තිබෙන බවත් මෙම ප්‍රතිපත්තියේ පැහැදිලිව දැක්විය යුතුය. මෙම ප්‍රතිපත්තිය බුද්ධිමය දේපළෙහි සහ දැන ගැනීම සඳහා වන ළමයින්ගේ අයිතියෙහි මූලධර්ම සමඟ සම්පත්වල ගැලපීම යළි සලකා බැලීමට ක්‍රමවේද ස්ථාපිත කළ යුතුය. එමෙන්ම මෙම ප්‍රතිපත්තිය වාරණය කරන ලද ද්‍රව්‍ය වෙතට විරෝධය දක්වන ප්‍රයත්න සඳහා පාසල් පුස්තකාලයාධිපතීන්ගේ වගකීම හඳුනාගත යුතුය. මෙහිදී සම්පත් හෝ සම්පත් වෙත ප්‍රවේශය සීමා කිරීම සඳහා වන කැඳවීම් මූලාශ්‍රය වැදගත් නැත.

පාසල් පුස්තකාල එකතුව සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වන ක්‍රියාපටිපාටි, වෙනම ලේඛනයක් ලෙස හෝ එකතු කළමනාකරණ ප්‍රතිපත්ති ලේඛනයට ඇමුණුමක් ලෙස හෝ පැහැදිලිව දැක්විය යුතුය. මෙම ක්‍රියාපටිපාටි අත්පොත සම්පත් තේරීමට සහ ප්‍රතිග්‍රහණයට මඟපෙන්විය යුතු අතර සම්පත් පිරිසැකසීම සහ සංවිධානය (සූචිකරණය, වර්ගීකරණය, රාක්කගත කිරීම) සඳහා මෙන්ම සම්පත්වල නඩත්තුව, අලුත්වැඩියාව සහ අපහරණය සඳහා ද ප්‍රමිතීන් සැපයිය යුතු වේ. පාසල් ප්‍රජාවේ සාමාජිකයන්ගේ ජාතිකත්ව, වාර්ගික, සංස්කෘතික, භාෂාමය සහ ස්වදේශික අනන්‍යතා පිළිබිඹු කරන ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර වශයෙන් නිර්මාණය කරන ලද සම්පත් අත්පත් කර ගැනීමේ උපදෙස් අත්පොතට ඇතුළත් විය යුතුය. එමෙන්ම මෙම අත්පොත විවාදාත්මක ද්‍රව්‍ය පිළිබඳ යළි සලකා බැලීම සඳහා පැහැදිලි මාර්ගදර්ශක සැපයිය යුතුය.

**නිදසුන**

ප්‍රංශයේ පාසල් පුස්තකාලයාධිපතීන් පාසල් ප්‍රජාව සමඟ උපදේශකත්වයෙන් ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියක් සංවර්ධනය කරයි. ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියේ දස පනතෙහි තුළ දක්වා ඇති ලෙස පාසලේ විෂයමාලාව සහ උපදේශාත්මක ක්‍රියාකාරකම් හරහා පැහැදිලි කරන ලද ප්‍රතිපත්තිවලට එය සම්බන්ධ කර ඇත.

### 4.3.2 ඩිජිටල් සම්පත්වලට සම්බන්ධ ගැටලු

පාසල් පුස්තකාලය අපගේ තොරතුරු පාදක සමාජයට කැපීපෙනෙන ප්‍රවේශ ලක්ෂ්‍යයක් ලෙස වැදගත් කාර්යයක් ඉටු කරයි. එය විෂයමාලාව මෙන්ම පාඨකයන්ගේ රුචිකත්වයන් සහ සංස්කෘතිය පිළිබිඹු කරන ඩිජිටල් තොරතුරු සම්පත් වෙත ප්‍රවේශය සැපයිය යුතුය. සමාජ මාධ්‍ය විසින් හැකියාව ලබා දී ඇති, මතුවෙමින් පවතින සහභාගිත්ව සංස්කෘතිය තොරතුරු පාරිභෝගිකයාගේ සිට තොරතුරු නිර්මාණයකරුවා දක්වා පුස්තකාල පාඨකයාගේ භූමිකාව ව්‍යාප්ත කිරීමට දායක වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පාසල් පුස්තකාලයාධිපතීන් තොරතුරු නිෂ්පාදන නිමවීම (උදා - වීඩියෝ, බ්ලොග්, පොඩ්කාස්ට්, ත්‍රිමාන ප්‍රක්ෂේපණ, පෝස්ටර්, තොරතුරු චිත්‍රක) ඇතුළු ප්‍රායෝගික ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පරිගණක සහ වෙනත් නිෂ්පාදන උපකරණ සමඟ 'නිර්මාණ අවකාශයක්' සැපයීම වෙත අවධානය යොමු කිරීම අවශ්‍යය.

ඩිජිටල් සම්පත්වල සහ අන්තර්ජාල ප්‍රවේශයේ වර්ධනය වන පැවතීමෙන් අදහස් වන්නේ පුළුල් ජාලවලට පාසල් පුස්තකාලය ඇතුළත් කිරීම පහසු කිරීමට, පිළිගත් ජාතික සහ ජාත්‍යන්තර ග්‍රන්ථ විද්‍යාත්මක ප්‍රමිතිවලට අනුව සම්පත් වර්ගීකරණය සහ සූචිකරණය සඳහා යෝග්‍ය සූචිකරණ ක්‍රමයක් පාසල් පුස්තකාලයට අවශ්‍ය බවය. ලොව වටා බොහෝ ස්ථානවල පාසල් පුස්තකාල ඒකාබද්ධ හෝ සාමූහික සූචිකරණ ක්‍රමයක් හරහා ප්‍රාදේශීය සහ කලාපීය ප්‍රජාව සමඟ සම්බන්ධ වීමෙන් ප්‍රතිලාභ ලබයි. එවන් සහයෝගිතාවන් සම්පත් තේරීමේ සූචිකරණයේ සහ පිරිසැකසුමේ කාර්යක්ෂමතාව සහ ගුණාත්මක බව වර්ධනය කරන අතර උපරිම ප්‍රතිඵල වෙනුවෙන් සම්පත් ඒකාබද්ධ කිරීම පහසු කරයි. වෙනත් ස්ථානවල දී මිල අධික වාණිජ දත්ත පදනම් සහ මාර්ගගත විමර්ශන මූලාශ්‍ර සම්පත් බෙදා හදා ගැනීමට පහසුකම් සලසන ඒකාබද්ධ වීම් වෙතින් හෝ රජයේ ප්‍රයත්න වෙතින් පාසල් පුස්තකාල ප්‍රතිලාභ ලබයි.

**නිදසුන**

කැනඩාවේ ඇල්බටාහි අධ්‍යාපන අමාත්‍යාංශය මාර්ගගත විමර්ශන මධ්‍යස්ථානය හරහා පළාතේ සිසුන් සහ ගුරුවරුන් සියලු දෙනා සඳහා ඉංග්‍රීසි සහ ප්‍රංශ භාෂාමය ගුණාත්මක මාර්ගගත තොරතුරු සම්පත් ලබා ගැනීමට අරමුදල් සපයයි.

**නිදසුන**

ප්‍රංශයේ සිසුන්ගේ පහසු ප්‍රවේශයට සහ ඩිජිටල් සම්පත් භාවිතයට සංස්කරණ සහ අනුක්‍රමණිකාගත සම්පත් 300කට වඩා Correlyce Platform මඟින් සපයනු ලබයි.

ඩිජිටල් එකතු කළමානාකරණය සඳහා ඇති නිර්ණායක මුද්‍රිත මාධ්‍ය කළමනාකරණය සඳහා වන නිර්ණායකවලට සමානය. කෙසේ වෙතත් ඇතැම් විශේෂ ප්‍රතිජ්ඨාවන් ද ඇත.

- ⋆ ප්‍රවේශය - මුද්‍රිත අයිතමයකට වඩා ඩිජිටල් අයිතමයක් තෝරා ගැනීමෙන් ප්‍රවේශය වර්ධනය කරයි ද නැතහොත් අඩු කරයි ද?
- ⋆ මූල්‍යමය සහ තාක්ෂණික කරුණු - අඛණ්ඩ බලපත්‍ර ගාස්තු හෝ නව ආකෘතිවලට වෙනස්වීමේ ගාස්තු හේතු කොට ගෙන දිගුකාලීනව ඩිජිටල් අයිතමයේ පිරිවැය ඉහළ නැංවේ ද?
- ⋆ නීතිමය සහ බලපත්‍ර ගැටලු - ප්‍රකාශන හිමිකම් නීති සහ ඩිජිටල් ද්‍රව්‍ය සඳහා ඇති බලපත්‍ර කොන්දේසි - පාඨකයන්ගේ සංඛ්‍යාව, දුරස්ථ ක්ෂේත්‍ර ප්‍රවේශය හෝ පාඨක පෞද්ගලිකත්වය සීමා කරයි ද?
- ⋆ ආරක්ෂාව - සම්පත් වෙත ප්‍රවේශය සුරක්ෂිත කරනුයේ කෙසේ ද?

**4.3.3 එකතුන්හි ප්‍රමිති**

වර්තමානයේ පුස්තකාල තුළ පවත්නා හෝ බාහිර වාණිජ දත්ත පදනම් සහ බලපත්‍ර සහිත වීමර්ශන ද්‍රව්‍ය හරහා බොහෝ ඩිජිටල් සම්පත් පාසල් පුස්තකාල එකතුවට ඇතුළත් වන විට සාම්ප්‍රදායික පාසල් පුස්තකාල එකතු ප්‍රමිතීන් සංවර්ධනය කිරීමට සහ ව්‍යවහාර කිරීමට දුෂ්කර වේ. ජාතික හෝ ප්‍රාදේශීය එකතු ප්‍රමිතීන් වෙත ප්‍රවේශය සහිතව හෝ රහිතව එකතු සංවර්ධන තීරණ ගත යුත්තේ විෂයමාලා අවශ්‍යතා සහ උපදේශාත්මක එළඹුම මත පදනම්වය.

වෙනස් වයස් මට්ටම්, හැකියාවන්, ඉගෙනුම් ශෛලීන් සහ පසුබිම් සහිත පාඨකයන් සඳහා සම්පත් වෙත ප්‍රවේශය සහතික කිරීමට කාලීන සහ අදාළ සමතුලිත එකතුවක් අවශ්‍ය වේ. එකතුව භෞතික හෝ ඩිජිටල් ආකෘතිවල තොරතුරු සම්පත් හරහා විෂයමාලාවට සහාය විය යුතුය. එයට අමතරව, පාසල් පුස්තකාලයක් ජනප්‍රිය හෝ ග්‍රැෆික නවකතා, සංගීතය, පරිගණක ක්‍රීඩා, චිත්‍රපට, සඟරා හාස්‍යමය ද්‍රව්‍ය සහ පෝස්ටර් වැනි වින්දනාත්මක අභිප්‍රායන් සඳහා ඇති ද්‍රව්‍ය අත්පත් කර ගත යුතුය. මෙම සම්පත් සිසුන්ගේ රුචිකත්වයන් සහ සංස්කෘතිය පිළිබිඹු වන ද්‍රව්‍ය බව සහතික කිරීමට සිසුන්ගේ සහයෝගය ඇතිව තෝරා ගත යුතුය.

**නිදසුන**

ඇමෙරිකා එක්සත් ජනපදයේ දකුණු කැරලොයිනා අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 2012 දී එකතු සංවර්ධන ප්‍රමිති නිකුත් කරන ලදී. සිසුවෙකු සඳහා ඇති ද්‍රව්‍ය සංඛ්‍යාව අනුව එකතුව අවදානම් තත්ත්වය (ද්‍රව්‍ය 11) 'මූලික' (13) සහ ආදර්ශ (15) යනුවෙන් සලකා බැලේ. එකතුවක ප්‍රබන්ධ සහ ප්‍රබන්ධ නොවන ද්‍රව්‍යවල ප්‍රතිශතය ශ්‍රේණි පරාසයට අනුව සහ නියත සාක්ෂරතා ව්‍යාපෘතියේ අවශ්‍යතා අනුව වෙනස් විය යුතුය.

### 4.3.4 සම්පත් බෙදාහදා ගැනීම

අන්තර්පුස්තකාල පිරුළු සහ සම්පත් බෙදාහදා ගැනීම හරහා පාසල් පුස්තකාල ස්වකීය පාඨකයන් සඳහා පුස්තකාල ද්‍රව්‍ය වෙත ප්‍රවේශය ඉහළ නැංවිය යුතුය. කෙසේ වෙතත්, මෙය බොහෝ පාසල් පුස්තකාලවල සාම්ප්‍රදායික කාර්යයක් නොවන නිසා මීට පහසුකම් සැලසීමට හොඳින් ස්ථාපිත ක්‍රම ඇත්තේ කලාතුරකිනි. ඒකාබද්ධ සූචියක් මඟින් හෝ මාර්ගගත දත්ත පදනම් සහ ඩිජිටල් විමර්ශන ද්‍රව්‍ය වෙත, බෙදාහදා ගන්නා ලද ප්‍රවේශය මඟින් පාසල් පුස්තකාල සම්බන්ධ වී ඇති ස්ථානවල අන්තර්පුස්තකාල පිරුළු සහ සම්පත් බෙදාහදා ගැනීම සූදානම් කිරීම පහසු වේ.

**නිදසුන**

ඉතාලියේ විසෙන්සාහි ජ්‍යෙෂ්ඨ උසස් පාසල් 26ක් ප්‍රාථමික හා කණිෂ්ඨ පාසල් 15ක් සහ පෞද්ගලික සාමාජිකයන් 2ක් ජාලයක් නිර්මාණය කර ඇත. එහිදී සම්පත් සහ පුස්තකාල මෘදුකාංග බෙදාහදා ගන්නා අතර අන්තර්පුස්තකාල පිරුළු සේවා සපයනු ලැබේ.

**නිදසුන**

පෘතුගාලයේ පාසල් හා මහජන පුස්තකාල ජාලගතව පවත්නා අතර සමාන පුස්තකාල සූචිකරණ සහ ස්වයංක්‍රියකරණ පද්ධති බෙදාහදා ගනී.

**නිදසුන**

නෙදර්ලන්තයේ පුළුල්/ ප්‍රජා පාසල්වල (Brede School) හදවත වන්නේ පුස්තකාලයයි. මෙම පාසල් පුස්තකාලය පූර්ණ සංයුක්ත සහ සංගෘහිත දැනුම් මධ්‍යස්ථානයකි. එමෙන්ම එය ප්‍රජා අධ්‍යාපනික සේවාවන්ගේ පුළුල් පරාසයක් මුණගැසෙන ස්ථානයක් සපයයි. (උදා - ළදරුවන් සහ ප්‍රාථමික පාසල්, ශාරීරික අභ්‍යාස පුහුණු ශාලා)

## ප්‍රයෝජනවත් මූලාශ්‍ර


Bon, I., Cranfield, A., & Latimer, K. (Eds.). (2011). *Designing library space for children.* Berlin/Munich: De Gruyter Saur. (IFLA Publications; Nr 154.)

Dewe, M. (2007). *Ideas and designs: Creating the environment for the primary school library.* Swindon, UK: School Library Association [UK].

Dubber, G., & Lemaire, K. (2007). *Visionary spaces: Designing and planning a secondary school library.* Swindon, UK: School Library Association [UK].

Durpaire, J-L. (2004). *Politique d'acquisition in Les politiques documentaires des Etablissements scolaires* [The acquisition policy within a school's policy] (pp. 34-36). Paris: Inspection Generale de l'Education Nationale.

La Marca, S. (Ed). (2007). *Rethink! Ideas for inspiring school library design*. Carlton, Victoria, Australia: School Library Association of Victoria.

Landelijk Steunpunt Brede Scholen. (2013). *Verschijningsvormen Brede Scholen 2013.* [Examples of Community Schools 2013] (2nd ed.). Den Haag, Netherland: bredeschool.nl. Retrieved from www.bredeschool.nl/fileadmin/PDF/2013/2013-05-28__13_170_LSBS_gew_herdruk_brochure_Verschijningvormen_4.pdf

Latimer, K., & Niegaard, H. (2007). *IFLA library building guidelines: Developments and reflections.* Munich: K.G. Saur.

Loertscher, D., Koechlin, C., Zwann, S., & Rosenfield, E. (2011). *The new learning commons: Where the learners win!* (2nd ed.) Clearfield, UT: Learning Commons Press.

Marquardt, L. (2013). La biblioteca scolastica, ambiente e bene comune per l'apprendimento [school libraries, learning environments and commons]. In M. Vivarelli (Ed.). *Lo spazio della biblioteca* … [The Library Space …]. Milano: Editrice Bibliografica. [See Chapter 4.6, pp. 299-334, and case study pp. 400-401.]

Molina, J. & Ducournau, J. (2006). Les 10 commandements d'une politique d'acquisition. [The 10 Commandments of an acquisition policy]. Retrieved from www.cndp.fr/savoirscdi/metier.html

OSLA (Ontario School Library Association). (2010). *Together for learning: School libraries and the emergence of the learning commons. A vision for the 21st Century.* Toronto, Canada: OSLA, 2010. Retrieved from www.accessola.com/data/6/rec_docs/677_olatogetherforlearning.pdf

Pavey, S. (2014). *Mobile technology and the school library*. Swindon, UK: School Library Association [UK]

Preddy, L. B. (2013). *School library makerspaces: Grades 6-12*. Westport, CT: Libraries Unlimited.

South Carolina Department of Education. (2012). *South Carolina standards for school library resource collections.* Columbia: SCDE. Retrieved from http://ed.sc.gov/agency/programs-services/36/documents/Standards_School_Library_Resource_Collections.pdf

# 05 පරිච්ඡේදය

## පාසල් පුස්තකාලයක වැඩසටහන් සහ ක්‍රියාකාරකම්

**"පාසල් පුස්තකාලය අධ්‍යාපනික ක්‍රියාවලියේ අවියෝජනීය අංගයකි."** පාසල් පුස්තකාල ප්‍රඥප්තිය

### 5.1 හැඳින්වීම

අධ්‍යාපනික මෙහෙවර සපුරාලීමේ දී සාර්ථකත්වයට පත්වීමට පාසල් පුස්තකාලය හොඳින් පර්යේෂිත උපදේශාත්මක වැඩසටහන් සහ සේවා ක්‍රියාකාරකම් හරහා අධ්‍යාපනික ප්‍රජාව සක්‍රීයව සම්බන්ධ කළ යුතුය. පාසල් පුස්තකාලයක් විසින් සපයන වැඩසටහන් සහ ක්‍රියාකාරකම් ලොව පුරා විවිධත්වයක් ගනී. මන්ද, ඒවා පාසල් සහ පුළුල් ප්‍රජාවගේ අභිමතාර්ථ සමඟ පෙළ ගැසිය යුතු බැවිනි. (ප්‍රජා සබඳතා සඳහා 3.5.4 කොටස බලන්න)

පාසල් පුස්තකාලයක වැසටහන් හා ක්‍රියාකාරකම් පැහැදිලි කිරීමට භාවිත කරන වදන් කෝෂය ද ලොව පුරා විවිධත්වයෙන් යුක්ත වේ. නිදසුනක් ලෙස, උද්‍යෝගිමත් සහ කුසලතාපූර්ණ පාඨකයන් සංවර්ධනය කිරීමේදී' කියවීම ප්‍රවර්ධනය', 'පුළුල්ව කියවීම', 'නිදහස් ස්වේච්ඡා කියවීම හෝ 'වින්දනය සඳහා කියවීම' ලෙස විවිධ ආකාරයෙන් පැහැදිලි කෙරේ. මේ කවර ලෙස හැඳින්වූව ද කියවීමට පෙළඹවීම සහිත නිපුණ පාඨකයන් සංවර්ධනය කිරීම ලොව පුරා පාසල් පුස්තකාල වැඩසටහන්වල සහ ක්‍රියාකාරකම්වල වැදගත් අංගයකි.

**නිදසුන**

නැමීබියාවේ වාර්ෂික කියවීම් උළෙල ළමයින්ට තම මව් භාෂාවේ කතන්දර සැපයීම මඟින් කියවීම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කරයි. (නැමීබියාවේ ලිඛිත භාෂා 13ක් තිබේ.) එය පාසල් සහ පුස්තකාල සඳහා මව් භාෂාවලින් ළමා පොත් පළ කිරීමට ශක්තියක් වේ.

තොරතුරු භාවිතයට සම්බන්ධ වදන් කෝෂය ද තවත් ව්‍යාකූල ක්ෂේත්‍රයකි. මෙම ක්‍රියාකාරකම් වරෙක 'ග්‍රන්ථවිද්‍යාත්මක උපදෙස්' (පුස්තකාලයේ පයීතයන් සහ පද්ධති ක්‍රියා කරන ආකාරය පිළිබඳ උපදෙස් දීම) සහ 'පාඨක අධ්‍යාපනය' (පුස්තකාලය සහ එහි සේවාවන් වටහා ගැනීමට පාඨකයන්ට සහාය වන ඕනෑම ක්‍රමයක්) යනුවෙන් හඳුන්වන ලද අතර, වර්තමානයේ බොහෝ විට එය 'තොරතුරු සාක්ෂරතාව සහ 'විමසුම' යනුවෙන් හඳුන්වනු ලැබේ. තොරතුරු භාවිතයේ දී පුස්තකාල හා සම්බන්ධ නිදර්ශනාත්මක උපදෙස් ලෙස සැලකූ දෙය කාලයත් සමඟ වෙනස් වී ඇත. එය 1960 සහ 1970 දශකවල මූලාශ්‍ර එළඹුමකි, 1980 දශකය පුරා ගවේෂණ එළඹුමකි, 1990 දශකය ආරම්භයේ දී ක්‍රියාවලි එළඹුමකි. (කුල්තාහු, 2004) ක්‍රියාවලි එළඹුම ගැටලු විසඳීමේ දක්මක් තුළ තොරතුරු සහ තොරතුරු භාවිතය පිළිබඳ සිතීම අවධාරණය කරයි. එය මෙවලම්, මූලාශ්‍ර සහ සෙවුම් උපායමාර්ග පිළිබඳ දැනුම ලෙස පෙර එළඹුම්වලින් ගත් දැනුම ඉවත නොදමන මුත් මෙම දැනුම සිතීම සහ ගැටලු විසඳීම පිළිබඳ ඉගැන්වීම තුළ විමසුම හරහා වඩාත් හොඳින් සංවර්ධනය කිරීම අවධාරණය කරයි.

## 5.2 වැඩසටහන් සහ ක්‍රියාකාරකම්

පාසල් පුස්තකාලයක් පාසලේ ඉගැන්වීමේ සහ ඉගෙනුමෙහි අත්‍යවශ්‍ය සංරචකයක් වේ. එය සිසු නිරතවීම්, විවිධ ඉගෙනුම්කරුවන් අන්තර්ගත කිරීම සහ පුළුල් ප්‍රජාව සමඟ සබඳතා වැනි පාසලේ සමාජීය අභිමතාර්ථ වෙතට ද දායක වේ. පාසල් පුස්කාලයක අභිමතාර්ථ සාක්ෂරතාව, විෂයමාලා පාදක ඉගෙනුම සහ පුරවැසිභාවය වැනි පාසලේ අභිමතාර්ථ සමඟ පෙළ ගැසිය යුතුය. පාසලේ අභිමතාර්ථ ඉටු කර ගැනීමට පාසල් පුස්තකාලයට දායක විය හැකි මට්ටම පාසල් පුස්තකාලයට වෙන් කරන ලද සම්පත් හා කාර්යමණ්ඩලය මත රඳා පවතී.

### නිදසුන

හංගේරියාවේ බොහෝ සිසුන් නගරවල ඉගෙන ගන්නා මුත් ඔවුන් වාසය කරනුයේ නගරවලට යාබද ගම්මානවලය. මේ නිසා ඔවුනට නිතර පාසල හා නිවස අතර ගමන් කිරීමට සිදු වේ. පොදු ප්‍රවාහන පහසුකම්වල සීමාසහිත බව නිසා බොහෝ සිසුන්ට පාසලේ පාඩම්වලට පෙර සහ පසු රැඳී සිටීමට සිදු වේ. පන්ති පටන් ගැනීමට පෙර සහ පාසල් වේලාවෙන් පසු විවෘත කරන කාලය දීර්ඝ කිරීමෙන් බොහෝ පාසල් පුස්තකාල මෙම තත්ත්වයට ප්‍රතිචාර දක්වයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිසුන්ට තම කාලය සුරක්ෂිත, සංස්කෘතික සහ ප්‍රජා ස්ථානයක ගත කළ හැකිය. එමෙන්ම මෙය ගුරු පුස්තකාලයාධිපති සහ සිසුන් අතර සබඳතාව ශක්තිමත් කිරීමට අවස්ථාවක් සපයයි.

විදුහල්පති හෝ ප්‍රධාන ගුරුභවතා සමඟ, අංශ ප්‍රධානීන් සමඟ සහ පාසලේ අනෙකුත් ඉගෙනුම් විශේෂඥයන් සමඟ, සහාය කාර්යමණ්ඩලය සමඟ සහ සිසුන් සමඟ සමීප සහයෝගයෙන් කටයුතු කරමින් සුදුසුකම්ලත් පාසල් පුස්තකාලයාධිපතිවරයකු සේවා සහ ක්‍රියාකාරකම් සැලසුම් කළ යුතුය. යෝග්‍ය අධ්‍යාපනික සම්පත් තේරීමේ යෙදෙන සහ එම සම්පත් මත පදනම් වූ උපදෙස් සැලසුම් කිරීමට පන්තිකාමර ගුරුවරුන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන සුදුසුකම්ලත් පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ විශේෂඥතාවට ප්‍රවේශයකින් තොරව, පර්යේෂණ සාහිත්‍යයෙහි දක්වා ඇති සිසු ජයග්‍රහණයේ වර්ධනයන් සාක්ෂාත් කර ගත නොහැකිය.

සුදුසුකම්ලත් පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ උපදේශනාත්මක කාර්ය පහත සඳහන් ක්‍රියාකාරකම්වලට නාභිගත විය යුතුය.

- ★ සාක්ෂරතාව සහ කියවීම් ප්‍රවර්ධනය
- ★ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව (උදා - තොරතුරු සාක්ෂරතාව, තොරතුරු කුසලතා, තොරතුරු නිපුණතා, තොරතුරු ප්‍රවීණතා, මාධ්‍ය සාක්ෂරතාව, අන්තර්සාක්ෂරතාව, අන්තර්මාධ්‍ය සාක්ෂරතාව)
- ★ විමසුම් පාදක ඉගෙනුම (උදා - ගැටලු පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය)
- ★ තාක්ෂණ සමෝධානය
- ★ ගුරුවරුන් සඳහා වෘත්තීය සංවර්ධනය
- ★ සාහිත්‍ය සහ සංස්කෘතික රසිකත්වය

හර ක්‍රියාකාරකම්වලට සම්බන්ධ පාසල් පුස්තකාල පර්යේෂණ, ක්‍රියාමාර්ග සඳහා රාමුවක් සපයයි. පාසල් පුස්තකාලයක හර ක්‍රියාකාරකම්වල අවධානය පාසලෙහි වැඩසටහන් හා ප්‍රමුඛතා මත පවතිනු ඇති අතර ශ්‍රේණියෙන් ශ්‍රේණියට විෂයමාලා අපේක්ෂාවන්ගේ ප්‍රගතිය පිළිබිඹු විය යුතුය.

## 5.3 සාක්ෂරතාව සහ කියවීම් ප්‍රවර්ධනය

පාසල් පුස්තකාලයක් සිසු සාක්ෂරතාවට සහාය වන අතර කියවීම ප්‍රවර්ධනය කරයි. කියවීම් මට්ටම සහ ඉගෙනුම් ප්‍රතිඵල අතර ඍජු සබඳතාවක් පවත්නා බවත් උද්‍යෝගිමත් සහ කුසලතාපූර්ණ පාඨකයන් සංවර්ධනයේ දී කියවීම් ද්‍රව්‍ය වෙත ප්‍රවේශය ප්‍රධාන සාධකයක් බවත් පර්යේෂණවලින් පෙන්වා දෙයි. (ක්‍රෂෙන්, 2004) පාඨකයන්ට කියවීම් ද්‍රව්‍ය සපයන විට, පාඨකයන්ගේ කේවල අභිමතයන්ට සහාය වන විට සහ තමන්ට කියවීමට අවශ්‍ය දෙය තෝරා ගැනීමට ඇති ඔවුන්ගේ කේවල අයිතීන් පිළිගන්නා විට පාසල් පුස්තකාලයාධිපතීන් ස්වකීය එළඹුමේ දී උපයෝගීතාවාදී මෙන්ම නම්‍යශීලී විය යුතුය. තමන්ගේ කියවීම තෝරා ගැනීමට අවස්ථාව ලද සිසුන්ගේ විභාග ලකුණු ඉහළ ගොස් ඇති බව පෙන්වා දෙයි. කියවීම් ද්‍රව්‍ය තමන්ම තේරීම වදන් සංවර්ධනය, ව්‍යාකරණ විභාග කාර්යසාධනය, ලිවීම සහ වාචික භාෂා හැකියාවන් වර්ධනය කරයි. දෙවන භාෂාවක් ඉගෙන ගන්නා සිසුන්ට තම දෙවන භාෂාවෙහි ගුණාත්මක කෘති වෙතට ප්‍රවේශය ඇති විට එහි ප්‍රවණතාව සහ අවබෝධය ඉහළ නංවා ගනී. කියවීමට වෙහෙසක් ගන්නා පාඨකයන්ට ශ්‍රව්‍ය පොත් වැනි විකල්ප කියවීම් ද්‍රව්‍ය වෙත ප්‍රවේශය දුන් විට ඔවුන් වර්ධිත කියවීම් කුසලතා සහ කියවීම් පිළිබඳ වර්ධිත ආකල්ප පෙන්නුම් කරයි.

කියවීම් දුබලතා සහිත සිසුන්ට විකල්ප කියවීම් ද්‍රව්‍ය අවශ්‍ය වේ. ඇතැම් විට, විශේෂ කියවීම් උපාංග අවශ්‍ය වේ. ඔවුන්ගේ කියවීම් අවශ්‍යතාවලට සහාය වීමට මෙම සිසුන් වෙනුවෙන් සිටින විශේෂිත ගුරුවරුන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට පාසල් පුස්තකාලයාධිපතිට හැකි විය යුතුය. එමෙන්ම පාසල් පුස්තකාලයාධිපති ප්‍රාදේශීය සහ ජාතික ප්‍රමිති සපුරා ගැනීමට පන්තිකාමර කියවීම් සමඟ කටයුතු කරන ගුරුවරුන්ට සහාය විය යුතුය. (උදා - කියවීම් ව්‍යාපෘති සඳහා සුදුසු පොත් සහ රටෙහි භාෂා ප්‍රමිතිවලට උපකාර වන පොත් පිළිබඳ නිර්දේශ සැපයීම සමඟ සහාය දැක්වීම)

පාසල් පුස්තකාලයක් මුද්‍රිත සහ ඩිජිටල් ද්‍රව්‍යවල විවිධත්වයක් අන්තර්ගත සෞන්දර්යාත්මක සහ ප්‍රබෝධජනක පරිසරයක් සැපයිය යුතු අතර නිශ්ශබ්ද කියවීමේ සිට කණ්ඩායම් සාකච්ඡා සහ නිර්මාණාත්මක කටයුතු දක්වා ක්‍රියාකාරකම්වල පුළුල් පරාසයක් සඳහා අවස්ථාවන් ලබා දිය යුතුය. පාසල් පුස්තකාලයාධිපති පුස්තකාල ද්‍රව්‍ය ගැනීමේ දී වඩාත් ලිබරල් ප්‍රතිපත්ති සහතික කළ යුතු අතර ප්‍රමාද වී ආපසු භාරදීම් සහ අස්ථානගත වීම් සඳහා දඩ සහ වෙනත් අය කිරීම් හැකිතාක් දුරට මඟ හැරිය යුතුය.

කියවීම සහ මාධ්‍ය විනෝදය දිරිමත් කිරීමට පවත්නා සාක්ෂරතා පාදක ක්‍රියාකාරකම්වලට සමාජ, සංස්කෘතික මෙන්ම ප්‍රජානන ඉගෙනුම් ක්‍රියාකාරකම් ද ඇතුළත් වේ. ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර වශයෙන් රචිත සහ නිර්මිත මෙන්ම පාසල් ප්‍රජාවේ සාමාජිකයන්ගේ ජාතික, සංස්කෘතික සහ වාර්ගික අනන්‍යතා පිළිබිඹු වන ද්‍රව්‍ය පාසල් පුස්තකාල එකතුවකට ඇතුළත් කිරීම සහතික කිරීමට ප්‍රයත්න ගත යුතුය. පාසල් පුස්තකාලයාධිපති පන්ති කාමරයේ දී මෙන්ම පුස්තකාලයේදී ද ස්වයං තේරීම සහිත ද්‍රව්‍ය කියවීම සඳහාත් අන්‍යයන් සමඟ කියවන දෑ සාකච්ඡා කිරීමට හා බෙදාහදා ගැනීමට සිසුන්ට අවස්ථාවන් ඇති බව සහතික කිරීම සඳහාත් නායකත්වය ගත යුතුය. පොත් පිළිබඳ සාකච්ඡා, පුස්තකාල ප්‍රදර්ශන සහ පුස්තකාල වෙබ් පිටුව පිළිබඳ තොරතුරු හරහා ගුරුවරුන් සහ සිසුන් වෙත නව ප්‍රබන්ධ සහ ප්‍රබන්ධ නොවන ද්‍රව්‍ය ප්‍රවර්ධනය කළ යුතුය. සාක්ෂරතාව සහ කියවීමේ පැතිකඩ ඉහළ නැංවීමට ප්‍රදර්ශන, ලේඛක චාරිකා, සහ ජාත්‍යන්තර

සාක්ෂරතා දින වැනි විශේෂ ඉසව් පුස්තකාලය තුළ හෝ සමස්ත පාසල් පුරා සංවිධානය කළ හැකිය. පාසලෙහි දෙමාපියන්ගේ මැදිහත්වීම සඳහා අවස්ථාවක් සැපයීමට මෙම විශේෂ ඉසව්වලට පුළුවන. නිවසේ සිදු කරන කියවීම් වැඩසටහන් සහ ශබ්ද නඟා කියවීම් වැඩසටහන් හරහා තම දරුවන්ගේ සාක්ෂරතා සංවර්ධනයේ දී දෙමාපියන්ට සහභාගීත්වය දැක්විය හැකිය.

**නිදසුන**

ප්‍රංශයේ Babelio Challenge වැඩසටහන කියවීම් ප්‍රබෝධමත් කරන අතර සමාජ සාහිත්‍ය ජාලයක් හරහා ළමා සාහිත්‍ය ප්‍රවර්ධනය කරයි. (www.babelio.com)

**නිදසුන**

එක්සත් රාජධානියේ පුස්තකාල හා තොරතුරු වෘත්තිකයන්ගේ වරලත් ආයතනය (CILIP) සතුව කානගී සහ කේට් ග්‍රීන්වේ පදක්කම් සඳහා හොඳින් ස්ථාපිත සෙවණැලි යෝජනා ක්‍රමයක් පවතී. එය මෙම ත්‍යාග සඳහා සෑම වසරකම නිර්දේශිත කෘතිවලට සම්බන්ධ කියවීම් ක්‍රියාකාරකම් එක්සත් රාජධානිය පුරා උනන්දු කරවයි.

**නිදසුන**

2004 දී ඉතාලියේ හැමෙලින් සංස්කෘතික සංගමය විසින් ස්ථාපිත කරන ලද සහ බොලොඤ්ඤෝහි සලා බෝර්සා 'පුස්තකාලය විසින් සම්බන්ධීකරණය කරන ලද 'සනාඩු ව්‍යාපෘතිය' ඉතාලියේ විවිධ කලාපවල උසස් පාසල් සිසුන් (වයස අවුරුදු 13 -16) සහ මෑතක සිට අටවන ශ්‍රේණියේ සිසුන් අරමුණු කරගෙන ක්‍රියාත්මක කරනු ලබයි. ප්‍රත්‍යවේක්ෂණය සහ විචාරාත්මක චින්තනය, ජාලකරණය සහ පොත්, ප්‍රහසන, චිත්‍රපට සහ සංගීතය රසවිඳීම උත්තේජනය කිරීම මෙම ව්‍යාපෘතියේ අභිප්‍රායට ඇතුළත් වේ.

## 5.4 මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා උපදේශකත්වය

පාසල් පුස්තකාලයක දෙවන පැවරුමක් වන්නේ සදාතනිකව වෙනස් වන ලෝකයක් තුළ ඉගෙනුම්කරුවන් හා පුරවැසියන් ලෙස තමන්ගේ ජීවිත සඳහා වගකිවයුතු ලෙසත් ආචාරධාර්මික ලෙසත් තොරතුරු සොයා ගත හැකි හා භාවිත කළ හැකි සිසුන් සංවර්ධනය කිරීමය. ෆොරස්ට් වූඩ් හෝර්ටන් (කණිෂ්ඨ) විසින් ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා රචිත 2007 පළ කරන ලද යුනෙස්කෝ ලේඛනයක් වන තොරතුරු සාක්ෂරතාව වටහා ගැනීමට ප්‍රාරම්භයක් යන කෘතිය විධිමත් සහ අවිධිමත් ඉගෙනුම තුළ තොරතුරු සාක්ෂරතාවට සහ තොරතුරු සාක්ෂරතාව රඟ දක්වන භූමිකාවට සම්බන්ධ සංකල්ප සහ නිර්වචන පිළිබඳ ප්‍රයෝජනවත් සාරාංශයකි. යුනෙස්කෝව අපගේ පෞද්ගලික ජීවිත තුළ සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජ තුළ මාධ්‍ය හා තොරතුරු මූලාශ්‍රවල වැදගත්කම හඳුනා ගනිමින් මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව පිළිබඳ සංකල්ප ප්‍රවර්ධනය කරයි. 2011 දී යුනෙස්කෝව විසින් ප්‍රකාශිත ගුරුවරුන් සඳහා මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා විෂයමාලාව නම් ලේඛනය මාධ්‍ය සාක්ෂරතාව සහ තොරතුරු සාක්ෂරතාව එක්ව සලකා බැලිය යුත්තේ ඇයි ද යන්න

පැහැදිලි කරයි. ගුරුවරුන් සඳහා වන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා විෂයමාලා රාමුව ඉගැන්වීම සහ ඉගෙනුම පිළිබඳ ක්ෂේත්‍ර තුනක් ආමන්ත්‍රණය කරයි.

1. ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජීය සහභාගිත්වය සඳහා මාධ්‍ය සහ තොරතුරු පිළිබඳ දැනුම සහ අවබෝධය
2. මාධ්‍ය පඨිත සහ තොරතුරු මූලාශ්‍ර ඇගැයීම (කවුරුන් විසින් නිර්මාණය කරන ලද්දේ ද, කා සඳහා නිර්මාණය කරන ලද්දේ ද, පණිවුඩය කුමක් ද පිළිබඳ අවධානය යොමු කරමින්)
3. මාධ්‍ය සහ තොරතුරු නිෂ්පාදනය සහ භාවිතය

පාසල් පුස්තකාලයාධිපතීන් මාධ්‍ය සහ තොරතුරු කුසලතා ඉගැන්වීම් සඳහා විධිමත් රාමුවක් පැවතීමේ වැදගත්කම පිළිගන්නා අතර ඔවුහු ගුරුවරුන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම හරහා සිසුන්ගේ කුසලතා ඉහළ නැංවීමට දායක වෙති. මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතා විෂයමාලාවක් මත පදනම් වූ උපදේශාත්මක වැඩසටහනක අභිමතාර්ථය වන්නේ සමාජයෙහි වගකිව යුතු සහ සදාචාරාත්මක සහභාගිවනන් ලෙස සිසුන් සංවර්ධනය කිරීමය. තොරතුරු සාක්ෂරතාවෙන් යුත් සිසුන් නිපුණ ස්වයං මෙහෙයුමෙන් යුත් ඉගෙනුම්කරුවන් විය යුතුය. ඔවුන් තමන්ගේ තොරතුරු අවශ්‍යතා පිළිබඳ දැනුවත් විය යුතු අතර අදහස් ලෝකය තුළ සක්‍රීයව දායක විය යුතුය. ඔවුන් ගැටලු විසඳීම සඳහා වන ස්වකීය හැකියාව තුළ විශ්වාසය විදහා දැක්විය යුතු අතර අදාළ සහ විශ්වසනීය තොරතුරු සොයා ගන්නා ආකාරය දැන ගත යුතුය. තොරතුරු වෙත ප්‍රවේශ වීමටත් තමන් ඉගෙන ගත් දෑ සන්නිවේදනය කිරීමටත් තාක්ෂණය කළමනාකරණය කිරීමට ඔවුනට හැකි විය යුතුය. බහුවිධ පිළිතුරු ඇති සහ පිළිතුරු නොමැති අවස්ථාවල දී පහසුවෙන් ක්‍රියා කිරීමට ඔවුනට හැකි විය යුතුය. ඔවුන් ස්වකීය කාර්ය සඳහා උසස් ප්‍රමිති පවත්වා ගෙන යා යුතු අතර ගුණාත්මක නිෂ්පාදන නිර්මාණය කිරීම අවශ්‍යය. තොරතුරු සාක්ෂරතාවෙන් යුත් සිසුන් නම්‍යශීලී විය යුතු අතර වෙනසට අනුගත වීමටත් තනිව මෙන්ම කණ්ඩායමක් තුළ ක්‍රියා කිරීමටත් ඔවුනට හැකි විය යුතු වේ.

**නිදසුන**

ප්‍රංශයේ සිසුන්ට අන්තර්ජාලයේ වගකීමෙන් යුත් භාවිතය පිළිබඳ පුහුණුවක් ලබා දෙයි.

**නිදසුන**

ප්‍රංශයේ පාසල් පුස්තකාලයාධිපතීන් සඳහා ඇති පුහුණුව මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවට දිශාභිමුඛ වූ පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රමිත ලකුණුවලට සම්බන්ධ වේ.

## 5.5 විමසුම් පාදක ඉගෙනුම් ආදර්ශන

බොහෝ රටවල් ප්‍රාදේශීය අධිකාරීන් සහ පාසල් පුස්තකාල විමසුම් ව්‍යාපෘති සන්දර්භය තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂර කුසලතා සංවර්ධනය කරන උපදේශකත්ව සැලසුම් සඳහා ඉතා සාර්ථක ආදර්ශන ක්‍රියාත්මක කර ඇත. විමසුම් පාදක ඉගෙනුම සඳහා ආදර්ශන නිර්මාණය කිරීමට වසර ගණනාවක පර්යේෂණ සහ ප්‍රායෝගික අත්හදාබැලීම් අවශ්‍ය වේ. ස්වකීය අධ්‍යාපන බලධාරීන් විසින් ආදර්ශනයක් නිර්දේශ කර නොමැති පාසල් තමන්ගේම ආදර්ශන සංවර්ධනය කිරීමට ප්‍රයත්න ගැනීමට වඩා ඔවුන්ගේ විෂයමාලාවේ අභිමතාර්ථ සහ ඉගෙනුම සමඟ වඩාත් සමීපව

පෙළ ගැසෙන ආදර්ශනයක් තෝරා ගත යුතුය. විමසුම් පාදක ඉගෙනුම් සඳහා උපදේශාත්මක ආදර්ශනවල නිදසුන් C ඇමුණුමේ දැක්වේ.

විමසුම් පාදක ඉගෙනුම සඳහා ඇති උපදේශාත්මක ආදර්ශන අන්තර්ගත ක්ෂේත්‍ර හරහා මෙන්ම අධ්‍යයන පරිසරයේ සිට සැබෑ ජීවිතය දක්වා මාරු කළ හැකි ඉගෙනුම් ක්‍රියාවලියක් සිසුන්ට සැපයීමට ක්‍රියාවලි එළඹුමක් භාවිත කරයි. මෙම ආදර්ශන වැදගත් සංකල්ප කීපයක් බෙදාහදා ගනී.

- ★ සිසුවා තොරතුරුවලින් අර්ථ ගොඩනංවයි.
- ★ සිසුවා ක්‍රියාවලි එළඹුමක් හරහා ගුණාත්මක නිෂ්පාදනයක් නිර්මාණය කරයි.
- ★ සිසුවා ස්වාධීනව (ස්වයං දිශාභිමුඛව) සහ කණ්ඩායමක සාමාජිකයෙක් ලෙස වැඩ කරන ආකාරය ඉගෙන ගනී.
- ★ සිසුවා තොරතුරු සහ තොරතුරු තාක්ෂණය වගකිවයුතු ලෙස සහ සදාචාරාත්මක ලෙස භාවිත කරයි.

විමසුම් පාදක ඉගෙනුම සඳහා වන උපදේශාත්මක ආදර්ශන අත්‍යවශ්‍ය විමසුම් සහ යාවජීව ඉගෙනුම් කුසලතා සමඟ බැඳී පවතී. එනම්, සැලසුම්කරණය, ස්ථානගත වීම් සහ එක්රැස් කිරීම, තේරීම සහ සංවිධානය පිරිසැකසීම, නියෝජනය සහ බෙදා හදා ගැනීම සහ ඇගැයීම වේ. එමෙන්ම ක්‍රියාවලි පාදක උපදේශාත්මක ආදර්ශන ස්වයං දිශාභිමුඛ ඉගෙනුම් කුසලතා (උදා - අධිප්‍රජානන) සහ සහයෝගීත්ව කුසලතා ඉහළ නංවයි. මෙම කුසලතා විෂයමාලාවෙන් සකසන මාතෘකා සහ ගැටලු සමඟ විෂය සන්දර්භයක් තුළ ප්‍රගතිගාමී ලෙස හොඳින්ම සංවර්ධනය වේ.

ඕනෑම පර්යේෂණ කාර්යයක්, පැවැරුමක්, ව්‍යාපෘතියක්, රචනයක් හෝ මාතෘකාවක් සඳහා සැලසුම්කරණ කුසලතා අත්‍යවශ්‍ය වේ. විමසුමක ආරම්භක ආදියරවල දී සුදුසු ප්‍රශ්න සැකසීම, සම්පත් සහ තොරතුරු ගවේෂණ උපායමාර්ග අනුමාන වශයෙන් හඳුනා ගැනීම සහ සාධාරණ කාල රාමුවක් ගොඩනැංවීම සැලසුම්කරණ ක්‍රියාකාරකම්වලට ඇතුළත් වේ. පුරෝකථනය කළ නොහැකි අභියෝග සහ බාධාවන්ට ප්‍රතිචාර දැක්වීමේ දී විමසුම් ක්‍රියාවලිය පුරා සිසුන් ඔවුන්ගේ සැලසුම් සංශෝධනය කරනු ඇත.

ස්ථානගත වීමේ සහ එක්රැස් කිරීමේ කුසලතා තොරතුරු සෙවීමේ කාර්යයට මූලික වේ. අකාරාදී සහ සංඛ්‍යාත්මක රටා වටහා ගැනීම, පරිගණක දත්ත පදනම් සහ අන්තර්ජාලයෙන් තොරතුරු සෙවීම සඳහා වෙනත් ආකාරයේ උපායමාර්ග භාවිත කිරීම, සහ අනුක්‍රමණිකා සහ විමර්ශන මූලාශ්‍ර භාවිතය මෙම කුසලතාවන්ට ඇතුළත් වේ. මූලාශ්‍ර අධ්‍යයනයට අමතරව තොරතුරු ජනනය කිරීමට සමීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, සම්පරීක්ෂණ සහ නිරීක්ෂණ වැනි ක්‍රමවේද අන්තර්ගත වේ.

තෝරා ගැනීමේ සහ සංවිධානය කිරීමේ කුසලතාවලට විචාරාත්මක සහ ඇගැයීමේ චින්තනයක් අවශ්‍ය වේ. විමසුමෙහි අවධානයට අදාළ සහ වැදගත් වන තොරතුරු සෙවීම තේරීම් කුසලතා සමඟ බැඳී පවතී. සාධිකාරී බව, සම්පූර්ණත්වය, කාලීනත්වය, නිරවද්‍යභාවය සහ දෘෂ්ටිකෝණය වැනි ව්‍යවහාර කිරීමේ නිර්ණායක සොයා ගන්නා ලද තොරතුරු පිළිබඳ දැනුවත් සහ සදාචාරාත්මක තීරණ ගැනීමට සිසුන්ට සහාය වේ.

විවිධ මූලාශ්‍ර වෙතින් තොරතුරු සමෝධානය කිරීම, අනුමාන සැකසීම, නිගමනවලට එළඹීම සහ පූර්ව දැනුමට සබඳතා ගොඩනැංවීම වැනි කුසලතා භාවිත කරමින් අර්ථ ගොඩනැංවීම තොරතුරු පිරිසැකසීමට අයත් වේ. මෙම කුසලතා හරහා සිසුන් තමන් එක්රැස් කළ තොරතුරු පිළිබඳ

අවබෝධය සහ එක්රැස් කළ තොරතුරු පෞද්ගලික දැනුම බවට පරිවර්තනය කිරීම සංවර්ධනය කර ගනී.

අදහස් පැහැදිලිව සන්නිවේදනය කරන ස්ථාපිත ඉලක්ක සහ නිර්ණායක පිළිබිඹු කරන සහ ප්‍රේක්ෂකයන් පිළිබඳ දැනුවත්භාවය ඇතුළු ඵලදායී ඉදිරිපත් කිරීම් කුසලතා විදහා දක්වන ගුණාත්මක නිෂ්පාදන නිර්මාණය කිරීම නියෝජනය සහ බෙදාහදා ගැනීමට ඇතුළත් වේ.

විමසුම් ක්‍රියාවලිය සහ නිමවුම යන දෙකම තක්සේරු කිරීම ඇගැයීම් කුසලතාවලට අයත් වේ. සිසුන් ඔවුන්ගේ ප්‍රයත්න සහ ඔවුන් සපුරා ගත් දේ පිළිබඳ විචාරාත්මක වීමට හැකියාව ලබා ගැනීම අවශ්‍යය. මුල් සැලැස්මට ඔවුන්ගේ අවසන් නිමවුම සම්බන්ධ කිරීමටත් නිමවුම එහි අභිප්‍රාය සපුරා ගෙන ඇත්දැයි නිශ්චය කිරීමටත් ඉගෙනුම් ව්‍යාපෘතියේ ප්‍රබලතා සහ දුබලතා වෙන් කර ගැනීමටත් අනාගත පැවරුම් සඳහා වන වර්ධනයන් සහ අනුමිතීන් පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය කිරීමටත් ඔවුනට හැකි විය යුතුය.

ස්වයං දිශාභිමුඛ ඉගෙනුම් කුසලතා යාවජීව ඉගෙනුම්කරුවන්ගේ සංවර්ධනයේ දී තීරණාත්මක වේ. ස්වකීය සිතීමේ සහ ඉගෙනීමේ ක්‍රියාවලිය (උදා - අධිප්‍රජානනය) පිළිබඳ  සිතීමටත් ඉගෙනුම් අභිමතාර්ථ ස්ථාපිත කිරිමට සහ ඒවා සපුරා ගැනීම වෙතට ඇති ප්‍රගතිය කළමනාකරණය කිරීමට ස්වයං දැනුම භාවිත කිරීමටත් විමසුම පුරා සිසුන්ට මඟ පෙන්විය යුතුය. ස්වයං දිශාභිමුඛ ඉගෙනුම්කරුවන්ට තොරතුරු සහ පුද්ගල අවශ්‍යතා සඳහා මාධ්‍ය සම්පත් භාවිත කිරීමටත් ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමටත් විකල්ප පර්යාලෝකයන් සලකා බැලීමටත් වෙනත් දෘෂ්ටිකෝණ ඇගැයීමටත් හැකි විය යුතුය. ඔවුන් තොරතුරු, තොරතුරු සම්පත් සහ පුස්තකාල සංවිධානමය සහ ව්‍යුහමය වශයෙන් සංකීර්ණ බව හඳුනා ගන්නා අතර අවශ්‍ය වූ විට සහාය සඳහා විමසීමට ඔවුනට හැකියාව ඇත.

සිසුන් විවිධත්වයෙන් යුත් පුද්ගලයන් සහ විවිධ සම්පත් හා තාක්ෂණය සමඟ කණ්ඩායම් තුළ එක්ව කටයුතු කරන විට සහයෝගිත්ව කුසලතා සංවර්ධනය කර ගනී. ආකල්ප වෙනුවෙන් පෙනී සිටින ආකාරය මෙන්ම සංවර්ධනාත්මකව ආකල්ප විවේචනය කරන ආකාරය සිසුන් ඉගෙන ගනී. ඔවුන් විවිධත්වයෙන් යුත් අදහස් පිළිගන්නා අතර අන්‍යයන්ගේ පසුබිම් සහ ඉගෙනුම් ශෛලීන්ට ගරු කිරීම විදහා පෙන්වයි. ඔවුහු පුද්ගලයන් අතර වෙනස්කම් පිළිබිඹු කරන ව්‍යාපෘති නිර්මාණය කිරීමට එක්ව කටයුතු කරන අතර අවසන් නිමවුමක් වෙතට පුද්ගල කාර්යයන් සංස්ලේෂණය කිරීමට දායක වෙති.

විමසුම් පාදක ඉගෙනුම සඳහා වන ක්‍රියාවලි එළඹුම තොරතුරු සොයා ගැනීම ඉක්මවා තොරතුරු භාවිතය දක්වාත් නියත ප්‍රශ්නයකට පිළිතුරු දීම ඉක්මවා මාතෘකාවක් හැඩ ගැන්වීමට සාධක සෙවීම දක්වාත් දිවේ. එය තොරතුරු ගවේෂණ ක්‍රියාවලිය මෙන්ම ගවේෂණයේ නිමවුම ද සැලකිල්ලට ගනී. එය තොරතුරුවලින් ඉගෙනීමේ සංකීර්ණතාව පිළිබඳ දැනුවත්භාවයක් වෙනුවෙන් ආමන්ත්‍රණය කරයි. තොරතුරුවලින් ඉගෙනීම හුරුපුරුදු රටාවක් හෝ ප්‍රමිත කාර්යයක් නොවේ. එමෙන්ම එයට ආවේදන මෙන්ම ප්‍රජානන ක්ෂේත්‍ර ද සම්බන්ධ වේ.

විමසුම් පාදක ඉගෙනුමට ක්‍රියාවලි එළඹුමක් භාවිත කිරීමට තීරණය කිරීමේ දී පාසල් පුස්තකාලයේ ප්‍රමාණය සහ එහි එකතුවේ සහ තාක්ෂණයේ ස්වභාවය පිළිබඳ තැකීමකින් තොරව පාසල් පුස්තකාලයාධිපතීන් සහ ගුරුවරුන් සමාන මූලික ගැටලුවකට මුහුණ දෙයි. එනම්, කුතුහලය සහ ඉගෙනුම පිළිබඳ ඇල්ම දිරිමත් කරන අනාවරණ ක්‍රියාවලියක් භාවිත කරමින් ඉගෙනුම හඹා

යාම ශක්තිමත් මෙන්ම අනුස්ථාපනය සහ උත්තේජනය කරනුයේ කෙසේ ද යන්නය. අනාවරණය සහ පුද්ගල වර්ධනය අත්දැකීමට සිසුන් වෙනුවෙන් ඇති අවස්ථාවක් ලෙස විමසුම් පාදක ඉගෙනුමේ දැක්මකට ක්‍රියාවලි පාදක ආදර්ශන සහාය වේ. ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ විට ගවේෂණය හා අවදානම් දැරීම මඟින් ද කුතුහලය සහ උත්තේජනය මඟින් ද විචාරාත්මක හා නිර්මාණාත්මක චින්තනයේ නිරත වීම මඟින් ද සැබෑ ජීවිත තත්ත්වයන් හා සැබෑ ප්‍රේක්ෂකයන් සමඟ සම්බන්ධ වීම මඟින් ද විමසුම හරහා සිසු ඉගෙනුම මූර්තිමත් වේ.

ක්‍රියාවලි පාදක ආදර්ශන, න්‍යාය මත පාදනම් වී ඇති අතර අධ්‍යාපන සහ පුස්තකාල හා තොරතුරු අධ්‍යයන ක්ෂේත්‍රවල පර්යේෂණවලින් ව්‍යාප්ත වී ඇත. අධ්‍යාපනය විෂයෙන් ඉගෙනුම් න්‍යායත් පුස්තකාල හා තොරතුරු විෂයෙන් තොරතුරු ගවේෂණ චර්යා න්‍යායන් පැමිණේ. නිදසුනක් ලෙස, ඉගෙනුම්කරුවන්ගේ ප්‍රජානන සංවර්ධනය පූර්ව දැනුම සහ අත්දැකීම මත රඳා පවතින අතර ඔවුනට හැසිරවිය හැකි වියුක්ත මට්ටම් තුළ විවිධත්වයෙන් යුක්ත වේ යන දැනුම පැමිණෙනුයේ අධ්‍යාපනය වෙතිනි. ඉගෙනුම්කරුවන් තමන්ගේ දැනුම සක්‍රීයව ගොඩනැංවීම පිළිබඳව සහ ඔවුන් තොරතුරු භාවිත කරන විට හැඟීම්වල මෙන්ම සිතිවිලිවල වෙනස්කම් අත්දැකීම පිළිබඳව උත්පාදන සංකල්ප පැමිණෙනුයේ ද අධ්‍යාපනය වෙතිනි. ප්‍රශ්නයේ නියතභාවයෙහි මට්ටම් හරහා තොරතුරු භාවිත කරන්නන් ප්‍රගතිය අත් කර ගන්නා බවත්, තොරතුරු පිළිබඳ විසිරුණු අදහස්වල සිට පැහැදිලිව නිර්වචනය කරන ලද අවශ්‍යතා සහ ප්‍රශ්න දක්වා යොමු වන බවත් සහ තොරතුරු පද්ධති සහ තොරතුරු ගැටලුව පිළිබඳ යථාර්ථවාදී අවබෝධයක් ඔවුනට ඇත්නම් පාඨකයන් ගවේෂණ ක්‍රියාවලියේ දී වඩාත් සාර්ථක වන බවත් යන දැනුම පුස්තකාල හා තොරතුරු විද්‍යාව වෙතින් පැමිණේ.

පාසලේ අනෙකුත් ඉගෙනුම් වැඩසටහන් මෙන් විමසුම් පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම් සිසු ඉගෙනුමෙහි අඛණ්ඩත්වය සහ ප්‍රගතිය ප්‍රවර්ධනය සඳහා සැලසුම් කළ යුතුය. මෙයින් අදහස් වන්නේ මෙම කුසලතා අවධි සහ මට්ටම් හරහා ප්‍රගතිගාමී ලෙස හඳුන්වා දිය යුතු බවය. මාධ්‍ය හා තොරතුරු කුසලතා සහ උපායමාර්ගවල පාසල් පාදක අඛණ්ඩත්වයක් මඟින් මඟ පෙන්වන ලද විමසුම් ක්‍රියාවලියක් ඉගැන්වීමට විධිමත් එළඹුමක් සහතික කිරීමේ දී පාසල් පුස්තකාලයාධිපති නායකත්ව භූමිකාව ගත යුතුය.

විමසුම් පාදක ඉගැන්වීම් සහ ඉගෙනුම සඳහා ප්‍රාදේශීයව සහ ජාතික වශයෙන් සංවර්ධිත ආදර්ශන නොමැති ස්ථානවල ආදර්ශනයක් තෝරා ගැනීම සඳහා පාසල් පුස්තකාලයාධිපති පන්තිකාමර ගුරුවරුන් හා පාසල් නායකයන් සමඟ වැඩකටයුතු කළ යුතුය. ගුරුවරුන් සහ සිසුන් මෙම ආදර්ශනය ව්‍යවහාර කරන විට ඔවුන් පාසල් අභිමතාර්ථවලට සහ ප්‍රාදේශීය අවශ්‍යතාවලට එය අනුගත කිරීම අපේක්ෂා කළ හැකිය. කෙසේ වෙතත්, ඕනෑම ආදර්ශනයක් අනුගත කිරීමේ දී ප්‍රවේසම්සහගත විය යුතුය. මෙම ආදර්ශනයේ න්‍යායාත්මක පදනම පිළිබඳ ගැඹුරු අවබෝධයකින් තොරව කරනු ලබන අනුගත කිරීම් එහි බලය ඉවතලනු ඇත.

### නිදසුන

ස්වීඩනයේ උප්සාලාහි ද්විතීයික පාසල් සිසුන් ඔවුන්ගේ විමසුම් පාදක ව්‍යාපෘති ආරම්භ කරනුයේ නිශේධනාත්මක නවකතාවක් කියවීම මඟිනි. නවකතාව කියවීම් කණ්ඩායම තුළ සාකච්ඡා කෙරේ. සිසුහු සැකකරුවකු නිරීක්ෂණය, ගෝලීය උණුසුම හෝ රෝග වැනි විෂයන් පිළිබඳ ස්වකීය කේවල

විමසුම් වෙත අවධානය යොමු කරති. එමෙන්ම ඉතාමත් නියත කේවල විමසුම් අවධානයක් සැකසීමට පළමුව පුළුල්ව ද අනතුරුව ගැඹුරින් ද තොරතුරු ගවේෂණය කරති. (උදා - සැකකරුවකු නිරීක්ෂණය පිළිබඳ සියලු තොරතුරුවල සිට රජයට ජනතාවගේ ස්මාර්ට් දුරකථනවලින් ඔවුන් අධීක්ෂණය කළ හැකි ආකාරය වැනි ඉතාමත් ස්ථාවර විමසුමක් දක්වා) ව්‍යාපෘතියේ අවසන් නිමවුම වන්නේ සෑම සිසුවකු විසින්ම එක්රැස් කරන ලද සහ කාර්යසාධන ගොනුවට ඇතුළත් කරන ලද ද්‍රව්‍ය භාවිත කරමින් විභාගයක් ලෙස රචිත රචනාවකි.

## 5.6 තාක්ෂණ සමෝධානය

තාක්ෂණික යටිතල පහසුකම් සහ මෙවලම් සැපයීමේ දී සහ තොරතුරු තාක්ෂණය භාවිතයට උපදෙස් දීමේ දී පාසල් පුස්තකාලයේ භූමිකාවෙහි වැදගත්කම පාසල් පුස්තකාල පර්යේෂණ මගින් පෙන්වා දී ඇත. පුස්තකාලය සහ එහි සම්පත් පන්තිකාමරය වෙතට සහ ඉන් ඔබ්බට ව්‍යාප්ත වීමට තාක්ෂණය සහාය වේ. අන්තර්ජාලයේ මෙන්ම දත්ත පදනම්වල සහ නිෂ්පාදන මෙවලම්වල ඇතුළත් සම්පත් භාවිතය සඳහා මාර්ගගත සෙවුම් උපායමාර්ග භාවිතය ඉගෙන ගැනීමට පාසල් පුස්තකාලයාධිපතීන් සිසුන්ට සහාය වේ. තනතුරු දෙකක් පවතින විට එම තනතුරු දෙකෙහි පැහැදිලිව නිර්වචනය කරන ලද භූමිකාවන් සහතික කිරීමටත් පාසලේ තාක්ෂණික සේවාවන් සහ ගුරුවරුන් හා සිසුන් සඳහා සපයන ලද වැඩසටහන් තුළ පරතරයන් හෝ අතිරික්තයන් නොමැති බව සහතික කිරීමටත් පාසල් පුස්තකාලයාධිපතීහු පාසලේ තාක්ෂණික විශේෂඥයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරති.

## 5.7 ගුරුවරුන් සඳහා වෘත්තීය සංවර්ධනය

පාසල් පුස්තකාල, විශේෂයෙන් නව ද්‍රව්‍ය හා තාක්ෂණයන්, නව විෂමාලා සහ නව උපදේශාත්මක උපායමාර්ගවලට සම්බන්ධව ගුරුවරුන් වෙත වෘත්තීය සංවර්ධනය සැපයීම හරහා ගුරුවරුන්ට සහාය වේ. පාසල් පුස්තකාලයාධිපති විවිධ ආකාරවලින් ගුරු සම්පදස්ථයන් සමඟ, ඉගෙනුමේ දී හවුල්කරුවකු ලෙස කටයුතු කිරීම හරහා බොහෝ විට අවිධිමත් වෘත්තීය සංවර්ධනයක් සපයයි.

- ★ ගුරුවරුන්ගේ විෂය දැනුම පුළුල් කරන සහ ඔවුන්ගේ ඉගැන්වීම් ක්‍රමවේද දියුණු කරන සම්පත් ගුරුවරුන්ට සැපයීම
- ★ වෙනත් ඇගැයීම් සහ තක්සේරු උපායමාර්ග සඳහා සම්පත් සැපයීම
- ★ පන්තිකාමරයේ සහ/ හෝ පුස්තකාලයේ කළ හැකි කාර්යයන් සැලසුම් කිරීමේ දී හවුල්කරුවකු ලෙස කටයුතු කිරීම

★ අන්තර්පුස්තකාල පිරුළු මෙන්ම පුද්ගල හා ඩිජිටල් ජාල හරහා පුළුල් සම්පත් ප්‍රමාණයක් වෙත ප්‍රවේශ ලක්ෂ්‍යයක් ලෙස පුස්තකාලය භාවිත කිරීම

## 5.8 පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ උපදේශාත්මක භූමිකාව

සුදුසුකම්ලත් පාසල් පුස්තකාලයාධිපතිවරයකු සිසුන් සඳහා උපරිම ඉගෙනුම් අත්දැකීම් සැපයීමට ගුරු සමපදස්ථයන් සමග එකගත්වයෙන් කටයුතු කරයි. පාසල් පුස්තකාලයාධිපතිවරයෙක් අනෙකුත් ගුරුවරුන් සමඟ එක්ව ඉගැන්වීමේ යෙදීම පරමාදර්ශී තත්ත්වය වේ. එමෙන්ම ඉගැන්වීම් සහ ඉගෙනීම් ක්‍රියාකාරකම් කණ්ඩායමේ සෑම සාමාජිකයෙක්ම, ඉගැන්වීමට සහ ක්‍රියාත්මක කිරීමට ඔවුන්ගේ විශේෂඥතාවේ වෙනස් ක්ෂේත්‍රවලින් දායක වේ.

පාසල් පුස්තකාලයාධිපතීන් සහ පන්තිකාමර ගුරුවරුන්ට උපදේශකයන් ලෙස සහයෝගයෙන් කටයුතු කළ හැකි සහයෝගිත්ව ඉගැන්විම සඳහා වන සිව්වැදෑරුම් එළඹුම් පහත දැක්වේ. එනම්, උපකාරාත්මක, සමාන්තර, අතිරේකමය සහ කණ්ඩායම් ඉගැන්වීම් වේ.

1) උපකාරත්මක ඉගැන්වීම් - මෙහිදී එක් උපදේශකයෙකු ප්‍රධාන උපදේශක භූමිකාව ගන්නා අතර අනෙක් උපදේශකයා අවශ්‍ය විට තනි තනිව සෑම ඉගෙනුම්කරුවකු වෙතම යොමු වේ.
2) සමාන්තර ඉගැන්වීම - පන්තිකාමරයේ හෝ පුස්තකාලයේ වෙනත් කොටස් තුළ උපදේශකයන් දෙදෙනෙකු හෝ වැඩි ප්‍රමාණයක් ඉගෙනුම්කරුවන්ගේ වෙනත් කණ්ඩායම් සමඟ කටයුතු කිරීම. මෙය ස්ථානීය ඉගැන්වීම ලෙස ද හඳුන්වයි.
3) අතිරේකමය ඉගැන්වීම - එක් උපදේශකයෙකු යමක් වැඩි දියුණු කිරීමට යමක් කිරීම. නිදසුනක් ලෙස, එක් උපදේශකයෙකුට අනෙකාගේ ප්‍රකාශ හෝ ආදර්ශ සටහන් ගැනීමේ කුසලතා පැහැදිලි කළ හැකිය.
4) කණ්ඩායම් ඉගැන්වීම් - උපදේශකයන් දෙදෙනෙකු හෝ වැඩි ප්‍රමාණයක් පන්තිකාමරයේ දී හෝ පුස්තකාලයේ දී සැලසුම් කිරීම, ඉගැන්වීම, තක්සේරු කිරීම සහ සියලු සිසුන් සඳහා වගකීම ගැනීම සිදු කරයි.

සම ඉගැන්වීම වෙතට ඇති මෙම සෑම එළඹුමක්ම සහයෝගී සැලසුම්කරණය හරහා උපදේශකත්වයේ අන්තර්ගතය, බෙදාහැරීම සහ ඇගැයීම වෙතට සම්බන්ධිත සම උපදේශකවරුන් විසින් වැඩි දියුණු කරනු ලබයි. ඇතැම් තත්ත්වයන් තුළ පුස්තකාලයේ හෝ පන්තිකාමරයේ දී සිසුන් සඳහා එකම උපදේශකයා බවට පාසල් පුස්තකාලයාධිපති පත් වන විට පාසල් පුස්තකාලයාධිපති සහ පන්තිකාමර ගුරුවරයා/ ගුරුවරුන් අතර සහයෝගිත්ව සැලසුම්කරණය උපදේශකත්වයේ ගුණාත්මක බව ඉහළ නංවයි. විෂයමාලාවට සමෝධානිත සහ සිසුන්ගේ රුචිකත්වයන් හා අවශ්‍යතා සමඟ සම්බන්ධ වන මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා උපදෙස් දීම සඳහා සහයෝගීතාව අත්‍යවශ්‍ය වේ.

## ප්‍රයෝජනවත් මූලාශ්‍ර

Asselin, M., & Doiron, R. (2013). *Linking literacy and libraries in global communities*. London: Ashgate.

Gordon, C., & Lu, Y-L. (2008). "I hate to read—Or do I?": Low achievers and their reading. *School Library Research, 11*. Retrieved from www.ala.org/aasl/slmr/volume11/gordon-lu

Hughes-Hassell, S., Barkley, H. A., & Koehler, E. (2009). Promoting equity in children's literacy instruction: Using a critical race theory framework to examine transitional books. *School Library Research, 12*. Retrieved from www.ala.org/aasl/slmr/volume12/hughes-hassell-barkley-koehler

Krashen, S. D. (2004). *The power of reading: Insights from the research* (2nd ed.). Westport, CT: Libraries Unlimited.

Kuhlthau, C.C. (2004). *Seeking meaning: A process approach to library and information service* (2nd ed.). Westport, CT: Libraries Unlimited.

Markless, S. (Ed.). (2009). *The innovative school librarian: Thinking outside the box*. London: Facet Publishing. [See Chapters 7, pp.127-142 Becoming integral to teaching and learning.]

Eduscol [Ministry of Education, France]. (2012). *Vademecum vers des centres de connaissances et du culture* [Short guide to knowledge centres and culture]. Retrieved from http://eduscol.education.fr/cid60332/-vers-des-centres-de-connaissances-et-de-culture-le-vade-mecum.html

Trelease, J. (2013). *The readaloud handbook* (7th ed.). New York: Penguin Books.

Villa, R. A., Thousand, J. S., & Nevin, A. I. (2008). *A guide to co-teaching: Practical tips for facilitating student learning* (2nd ed.). Thousand Oaks, CA: Corwin Press/Council for Exceptional Children.

# 06 පරිච්ඡේදය

## පාසල් පුස්තකාල ඇගැයීම සහ මහජන සබඳතා

*"සාක්ෂරතාව, අධ්‍යාපනය, තොරතුරු සැපයීම මෙන්ම ආර්ථික, සමාජීය සහ සංස්කෘතික සංවර්ධනය සඳහා වන සෑම දිගුකාලීන උපායමාර්ගයකටම පාසල් පුස්තකාලය අත්‍යවශ්‍ය වේ."*

පාසල් පුස්තකාල ප්‍රඥප්තිය

### 6.1 හැඳින්වීම

වෘත්තීය පාසල් පුස්තකාලයාධිපතීන්ගෙන් සමන්විත, සම්පත්වලින් පරිපූර්ණ පාසල් පුස්තකාලවල ශිෂ්‍ය සාධනය පිළිබඳ ධනාත්මක බලපෑමට සම්බන්ධ පර්යේෂණ රාශියක් තිබේ. නිදසුනක් ලෙස, එක්සත් ජනපදයේ LRS (2015) මෙන්ම එක්සත් රාජධානියේ විලියම්, වවෙල්.ඩී.සහ මොරිසන් (2013) සිදු කර ඇති පාසල් පුස්තකාල බලපෑම් අධ්‍යයන බලන්න. කෙසේ වෙතත්, මෙම පර්යේෂණ ගැන පාසල් පුස්තකාල ප්‍රජාවෙන් ඔබ්බෙහි එතරම් ප්‍රසිද්ධියක් හෝ අවබෝධයක් නොමැති අතර ලෝකයේ බොහෝ කලාපවල පාසල් පුස්තකාල වියදම් කපා හැරීමේ අභියෝගයට අඛණ්ඩව මුහුණ දෙයි. මෙම වියදම් කපා හැරීම නිසා බොහෝවිට හට ගන්නා ප්‍රතිඵලයක් වන්නේ පාසල් පුස්තකාලවලට වෘත්තීය කාර්යමණ්ඩල අහිමි වීමය. සුදුසුකම්ලත් පාසල් පුස්තකාලයාධිපතීන්ගෙන් තොරව අධ්‍යාපනික වර්ධනය සහ සිසු සාධනය සඳහා වන බලවේගයක් ලෙස පාසල් පුස්තකාලයේ විභවය ඊට අහිමි වේ.

පසුගිය වසර දහයක පමණ සිට පාසල් පුස්තකාලවල බලපෑම පිළිබඳ අධ්‍යයනයන්ගේ ප්‍රතිඵල අඛණ්ඩව තහවුරු කරනුයේ ශිෂ්‍ය සාධනය වෙත ප්‍රබලම බලපෑම සහතිකලත්/සුදුසුකම්ලත් පූර්ණකාලීන පාසල් පුස්තකාලයාධිපතීන් සහිත පාසල් පුස්තකාල වැඩසටහන් වෙතින් පැමිණෙන බවය. සිසු ඉගෙනුම වෙත පාසල් පුස්තකාලයේ ධනාත්මක බලපෑම පිළිබඳ සොයා ගැනීම්වලට දිළිඳු, සුළුතර, සහ/ හෝ ආබාධිත සිසුන් සඳහා පොදුවේ දකින පරතරයන් පියවීමට සහාය වීම ඇතුළත් වේ. සහතිකලත් / සුදුසුකම්ලත් පූර්ණකාලීන පාසල් පුස්තකාලයාධිපතිවරයකු සිටීමට අමතරව වර්ධිත සිසු සාධනය සමඟ සහසම්බන්ධ වූ වෙනත් පාසල් පුස්තකාල සාධක ද තිබේ. ඒවා නම්, සහයෝගිතාව, උපදේශකත්වය, කාර්ය සටහන් කිරීම, ප්‍රවේශය, තාක්ෂණය, එකතුන්, අයවැය සහ වෘත්තීය සංවර්ධනය වේ. සම්පත්වලින් පරිපූර්ණ පාසල් පුස්තකාල මේ වන විට ගුරුවරුන් සහ සිසුන් වෙත ඕනෑම අවස්ථාවක දී මාර්ගගත සම්පත් හා සේවාවලට ප්‍රවේශය සපයන හෙයින් ඩිජිටල් හැකියාවන් විසින් අවකාශයට, කාලයට සහ භාවිතයට බලපෑම් කරන ලද ආකාරය ඇගැයීමට, අනාගත පර්යේෂණ අවශ්‍ය වනු ඇත.

ඇගැයීම, පාසල් පුස්තකාල වැඩසටහන් හා සේවා ක්‍රියාත්මක කිරීමේ අත්‍යවශ්‍ය අංගයකි. ඇගැයීමට තීරණ ගැනීම හෝ ගැටලු විසඳීම (වගවීමේ අවධාරණය) ආමන්ත්‍රණය කළ හැකිය. එමෙන්ම එයට පාසල් පුස්තකාලයක් පිළිබඳ ජනතාවගේ චින්තනයට බලපෑම් කළ හැකි අතර පාසල් පුස්තකාලය සඳහා සහාය සංවර්ධනය (පරිවර්තන අවධාරණ) කළ හැකි වේ. ඉදිරි මඟ නිශ්චය

කිරීමටත් අනාගතයේ පාසල් පුස්තකාලය සඳහා නව දැක්ම නිර්මාණයට අනුප්‍රාණය සැපයීමටත් ඇගැයීම් ක්‍රියාවලියට හැකියාව ඇත.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, පාසල් පුස්තකාල ඇගැයීම පාසලේ අධ්‍යාපනික සැලැස්මේ ඇගැයීමෙන් වෙන් කළ නොහැකිය. ඇගැයීම, සැලසුම්කරණ ක්‍රියාවලියේ කොටසක් වන අතර පාසලේ තත්ත්ව සහතික සැලැස්මේ අවියෝජනීය අංගයක් වීම අවශ්‍ය වේ.

## 6.2 පාසල් පුස්තකාල ඇගැයීම සහ සාක්ෂි පාදක ව්‍යවහාරය

පාසල් පුස්තකාල හා පාසල් පුස්තකාලයාධිපතීන් සංගත සහ විධිමත් ආකාරයකින් ඇගැයීමට ලක් කරනුයේ කලාතුරකිනි. එහෙත් පාසල් පුස්තකාලයේ වැඩසටහන් සහ සේවා පාසලේ අභිමථාර්ථවලට සහාය වන බව සහතික කිරීමට ඇගැයීම උපකාර වේ. වැඩසටහන් සහ සේවාවලින් ගුරුවරුන් සහ සිසුන් කෙතරම් දුරට ප්‍රයෝජන ලබා ඇත්දැයි පෙන්වීමට ඇගයීමට හැකියාව ඇත. එමෙන්ම පුස්තකාල කාර්යමණ්ඩලය සහ පුස්තකාල පාඨකයන් සඳහා ඇති වැඩසටහන් සහ සේවා හැඩ ගැන්වීමටත් ඒවා පිළිබඳ අවබෝධ සහ ඒවාට ඇති කැපවීම ඉහළ නැංවීමටත් සහාය වීමට ඇගැයීමට පුළුවන.

සාක්ෂි පාදක ව්‍යවහාරය අවධානය යොමු කරනුයේ ව්‍යවහාරයේ වර්ධනයෙහි අභිප්‍රාය සඳහා දත්ත එක්රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම වෙතය. සාක්ෂි පාදක ව්‍යවහාරයේ කොටසක් ලෙස පවත්වන ඇගැයීම් පොදුවේ අභිප්‍රාය වශයෙන් පටු වන අතර එය පවත්වනු ලබන්නේ පාසල් මට්ටමේ ඇගැයුම්කරුවන් විසිනි. එය ප්‍රතිඵලදායක වන්නේ ව්‍යවහාරය සඳහා වන නිර්දේශවලදීය. සාක්ෂි පාදක ව්‍යවහාරයන්ට සම්බන්ධිත අභිප්‍රායන් සඳහා එක්රැස් කළ සහ විශ්ලේෂිත දත්ත විවිධ මූලාශ්‍රවලින් පැමිණිය හැකිය. එය විමසුමට ලක් කරන ලද ව්‍යවහාරයේ අංග මත රඳා පවතී. එනම්, (පන්තිය, ශ්‍රේණිය හෝ විෂයට අනුව) මාර්ගගත සංසරණ සහ සූචිකරණ පද්ධති (OPAC) වාර්තා සහ උපදේශාත්මක රටා, (ව්‍යවහාරය තුළ සාක්ෂි, තීරණ ගැනීම සඳහා දත්ත) හෝ විවිධ සිසු ඉගෙනුම් නිමවුම් සහ සිසුන් ගුරුවරුන් සහ/හෝ දෙමාපියන් පිළිබඳ සමීක්ෂණ (ව්‍යවහාරය පිළිබඳ සාක්ෂි - පුස්තකාල මඟින් කරනු ලබන බලපෑම්වලට සහාය වන දත්ත) යනාදියයි.

## 6.3 පාසල් පුස්තකාල ඇගැයීම වෙතට එළඹුම්

පාසල් පුස්තකාලයක් ඇගැයීමට එහි පරිසරය සහ සන්දර්භය සලකා බැලීම ඇතුළත් වේ. වැඩසටහනෙහි සමස්ත ගුණාත්මකභාවය වෙත අවධානය යොමු කළ පාසල් පුස්තකාල ඇගැයීමක් පොදුවේ අභිප්‍රායමය වශයෙන් පුළුල්ය. ඒවා බාහිර විශේෂඥ ඇගැයුම්කරුවන් විසින් පවත්වනු ලබන අතර ගුණාත්මක ශ්‍රේණිගත කිරීමක් තුළ ප්‍රතිඵල අත් කර ගනී.

**(D ඇමුණුම** -පාසල් පුස්තකාල ඇගැයීම් පරීක්ෂක ලැයිස්තු නියදිය, **E** ඇමුණුම - විදුහල්පතිවරුන් සඳහා පාසල් පුස්තකාල ඇගැයීම් පරීක්ෂක ලැයිස්තුව බලන්න) පාසල් පුස්තකාලයාධිපතිවරයකු විසින් පවත්වන ලද ස්වයං අධ්‍යයනයක් බොහෝ පාසල් පුස්තකාල ඇගැයීම්වලට අයත් වේ. වැඩසටහනේ ගුණාත්මකභාවය ඇගැයීමට අමතරව පාසල් පාදක පාසල්

පුස්තකාල ඇගැයීම සඳහා වෙනත් එළඹුම් ද තිබේ. ඒවා නම් , උනන්දු වන්නන්ගේ සංජානනය, වැඩසටහන් අන්තර්ගතය සහ වැඩසටහනෙහි බලපෑම වේ. පාසල් පුස්තකාල ඇගැයීම සඳහා වන අඛණ්ඩ එළඹුමක් යනු සාක්ෂි පාදක ව්‍යවහාරයකි.

### 6.3.1. වැඩසටහනෙහි ගුණාත්මකභාවය

සමස්ත වැඩසටහනෙහි ගුණාත්මකභාවය වෙත අවධානය යොමු කරන පාසල් පුස්තකාල ඇගැයීමක් බොහෝ විට සම්පූර්ණ කිරීම වසර ගණනාවක් ගත වන ක්‍රියාකාරකම්වල විවිධත්වයකින් සමන්විත දිගුකාලීන ව්‍යාපෘතියකි. වැඩසටහනෙහි ගුණාත්මක බව ඇගැයීම සාමාන්‍යයෙන් ආරම්භ වන්නේ පාසල පිළිගැනීමේ ක්‍රියාවලියක් හෝ ප්‍රාදේශීය හෝ ජාතික ප්‍රමිති ලේඛනයක් වැනි ක්‍රියාකාරකම්වලට මඟ පෙන්වන රාමුවක් සමඟය. සවිස්තරාත්මක වැඩසටහන් ඇගැයීමක් පැවැත්විය යුත්තේ ශක්තිමත් පරිපාලන සහායක් සමඟ සහ දිස්ත්‍රික් උපදේශකයකු වැනි බාහිර විශේෂඥයකු වෙත ප්‍රවේශයක් සමඟ පමණි. කෙසේ වෙතත්, අවශ්‍ය සම්පත් සීමා කිරීම වෙතට ප්‍රවේශමෙන් සැලසුම් කළ පාර්ශ්වීය වැඩසටහන් ඇගැයීමක් පැවැත්වීමෙන් වටිනාකම මතු කර ගත හැකිය. නිදසුනක් ලෙස, පුස්තකාල පාදක උපදේශාත්මක ක්‍රියාකාරකම්වලට ගුරුවරුන් සහ සිසුන් සම්බන්ධ වී ඇති ප්‍රතිශතය තක්සේරු කිරීමට එක් වාරයක් හෝ අධ්‍යයන වර්ෂයක් පුරා එකී ක්‍රියාකාරකම්වල අභිප්‍රාය ආමන්ත්‍රණය කිරීමට ස්වයං අධ්‍යයනයකට හැකි විය හැකිය. ප්‍රමිති සමඟ සැසඳීමක්, පහසුකම් හෝ එකතුව වැනි පුස්තකාල වැඩසටහනෙහි හෝ සේවාවන්ගේ එක් අංගයකට සීමා කළ හැකිය.

### 6.3.2 උනන්දු වන්නන්ගේ සංජානනයන්

උනන්දු වන්නන්ගේ සංජානන ඇගැයීම පිළිබඳ ප්‍රබෝධජනක සහ සවිස්තරාත්මක නිදසුනක් ගණනාවක් පර්යේෂණ අධ්‍යයන මඟින් සපයනු ලබයි. ප්‍රධාන පර්යේෂණ අධ්‍යයනයක් බොහෝ පාසල්වල හෝ පාසල් දිස්ත්‍රික්කවල සම්පත් ඉක්මවා ගිය ද සරල එහෙත් ඵලදායි විකල්ප ද තිබේ. (1) දිස්ත්‍රික් තෘප්තිය පිළිබඳ සමීක්ෂණ සහ (II) පාසල් පාදක සමීක්ෂණ හෝ ප්‍රතිපෝෂණ කණ්ඩායම් එවන් උදාහරණ දෙකකි.

බොහෝ පාසල් දිස්ත්‍රික්ක හෝ අධ්‍යාපන අධිකාරීන් සතුව සිසුන්, ගුරුවරුන් සහ දෙමාපියන් විසින් සම්පූර්ණ කරන, තෘප්තිමත් බව පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක සංස්කරණයක් පවතී. මෙම සමීක්ෂණයට පුස්තකාල වැඩසටහන් හා සේවාවලට සම්බන්ධ ප්‍රශ්නයක් හෝ දෙකක් ඇතුළත් කිරීමට උත්සාහ ගැනීම බෙහෙවින් වැදගත් වේ. මෙවන් උත්සාහයන් ආරම්භයේ දී අසාර්ථක විය හැකි වුවද එවන් ප්‍රශ්නයක් සඳහා පෙළඹවීම දිස්ත්‍රික් පරිපාලන කණ්ඩායම තුළ පුස්තකාල වැඩසටහන් හා සේවා පිළිබඳ යහපත් වැටහීමක් සංවර්ධනය කිරීමට වැදගත් මඟක් විය හැකිය.

"අපගේ පුස්තකාලය හොඳ තත්ත්වයට පත් වන්නේ කුමකින් ද සහ 'එය වඩාත් හොඳ තත්ත්වයට පත් කිරීමට අප තවදුරටත් කුමක් කළ යුතුද?' වැනි ප්‍රශ්න සිසුන්ගෙන් විමසමින්, පළමු ශ්‍රේණියේ සිට පාසලේ සෑම පන්තියක්ම සමීක්ෂණය කිරීමට විදුහල්පතිගේ සහාය ලබා ගැනීමට පුස්තකාලය පිළිබඳ සිසු සංජානනය එක්රැස් කිරීමේ එළඹුමකට හැකියාව ඇත. අනතුරුව, සමීක්ෂණයෙන් ලද දත්ත විශ්ලේෂණය කර ගුරුවරුන්, සහාය කාර්යමණ්ඩලය මෙන්ම දෙමාපියන් අතර ද බෙදහදා ගත හැකිය. සෑම පන්තියකින්ම කීප දෙනෙකු වශයෙන් ශිෂ්‍ය නියෝජිතයන්ගේ රැස්වීමක් සංවිධානය

කර පාසලේ සේවා හා සම්පත් පිළිබඳ ප්‍රතිපෝෂණයක් ලබා දීමට සැලැස්වීම ද්විතීයික පාසල්වලට ගැළපෙන එළඹුමක් වේ. ප්‍රතිපෝෂණ සැසි කිහිපයකින් පසු ඔවුන්ගේ පුස්තකාලයේ අඩු වැඩි වශයෙන් ඔවුන් කැමැති දෑ හඳුනා ගැනීමටත් ඉගෙනුම්කරුවන් ලෙස තමන් වෙනුවෙන් පාසල් පුස්තකාලය වඩාත් යහපත් ස්ථානයක් බවට පත් කිරීමට ආමන්ත්‍රණය කළයුතු වෙනත් කරුණු කුමක්දැයි හඳුනා ගැනීමටත් සිසුන්ගෙන් විමසීම් කළ හැකිය. වැඩසටහන් සහ සේවා පිළිබඳ පුස්තකාලයේ ගැලපීමෙහි නියත කොටසක් ඇගැයීමට මෙම එළඹුම් දෙකම අනුගත කර ගැනීමට පුළුවන

## 6.3.3. වැඩසටහන් අන්තර්ගතය

වැඩසටහන් අන්තර්ගතය වෙත අවධානය යොමු කරන පාසල් පුස්තකාල ඇගැයීමක් අභිප්‍රායමය වශයෙන් පුළුල් හෝ පටු විය හැකි අතර එක් අවස්ථාවක දී හෝ අඛණ්ඩව හෝ සිදු කළ හැකිය. පාසල් වාරයක් හෝ වසර කීපයක් පුරා පුස්තකාල පාදක උපදේශාත්මක ක්‍රියාකාරකම් හරහා ආමන්ත්‍රණය කරන ලද ඉගෙනුම් ඵල විශ්ලේෂණය කිරීමට ස්වයං අධ්‍යයනයක් සැලසුම් කිරීමට පුළුවන. පුස්තකාල පාදක උපදේශාත්මක ක්‍රියාකාරකම් හරහා ආමන්ත්‍රණය කරන ලද ඉගෙනුම් ඵල විෂයමාලාවක හෝ කීපයක ඉගෙනුම් ඵල සමඟ සැසඳිය හැකිය.

පුස්තකාල පාදක උපදේශාත්මක ක්‍රියාකාරකම් හරහා ආමන්ත්‍රණය කළ යුතු ඉගෙනුම් ඵල කුමක් දැයි සලකා බැලීමට පන්තිකාමර ගුරුවරුන්ගේ සහ/ හෝ අංශ ප්‍රධානීන්ගේ නාභිගත කණ්ඩායමක් භාවිත කිරීම තවත් එළඹුමක් විය හැකිය. විශිෂ්ට ප්‍රතිඵල (උදා - පොහොසත් සාකච්ඡා සහ අවංක නිරීක්ෂණ) සඳහා නාභිගත කණ්ඩායම් මනාව සංවිධානය කරනුයේ සහ ඒවාට පහසුකම් සලසනුයේ පාසල් පුස්තකාලයාධිපති විසින් නොවන තෙවන පාර්ශ්වයක් විසිනි. එම තෙවන පාර්ශ්වය තවත් පාසලකින් පැමිණෙන පුස්තකාලයාධිපතීන්ගේ සමපදස්ථයකු හෝ දිස්ත්‍රික් ඉගෙනුම් උපදේශකයකු වැනි බාහිර ඇගැයුම්කරුවෙකි.

## 6.3.4 වැඩසටහනෙහි බලපෑම

පාසල් පුස්තකාලයක බලපෑම් ඇගැයීම එකතු කළ අගය පිළිබඳ සංකල්පය වෙත යොමු වේ. එමෙන්ම එය සිසු ඉගෙනුම වෙත පාසල් පුස්තකාලයේ විමසුම් ක්‍රියාකාරකම්වල දායකත්වය හඳුනා ගැනීමට සැලසුම් කළ හැකිය. තමන් ඉගෙන ගත් දෑ සිසුන්ගෙන් දැන ගැනීම වැදගත් වන්නේ මෙහිදීය. නිදසුනක් ලෙස මාතෘකාවක් පිළිබඳ ගැඹුරු අවබෝධයක් සංවර්ධනය කිරීමේ දී, විමසුම් ක්‍රියාවලිය ක්‍රියා කරන ආකාරය දැන ගැනීමේ දී සහ ඔවුන්ගේ ඉගෙනුමෙහි වැදගත්කම පිළිගැනීමේ දී විමසුම් ව්‍යාපෘති සිසුන්ට ප්‍රතිඵලදායක විය යුතුය. නිදසුනක් ලෙස, සිසුන්ගේ ඉගෙනුම වෙත විමසුම් ව්‍යාපෘති කොතෙක් දුරට බලපා තිබේදැයි අනාවරණය කිරීමට පුස්තකාල බලය ව්‍යාපෘතිය (ඔබර්ග්, 1999), එය අවසානයේ දී 1-6 ශ්‍රේණි දක්වා ප්‍රාථමික සිසුන් සම්මුඛ සාකච්ඡාවට ලක් කර මෙසේ විමසීය.

- ★ ඔබේ ව්‍යාපෘතිය ගැන මට කියන්න පුළුවන් ද - ඔබ පොත් සහ පරිගණක භාවිත කළේ කෙසේ ද? හොඳින් ක්‍රියා කළේ කුමක් ද? ගැටලු ඇති කළේ කුමක් ද?
- ★ ඔබ එය ආරම්භ කළේ කෙසේ ද? ව්‍යාපෘතිය අතරමැද ඔබ කළේ කුමක් ද? ඔබ එය අවසන් කළේ කෙසේ ද? මෙම සෑම ලක්ෂ්‍යකදීම ඔබට කවර හැඟීමක් දැණිනිද?

- ★ ඔබ ඉගෙන ගත්තේ කුමක් ද? ඔබගේ මතකයේ රැඳී තිබෙනුයේ කුමක් ද? ඔබගේ ව්‍යාපෘතිය පාසලෙන් පිටත බෙදහදා ගත්තේ ද? ඔබගේ ව්‍යාපෘති වැනි දෑ පාසලෙන් පිටත පුද්ගලයන් සිදු කරනුයේ කෙසේ ද?

පාසල් පුස්තකාල බලපෑම් මිනුම ද්විතීයික සිසුන් සඳහා භාවිත කළ හැකි මේ හා සමාන එළඹුමකි. මෙය සිසු ඉගෙනුම් බලපෑම් මිනුම හෙවත් **SLIM** යනුවෙන් ද හැඳින්වේ. (ටොඩ්, කුල්තාහු සහ හෙයින් ටෝම්, 2005) එය විමසුම් ක්‍රියාවලියේ අවස්ථා තුනක දී පහත සඳහන් ප්‍රශ්න සමඟ ප්‍රත්‍යවේක්ෂණ වාර්තා සම්පූර්ණ කරන මෙන් සිසුන්ට පවසයි.

- ★ ඔබගේ මාතෘකාව ගැන සිතීමට යම් කාලයක් ගන්න, ඒ පිළිබඳ ඔබ දන්නා දේ ලියන්න.
- ★ ඔබ මෙම මාතෘකාවට කෙතරම් රුචියක් දක්වන්නේ ද?
- ★ මෙම මාතෘකාව ගැන ඔබ කොතෙක් දුරට දන්නේ ද?
- ★ ඔබගේ පර්යේෂණ ව්‍යාපෘතිය පිළිබඳ ආපසු සිතීමේ දී ඔබට පහසුවෙන්ම කළ හැකි වූයේ කුමක් ද?
- ★ ඔබගේ පර්යේෂණ ව්‍යාපෘතිය පිළිබඳ ආපසු සිතීමේ දී ඔබට සිදු කිරීමට වඩාත් දුෂ්කර වූ කාර්ය කුමක් ද?
- ★ මෙම පර්යේෂණ ව්‍යාපෘතිය කිරීමේ දී ඔබ ඉගෙන ගත්තේ කුමක් ද? (මෙම ප්‍රශ්නය විමසනු ලබන්නේ ව්‍යාපෘතිය අවසානයේ දී පමණි.)

සම්මුඛ සාකච්ඡා, ප්‍රත්‍යවේක්ෂණ පත්‍රිකා, ඉගෙනුම් වාර්තා සටහන් හෝ විමසුම් කණ්ඩායම් හරහා විභාග කරන ලද සිසු ඉගෙනුමේ වෙනත් අංශවලට පහත සඳහන් දෑ ඇතුළත් කළ හැකිය.

- ★ මූලාශ්‍ර, තොරතුරුවල විශ්වාසනීයභාවය, වලංගුතාව සහ අදාළත්වය හඳුනා ගැනීමට හැකියාව
- ★ විශ්වාසනීය සහ හොඳින් දැනුවත් නිෂ්පාදන නිර්මාණය කිරීමට හැකියාව හෝ කෙනෙකුගේ ඩිජිටල් අභ්‍යාස වගකිව යුතු ලෙස කළමනාකරණය කිරීමට හැකියාව

සම්මුඛ සාකච්ඡා ප්‍රශ්න හෝ ප්‍රත්‍යවේක්ෂණ පත්‍රිකා සඳහා සිසු ප්‍රතිචාර විශ්ලේෂණය කිරීම පාසල් පුස්තකාලයාධිපතීන් සහ ගුරුවරුන්ට වෙහෙසකර සහ කාලය ගත වන අනන්‍යයක් විය හැකිය. එහෙත් එමඟින් මෙම වෘත්තිකයන්ට සිසුන් විෂයමාලා අන්තර්ගතය පිළිබඳ ස්වකීය දැනුම සහ අවබෝධය මෙන්ම පාසල් වැඩකටයුතු සහ ඉන් ඔබ්බට වැදගත් වන තොරතුරු හැසිරවීමේ සහ පිරිනැමීමේ කුසලතා සංවර්ධනය කර ගත් ආකාරය දැක ගැනීමට හැකියාව ලැබෙනු ඇත. ස්වකීය විමසුම් ඉගෙනීම් ක්‍රියාවලියට සම්බන්ධ වන සිසුන් ඒ පිළිබඳ අනෙක් සිසුන් දැනුවත් කිරීමට සහාය වන අතර ස්වකීය පුද්ගල ඉගෙනුම් ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමට සහ අනුගත කිරීමට හැකියාව ලබා ගනී.

### 6.3.5. සාක්ෂි පාදක ව්‍යවහාර

සාක්ෂි පාදක ව්‍යවහාරය තීරණ ගැනීම සඳහා දත්ත භාවිත කිරීමට පවත්නා සාකල්‍යවාදී සහ සමෝධානිත එළඹුමකි. පාසල්වල සාක්ෂි පාදක ව්‍යවහාරය ත්‍රිවිධ මාදිලියක දත්ත සමෝධානය කරයි. එනම් (1) ව්‍යවහාරය සඳහා සාක්ෂි (විධිමත් පර්යේෂණයේ සිට අවිධිමත්/ව්‍යවහාරය දක්වා සොයා ගැනීම් භාවිත කිරීම) (2) ව්‍යවහාරය තුළ සාක්ෂි (ව්‍යවහාරය පරිවර්තනය කිරීම සඳහා ප්‍රාදේශීය වශයෙන් නිෂ්පාදිත දත්ත භාවිත කිරීම) සහ (3) ව්‍යවහාරය පිළිබඳ සාක්ෂි (පාසල්

පුස්තකාලයාධිපතීන් කරනු ලබන දෑ පිළිබඳ ප්‍රතිඵල පෙන්වාදීමට පාඨකයන් විසින් වාර්තා කරන ලද සහ පාඨකයන් විසින් ජනනය කරන ලද දත්ත භාවිත කිරීම) යනුවෙනි. (ටෙඩ්, 2007) පාසල් පුස්තකාලයාධිපතීන් ස්වකීය වෘත්තීය අධ්‍යාපනය හරහා සහ පාසල් පුස්තකාල පිළිබඳ ප්‍රකාශිත සාරාංශ බොහොමයක් වෙතින් ව්‍යවහාරය සඳහා සාක්ෂි වෙතට ප්‍රවේශය ලබා ගනිති. (උදා - හේකොක්, 1992, කචෙල් සහ තවත් අය (2013) එමෙන්ම පාසල් පුස්තකාලයාධිපතීහු තීරණ ගැනීම සඳහා සංසරණ වාර්තා සහ උපදේශාත්මක ක්‍රියාකාරකම්වල උපලේඛන වැනි ස්වකීය ව්‍යවහාරය තුළ ජනනය කරන ලද සාක්ෂි භාවිත කරති. නිදසුනක් ලෙස, කියවීම් ප්‍රවර්ධන ක්‍රියාකරකම් සඳහා සම්පත් මිල දී ගැනීමට සම්බන්ධ සහ විමසුම් පාදක ඉගෙනුම් අත්දැකීම වෙත සියලු සිසුන්ට අවස්ථාව පැවතීම සහතික කරන සැලසුම්වලට සම්බන්ධ තීරණ ගැනීම දැක්විය හැකිය.

## 6.4 පාසල් පුස්තකාල ඇගැයීමේ බලපෑම්

ඇගැයීම යනු අඛණ්ඩ වර්ධනයේ නොනවතින චක්‍රයක තීරණාත්මක අංගයකි. පාසල් අභිමතාර්ථ සමග පාසල් පුස්තකාලයක වැඩසටහන් හා සේවා පෙළ ගැස්වීමට ඇගැයීම උපකාරී වේ. ඇගැයීම පාසල් පුස්තකාල වැඩසටහන් හා සේවාවන්ගෙන් සිසුන්ට හා ගුරුවරුන්ට, පුස්තකාල කාර්යමණ්ඩලයට සහ පුළුල් අධ්‍යාපනික ප්‍රජාවට ලැබෙන ප්‍රතිලාභ විදහා දක්වයි. ඇගැයීම මෙම වැඩසටහන් හා සේවා වර්ධනය කිරීමට අවශ්‍ය සාධක සපයන අතර එම වැඩසටහන් හා සේවා අවබෝධ කර ගැනීමට සහ තක්සේරු කිරීමට පුස්තකාල කාර්යමණ්ඩලය මෙන්ම පුස්තකාල පාඨකයන්ට ද සහාය වේ. සාර්ථක ඇගැයීම, වැඩසටහන් හා සේවා යළි සැකසීමට මෙන්ම නව වැඩසටහන් හා සේවා සංවර්ධනය වෙතට දිවේ. මහජන සබදතා සහ උද්දේශනයට සම්බන්ධ මුලපිරීම්වලට මඟපෙන්වීම සඳහා ද ඇගැයීම අත්‍යවශ්‍ය වේ.

## 6.5. පාසල් පුස්තකාලයේ මහජන සබඳතා

මහජන සබඳතා පිළිබඳ සංකල්පය දිගුකාලීන අන්තර් ක්‍රියාකාරීත්වය සහ උපායමාර්ගික සන්නිවේදනය වෙත අවධානය යොමු කරයි. එය සංවිධානය සහ එහි ජනතාව අතර අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිලාභ සහිත සබඳතාවක් ගොඩ නංවයි. මෙහිදී එය පාසල් පුස්තකාලයක් සහ එහි හවුල්කරුවන් අතර ගොඩ නංවන සබඳතාවකි. (3.5.4 කොටසෙහි ප්‍රජා සබඳතා බලන්න)

අලෙවිකරණය සහ ප්‍රවර්ධනය අවධානය යොමු කරනුයේ පුස්තකාල පාඨකයන්ගේ ඕනෑකම් සහ අවශ්‍යතා සපුරාලීමට සංවර්ධනය කර ඇති වඩාත් ක්ෂණික නිමවුම් සහ සේවා වෙතය. මෙයට ප්‍රතිවිරුද්ධව උද්දේශනය යනු මූලිකව වෙනස සඳහා වන ක්‍රියාවක් හෝ අදහසක් හෙවත් කරුණක් පිළිබඳ පරිණත තත්ත්වයකි. දිගුකාලීන පාසල් පුස්තකාලයේ හවුල්කාර කණ්ඩායම් සහ සහාය ලබාදෙන්නන් සමග සහායශීලී සබඳතා ගොඩ නැංවීම අවශ්‍ය වේ. මෙය පාසල් පුස්තකාල උද්දේශනය නම් වේ. අලෙවිකරණය සහ ප්‍රවර්ධනය මෙන්ම උද්දේශනය ද සැලසුම් සහගත විය යුතු අතර විධිමත් අයුරින් ක්‍රියාත්මක කළ යුතුය. ප්‍රවර්ධනය සහ අලෙවිකරණය පාසල් පුස්තකාලයාධිපතිවරයෙකුගේ පාසල් පාදක කාර්යයෙහි කොටසකි. උද්දේශනයේ දී ඉටු කළ යුතු භූමිකාවක් පාසල් පුස්තකාලයාධිපතිවරයෙකුට තිබේ. එහෙත් සාමාන්‍යයෙන් උද්දේශනය යනු පාසල්

පුස්තකාල සංගමයක් වැනි කණ්ඩායමක් විසින් සැලසුම් කර පවත්වා ගෙන යන්නකි. පාසල් පුස්තකාල ප්‍රවර්ධනය සහ අලෙවිකරණයේ මූලික අවධානය පුස්තකාල පාඨකයන් වෙත යොමු වේ. මෙහි දී අවධාරණය කෙරෙනුයේ පුස්තකාල භාවිතයයි. පාසල් පුස්තකාල උද්දේශනය නාභිගත වන්නේ තීරකයන් හා තීරකයන්ට බලපෑම් කළ හැකි පුද්ගලයන් වෙතය. මෙහිදී අවධානය යොමු වන්නේ පුස්තකාල අරමුදල් සහ පාසල් පුස්තකාලයාධිපතීන්ගේ කාර්යයන් පහසු කරන වෙනත් ආකාරයේ සහායක් වෙතය.

### 6.5.1. ප්‍රවර්ධනය සහ අලෙවිකරණය

ප්‍රවර්ධනය සිදුවන්නේ එක් පසෙකටය. එමගින් පුස්තකාලයෙන් සපයන දෑ පාඨකයන්ට වෙත සන්නිවේදනය කරයි. අලෙවිකරණය දෙපසට සිදුවන හුවමාරුවකි. එය පුස්තකාලයේ සේවා විභව පාඨකයන්ගේ අවශ්‍යතා සහ ප්‍රමුඛතාවලට ගැලපීමට උත්සාහ ගනී. පාසල් පුස්තකාලයකින් සපයන සේවා සහ පහසුකම් සක්‍රීයව ප්‍රවර්ධනය සහ අලෙවිකරණය කළ යුතුය. ඉගෙනුමේ දී හවුල්කරුවෙකු ලෙසත් අපේක්ෂිත සේවා සහ සම්පත් සපයන්නෙකු ලෙසත් පුස්තකාලයේ භූමිකාව පිළිබඳ ඉලක්ක කණ්ඩායම් (පාසල් මෙන්ම පළල් ප්‍රජාව) දැනුවත් වන්නේ එවිටය.

හවුල්කරුවන් සමග සහයෝගීත්වයෙන් ක්‍රියාත්මක කරන ලිඛිත ප්‍රවර්ධන සහ අලෙවිකරණ සැලැස්මක් පාසල් පුස්තකාලයකට තිබිය යුතුය. අපේක්ෂිත අරමුණු, එම අරමුණු සපුරා ගන්නා ආකාරය නිරූපණය කරන ක්‍රියාකාරී සැලැස්මක් සහ ප්‍රවර්ධන සහ අලෙවිකරණ ක්‍රියාවන්හි සාර්ථකත්වය ඇගයීමට ලක් කරන ඇගයීම් ක්‍රමවේද එම සැලැස්මට ඇතුළත් විය යුතුය. ප්‍රවර්ධන සහ අලෙවිකරණ සැලැස්ම වාර්ෂිකව ඇගයීමට, විමසුමට හා ප්‍රතිශෝධනයට ලක් කළ යුතුය. සෑම වසර දෙකකට වරක්ම පාසල් පුස්තකාලයාධිපති සහ පාසල් පරිපාලනය විසින් සමස්තයක් ලෙස මෙම සැලැස්ම ගැඹුරින් සාකච්ඡාවට බඳුන් කිරීම අත්‍යවශ්‍යය.

### 6.5.2. උද්දේශනය

උද්දේශනය යනු අවබෝධය වර්ධනයටත් කාලයත් සමග සහාය වැඩිදියුණු කර ගැනීමටත් පවත්නා සැලසුම් සහගත මෙන්ම තිරසාර ප්‍රයත්නයකි. ප්‍රවර්ධනය හා අලෙවිකරණයට සම්බන්ධ වුවත් උද්දේශනය එයින් වෙනස් වේ. පාසල් පුස්තකාල උද්දේශනය යනු ප්‍රධාන තීරකයන්ගේ අවබෝධය මෙන්ම ඔවුන්ගෙන් ලබන සහාය වර්ධනය කිරීම වේ. එය දැනුවත්භාවය ඉහළ නැංවීම සහ දැනුම වර්ධනය කිරීම පිළිබඳ වූවකි. එයට යම් කාලයක් ගතවන අතර සැලසුම්කරණය අවශ්‍යය. පාසල් පුස්තකාල උද්දේශන ප්‍රයත්න අවධානය යොමු කළ යුත්තේ පාසල් පුස්තකාල පාඨකයන්ට වඩා තීරකයන් සහ තීරකයන්ට බලපෑම් කළ හැකි පුද්ගලයන් වෙතය.

උද්දේශනය යනු සබඳතා ගොඩ නැංවීම පිළිබඳ වූවකි. උද්දේශනය යනු අන්‍යයන්ට බලපෑම් කිරීමය. අන්‍යයන්ට බලපෑම් කිරීමට සම්බන්ධ විශ්වීය මූලධර්ම හයක් පර්යේෂණවලින් ස්ථාපිත කර ඇත. මෙම පෙළඹවීම් මූලධර්ම උද්දේශනයේ සාර්ථකත්වයට අත්‍යවශ්‍ය වේ. එනම්, අනුපූරකත්වය, කැමැත්ත, අධිකාරීත්වය, සමාජීය තහවුරුව, සංගත බව/කැපවීම සහ අඩුවයි.

අනුපූරකත්වය සහ කැමැත්ත සබඳතා ගොඩනැංවීම පිළිබඳ වූවකි. මිනිස්සු බොහෝ විට අන්‍යයන් වෙනුවෙන් විවිධ දේ කරති. මන්ද, ඔවුන් වෙනුවෙන් අන්‍යයන් ද යමක් කර ඇති බැවිනි; ඔවුන් අන්‍යයන්ට කැමැත්ත දක්වන බැවිනි. එය අධිකාරිත්වය සහ සාමාජීය තහුවරුව අනිශ්චිත

කාලවල දී තීරණ ගැනීම පිළිබඳ වූවකි. මිනිසුන් බොහෝ විට විවිධ දේ කරනුයේ අධිකාරිත්වය තුළ යමෙක් ක්‍රියාවක් නිර්දේශ කරන බැවින් හෝ ඔවුන් එය කිරීම අන්‍යයන්ගේ කැමැත්ත බැවිනි. සංගත බව/කැපවීම සහ අඩුව ක්‍රියාව වෙත පුද්ගලයන් යොමු කිරීම පිළිබඳ වූවකි. මිනිසුන් තවදුරටත් යමක් කිරීමට කැමැති වන්නේ වටිනාකම් සමඟ ඔවුන්ගේ ක්‍රියාව ගැලපෙන බව ඔවුන් තේරුම් ගතහොත්ය. එමෙන්ම ක්‍රියාව ඔවුන් අගය කරන යමක් අහිමිවීම වෙතින් ඔවුන් ගලවා ගනු ඇතැයි තේරුම් ගතහොත්ය.

උද්දේශන වැඩසටහනක් සැලසුම් කිරීමට මඟපෙන්වීමේ දී මෙම විශ්වීය මූලධර්ම මතකයේ තබා ගත යුතුය. නිදසුනක් ලෙස, පාසල් පුස්තකාලයාධිපතීන් පාසල් පුස්තකාල ප්‍රතිපත්තිමය කරුණකට සහාය වීමට තමන්ගේ පාර්ශ්වය වෙතට ජාතික පුස්තකාල සංගම්වල අනෙක් පුස්තකාලයාධිපතීන් නැඹුරු කර ගැනීම ඉලක්ක කළ යුතුය. උද්දේශන වැඩසටහනක් සැලසුම් කිරීමේ දී උපකාර වන, මඟපෙන්වන ප්‍රශ්න කීපයක් පහත දැක්වේ.

- ★ අඩුව - පාසල් පුස්තකාලවලට හොඳින් සහාය ලබා නොදුනහොත් අනෙක් පුස්තකාලයාධිපතීන්ට අහිමි විය හැක්කේ කුමක් ද?
- ★ සංගත බව/කැපවීම - ඔවුන් ඔබ සමඟ බෙදාහදා ගන්නා වටිනාකම් මොනවා ද?
- ★ අධිකාරිත්වය - ඔවුන් ගරු කරනුයේ කවරෙකුගේ ආකල්පවලට ද?
- ★ සමාජීය තහවුරුව - අනෙක් ජාතික සංගම් පාසල් පුස්තකාල ප්‍රතිපත්තිවලට දී ඇති සහයෝගය කුමක් ද?
- ★ අනුපූරකත්වය - ඔබට සංගමයේ අනෙක් පුස්තකාලයාධිපතීන්ගේ ගැටලුවලට සහාය දිය හැක්කේ කෙසේ ද?
- ★ කැමැත්ත - අනෙක් පුස්තකාලයාධිපතීන් පිළිබඳ ඔබ කැමැත්ත දක්වන්නේ කුමකට ද? සහ ඔබට එය පෙන්විය හැක්කේ කෙසේ ද?

උද්දේශනය යනු පාසල් පුස්තකාලයාධිපතීන් සහ ඔවුන්ගේ සහායන් 'අනන්‍යයන් සමඟ එක්ව සැලසුම් සහගත ආකාරයකින් ඉදිරියට ගමන් කරන විට කළ හැකි යමකි. ඉෆ්ලා මාර්ගගත ඉගෙනුම් වේදිකාව **(www.ifla.org/bsla)**පුස්තකාල වෙනුවෙන් උද්දේශනයේ යෙදීමට අවශ්‍ය සහ එය සිදු කරන ආකාරය වැඩිදුරටත් දැන ගැනීමට අවශ්‍ය පුද්ගලයන් සඳහා සම්පත් සපයයි. මෙම වෙබ් අඩවියෙහි පාසල් පුස්තකාල ජාලයක් නිර්මාණය කිරීම, පාසල් පුස්තකාල ව්‍යවස්ථා වෙනස් කිරීම, සහ අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ සඳහා බලවේගයක් ලෙස පාසල් සංවර්ධනය පිළිබඳ සිද්ධි අධ්‍යයන ඇතුළු පාසල් පුස්තකාල උද්දේශනයට අදාළ නිශ්චිත ද්‍රව්‍ය ඇතුළත් වේ. පාසල් පුස්තකාල සංවර්ධනය ඉහළ නැංවීම සහ පවත්වා ගෙන යාම සඳහා උද්දේශනය අත්‍යවශ්‍ය වේ. උද්දේශනය මෙන්ම ඇගැයීම අපගේ පාසල්වල සියලු පුද්ගලයන් සඳහා ඉගැන්වීම් සහ ඉගෙනුම් වර්ධනයේ කාර්යය වෙනුවෙන් අවබෝධය සහ සහාය ගොඩනංවයි.

## ප්‍රයෝජනවත් මූලාශ්‍ර


American Association of School Librarians. (2014). *Advocacy*. Retrieved from www.ala.org/aasl/advocacy

Cialdini, R. B. (2006). *Influence: The psychology of persuasion* (Rev. ed.). New York: Harper Business Books.

Department for Education and Office for Standards in Education, Children's Services and Skills [UK]. (2006). *Improving performance through school self-evaluation and improvement planning.* Retrieved from http://dera.ioe.ac.uk/5986/1/Improving_%20performance%20through%20school%20self-evaluation%20and%20improvement%20planning%20(PDF%20format).pdf

Department for Education and Skills and the School Libraries Working Group [UK]. (2004). *Self-evaluation model: School libraries resource materials.* Retrieved from www.informat.org/schoollibraries/index.html

FADBEN. (2012). *The FADBEN manifesto: Teaching information-documentation and information culture.* Retrieved from http://fadben.asso.fr/2012-FADBEN-Manifesto.html

Haycock, K. (1992). *What works: Research about teaching and learning through the school's library resource center.* Seattle, WA: Rockland Press.

Kachel, D. E., et al. (2013). *School library research summarized: A graduate class project.* Mansfield, PA: Mansfield University. Retrieved from http://sl-it.mansfield.edu/upload/MU-LibAdvoBklt2013.pdf

LRS (Library Research Service, Colorado State Library, Department of Education). (2015). *School libraries impact studies.* Retrieved from www.lrs.org/data-tools/school-libraries/impact-studies/

Mollard, M. (1996). *Les CDI à l'heure du management* [CDI on time management]. Paris: École nationale supérieure des sciences de l'information et des bibliothèques.

Oberg, D. (2009). Libraries in schools: Essential contexts for studying organizational change and culture. *Library Trends, 58*(1), 9-25.

Todd, R. (2007). Evidence based practice and school libraries: From advocacy to action. In S. Hughes-Hassell & V. H. Harada (Eds.), *School reform and the school library media specialist* (pp. 57-78). Westport, CT: Libraries Unlimited.

Todd, R. J., & Kuhlthau, C. C. (2005a). Student learning through Ohio school libraries, Part 1: How effective school libraries help students. *School Libraries Worldwide, 11*(1), 63-88.

Todd, R. J., & Kuhlthau, C. C. (2005b). Student learning through Ohio school libraries, Part 2: Faculty perceptions of effective school libraries. *School Libraries Worldwide, 11*(1), 89-110.

Todd, R., Kuhlthau, C., & Heinstrom, J. (2005). *SLIM Toolkit.* New Brunswick, NJ: Center for International Scholarship in School Libraries, Rutgers University. Retrieved from http://cissl.scils.rutgers.edu/index.html

Todd, R. J., Kuhlthau, C. C., & OELMA. (2004). *Student learning through Ohio school libraries: The Ohio research study*. Columbus, OH: Ohio Educational Library Media Association. Retrieved from www.oelma.org/studentlearning/default.asp

Williams, D., Wavell, C., & Morrison, K. (2013). *Impact of school libraries on learning: Critical review of published evidence to inform the Scottish education community.* Aberdeen, Scotland: Robert Gordon University, Institute for Management, Governance & Society (IMaGeS). Retrieved from www.scottishlibraries.org/storage/sectors/schools/SLIC_RGU_Impact_of_School_Libraries_2013.pdf.

## ශබ්දමාලාව (GLOSSARY)

The scope of this glossary is based on suggestions from reviewers and contributors to the guidelines document. For further information related to library-related terminology, readers may wish to consult ODLIS (Online Dictionary for Library and Information Science), written by Joan M. Reitz and published by ABC-CLIO at www.abc-clio.com/ODLIS/odlis_l.aspx Hardcover and paperback editions of the dictionary are available from Libraries Unlimited.

**Advocacy:** a planned, sustained effort to develop understanding and support incrementally, over time.

**Bibliographic instruction**: Teaching users how to use the library's texts and systems, often referred to as "BI" (See also Library instruction; Media and information literacy; User education.)

**Cataloguing:** the process of describing an information resource and creating entries for a catalogue. Usually includes bibliographic description, subject analysis, assignment of classification notation, and activities involved in physically preparing the item for the shelf.

**Circulation:** The process of borrowing and returning library materials. Also refers to the total number of items checked out over a period of time and to the total number of times a given item is checked out during a period of time, usually one year.

**Citizenship:** The legal and political status of being a member of a community (i.e., a citizen*)*, along with the rights, duties, and privileges of being a citizen. In addition to involving the individual's basic rights and responsibilities, it also involves the quality of an individual's character and how he or she acts as a person within the community.

**Civic engagement:** The taking of individual and collective actions designed to identify and address issues of public concern; developing the knowledge, skills, values, and motivation necessary to act to make a difference in the quality of life of the community.

**Code of ethics**: A set of standards governing the conduct and judgment of librarians, library staff, and other information professionals in their work. Usually includes standards for equitable access, intellectual freedom, confidentiality, respect for intellectual property rights, excellence, accuracy, integrity, impartiality, courtesy, and respect for colleagues and for library users.

**Collection:** All materials that the library collects, organizes, and makes available. Usually refers to physical items but could also refer to digital resources, sometimes called "holdings." The documents in a collection may be physical or digital; in print or non-print formats; located locally or remotely; owned by the library, accessible through the library for a fee, or freely available from other institutions.

**Culture of information:** The body of knowledge necessary for enabling students to understand the nature of information and how it is created, to develop an enlightened understanding of the stakes and mechanisms of the information and communication industries, and to develop a critical approach to the endless technological innovations and the "documentarisation" of human beings when personal data are being used. Also includes developing ethical and responsible attitudes regarding the use of information. (See also Media and information literacy.)

**Curation:** The development, care, organization, and supervision of a museum, gallery, or other exhibit space and all the objects stored or displayed in it. Also, developing collections of digital objects, such as websites. The person in charge of such special collections (i.e., curator) requires specialized knowledge and experience related to selecting items of merit and to assisting users in locating and interpreting the items in the collections.

**Database:** A large, regularly updated file of related information, consisting of records of uniform format organized for ease and speed of search and retrieval and managed with the aid of database management system software. Databases frequently used in school libraries include catalogues, periodical indexes, abstracting services, and full-text reference resources, usually leased annually under licensing agreements that limit access to library members and library staff.

**Indigenous:** A term used to identify the universal population of indigenous peoples, although some may choose to define and identify themselves in their own languages or specific tribal identities. Some may use other labels or names such as Native, Native American, Aborigine, First Nation, etc.

**Information literacy:** The set of skills, attitudes, and knowledge necessary to access, evaluate, and use information effectively, responsibly, and purposefully. Usually includes the ability to know when information is needed to solve a problem or make a decision, to articulate that need, to locate and utilize information, to share it with others if necessary, and to apply it to the problem or decision. Also known as "information competence" and "information fluency." (See also Media and information literacy.)

**Library instruction, an inquiry-based approach to:** Teaching that emphasizes thinking about information and using information within a problem-solving perspective and that integrates the knowledge of tools, sources, and search strategies within the teaching of thinking and problem solving. This approach began to be emphasized in the 1990s.

**Library instruction, a sources approach to:** Teaching users about the nature and uses of the library's tools and sources, especially reference texts and indexes for finding information. An approach emphasized during the 1960s and 1970s.

**Library instruction, a pathfinder approach to:** Teaching users how to use search strategies, that is, to use logical patterns based on expert practice, to access library tools and sources. Recommended search strategies are often outlined in published guides called "pathfinders" or "guides to the literature." This approach began to be emphasized during the 1980s.

**Library instruction, a process approach to:** Teaching users how to develop a personal learning process through mediating the affective, cognitive, and physical aspects (feelings, thoughts, actions) of using information to develop knowledge or solve problems. This research-based approach, based on the Information Search Process (Kuhlthau, 1985), began to be emphasized in the 1990s.

**Library program:** (See School library program.)

**Media literacy:** (See Media and information literacy.)

**Media and information literacy:** The set of skills, attitudes, and knowledge necessary to understand and utilize the various kinds of mediums and formats in which information is communicated and to understand and utilize the information being communicate through those

mediums and formats. Includes such concepts as "information and media are created by humans, for personal, social, political, and economic purposes, and are inherently biased."

**Pathfinder:** A recommended search strategy to access library tools and sources. Sometimes called "library guide" or "guide to the literature."

**Program:** (See School library program.)

**School librarian:** A teacher with education in librarianship who has responsibility for leading or initiating the activities, programs, and services of a school library. In addition to managing daily operations, a school librarian supports the curriculum through collection development, teaches media and information literacy skills appropriate to grade level, assists students with selecting reading materials appropriate to their reading level, and helps classroom teachers integrate library services and materials into instructional programs. A school librarian may be known by various professional designations (e.g., teacher-librarian, library media specialist, learning resources teacher).

**School library:** A physical and digital learning space within a public or private elementary or secondary school that serves the information needs of its students and the curriculum needs of its teachers and staff. A school library provides a collection of education materials appropriate to the grade levels of the school. A school library is managed by a school librarian who is dedicated to enhancing the cognitive, personal, social, and cultural growth of students and teachers through activities and services related to reading, inquiry, and research. The school library is known by various terms (e.g., school library media centre, centre for documentation and information, library resource centre, library learning commons).

**School library program:** A planned comprehensive offering of teaching and learning activities designed to develop students' media and information literacy skills, research and inquiry skills, engagement in reading, digital skills, and other literacy-related and curriculum-based competencies.

**User education:** Any means used to help users understand a library, its texts and systems, and its services, including signage, handouts, and guides to the literature as well as direct teaching. (See also Bibliographic instruction; Library instruction; Media and information literacy.) 56

## ග්‍රන්ථ නාමාවලිය (**BIBLIOGRAPHY**)

At the end of each chapter in this guidelines document are listed **Useful Resources** related to the topics addressed in that chapter. This bibliography includes resources consulted during the process of revising the guidelines and resources suggested by reviewers and contributors to the guidelines document; however, it excludes resources listed at the end of chapters.


Alexandersson, Mi., & Limberg, L. (2004). *Textflytt och sökslump: Informationssökning via skolbibliotek* [Moving text and searching by chance: Information retrieval through the school library]. Stockholm, Sweden: Myndigheten för Skolutveckling.

American Association of School Librarians. (2009). *Empowering learners: Guidelines for school library programs*. Chicago: American Library Association.

American Association of School Librarians. (2008). *Learning 4 life: A national plan for implementation of Standards for the 21st-Century Learner and Guidelines for the School Library Media Program*. Chicago: ALA. Retrieved from www.ala.org/aasl/learning4life.

American Association of School Librarians. (2009). *Standards for the 21st-century learner in action*. Chicago: AASL.

Asselin, M., & Doiron, R. (2013). *Linking literacy and libraries in global communities*. Farnham, England: Ashgate Publishing.

Barrett, H., et al. (2010). *Skolbibliotekets möjligheter: Från förskola till gymnasium* [The possibilities of the school library: From pre-school to senior high school]. Lund, Sweden: BTJ Förlag.

Capra, S., & Ryan, J. (Eds.). (2002). *Problems are the solution: Keys to lifelong learning.* Capalaba, Australia: Capra Ryan & Associates.

Chapron, F. (2012). *Les CDI des lycées et collèges: De l'imprimé au numérique* [CDI or school libraries in high schools and junior high schools: From print to digital] (nouvelle édition). Paris, France: Presses universitaires de France.

Coatney, S. (Ed.). (2010). *The many faces of school library leadership*. Santa Barbara, CA: Libraries Unlimited.

Connaway, L., & Powell, R. (2010). *Basic research methods for librarians*. Westport, CT: Libraries Unlimited.

Cook, D., & Farmer, L. (Eds.). (2011). *Using qualitative methods in action research.* Chicago, IL: American Library Association.

Court, J. (Ed.). (2011). *Read to succeed.* London [UK]: Facet Publishing.

Crowley, J. D. (2011). *Developing a vision: Strategic planning for the school librarian in the 21st century* (2nd ed.). Santa Barbara, CA: Libraries Unlimited.
Das, L., & Walhout, J. (2012). *Informatievaardigheden en de mediathecaris* [Information literacy and the school media specialist]. Rapport 30. Heerlen, Netherlands: Open Universiteit, Ruud de Moor Centrum.

Erikson, R., & Markuson, C. (2007). *Designing a school library media center for the future* (2nd ed.). Chicago: American Library Association.

Farmer, L. (2014). *Introduction to reference and information and services in today's school library*. Lanham, MD: Rowman & Littlefield.

Farmer, L. (2011). *Instructional design for librarians and information professionals*. New York: Neal-Schuman.

Farmer, L., & McPhee, M. (2010). *Technology management handbook for school library media centers*. New York: Neal-Schuman.

Hughes-Hassell, & Harada, V. H. (2007). *School reform and the school library media specialist*. Westport, CT: Libraries Unlimited.

Gordon, C. (2000). *Information literacy in action*. Melton, Woodbridge, UK: John Catt Educational.

Guldér, M., & Helinsky, Z. (2013). *Handbok för skolbibliotekarier: Modeller, verktyg och praktiska exempel* [Handbook for school libraries: Models, tools and practical examples]. Lund, Sweden: BTJ Förlag.

Hart, G. (2011). The "tricky business" of dual use school community libraries: A case study in rural South Africa, *Libri, 61*(3), 211-225.

Hart, G. (2012). Teacher-librarians leading change: Some stories from the margins. *School Libraries Worldwide, 18*(2), 51-60.

Hoel, T., Rafste, E. T., & Sætre, T. P. (2008). *Opplevelse, oppdagelse og opplysning: fagbok om skolebibliotek* [Adventure, discovery and enlightenment: A textbook about school libraries]. Oslo, Norway: Biblioteksentralen.

Kelsey, M. (2014). *Cataloging for school librarians*. Lanham, MD: Rowman & Littlefield.

Kiefer, B., & Tyson, C. (2009). *Charlotte Huck's children's literature: A brief guide*. New York: McGraw Hill.

Kuhlthau, C. C., Maniotes, L. K., & Caspari, A. K. (2012). *Guided inquiry design: A framework for inquiry in your school*. Santa Barbara, CA: Libraries Unlimited.

Kuhlthau, C. C., Maniotes, L. K., & Caspari, A. K. (2015). *Guided inquiry: Learning in the 21st century school* (2nd ed.). Westport, CT: Libraries Unlimited.

Lester, J., & Koehler, W. (2007). *Fundamentals of information studies* (2nd ed). New York: Neal-Schuman.

Limberg, L. (2003). *Skolbibliotekets pedagogiska roll: En kunskapsöversikt* [The pedagogical role of the school library: A systematic review]. Stockholm, Sweden: Statens skolverk.

Limberg, L., Hultgren, F., & Jarneving, B. (2002). *Informationssökning och lärande: En forskningsöversikt* [Information retrieval and learning: A research review]. Stockholm, Sweden: Skolverket.

Limberg, L., & Lundh, A. H. (Eds.). (2013). *Skolbibliotekets roller i förändrade landskap*. [The role of school libraries in changing landscapes]. Lund, Sweden: BTJ Förlag. Retrieved from www.kb.se/Dokument/Bibliotek/projekt/Slutrapport 2013/Skolbibliotekets roller slutrapport 2013.pdf

Liquete, V. (Ed.) (2014). *Cultures de l'information* [Cultures of information]. CNRS Editions: Paris, France.

Malmberg, S., & Graner, T. (2014). *Bibliotekarien som medpedagog eller Varför sitter det ingen i lånedisken?* [The librarian as co-pedagogue, or Why is nobody sitting at the library desk?]. Lund, Sweden: BTJ Förlag.

Markuson, C., & European Council of International Schools. (2006). *Effective libraries in international schools*. Saxmundham, UK: John Catt Educational.

Morris, B. J. (2010). *Administering the school library media center* (5th ed.). Santa Barbara, CA: Libraries Unlimited. Available on the World Wide Web as an e-book.
Niinikangas, L. (1995). An open learning environment – new winds in the Finnish school library. *Scandinavian Public Library Quarterly 4*, 3-10.

Pavey, S. (2014). *Mobile technology and the school library*. Swindon, UK: School Library Association UK. Series: SLA Guidelines Plus

Rosenfeld, E., & Loertscher, D. V. (Eds.). (2007). *Toward a 21st century school library media program*. Lanham, MD: Scarecrow Press.

Sardar, Z., & Van Loon, B. (2010). *Introducing media studies: A graphic guide*. London, England: Icon Books.

School Library Association [UK]. *Guideline series*. Retrieved from www.sla.org.uk/guidelines.php

Schultz-Jones, B. A., & Ledbetter, C. (2013). Evaluating students' perceptions of library and science inquiry: Validation of two new learning environment questionnaires. *Learning Environments Research, 16*(3), 329-348.

Shaper, S. (Ed). (2014). *The CILIP guidelines for secondary school libraries*. London, UK: Facet Publishing.

Schlamp, G.(Ed.). (2013). *Die schulbibliothek im zentrum: Erfahrungen, berichte, visionen* [The school library in the centre: Experiences, stories, visions]. Berlin, Germany: BibSpider.

Thomas, N. P., Crow, S. R., & Franklin, L. L. (2011). *Information literacy and information skills instruction: Applying research to practice in the 21st century school library* (3rd ed.). Santa Barbara, CA: Libraries Unlimited. Available on the World Wide Web as an e-book.

Tilke, A. (2011). *The International Baccalaureate Diploma Program and the school library: Inquiry-based education*. Santa Barbara, CA: Libraries Unlimited. Available on the World Wide Web as an e-book.

Tomlinson, C., & Lynch-Brown, C. (2009). *Essentials of young adult literature* (2nd ed.). Old Tappan, NJ: Pearson.

Wilson, C., Grizzle, A., Tuazon, R., Akyempong, K., & Cheung, C. K. (2012). *Education aux médias et à l'information: programme de formation pour les enseignants* [Media education and information: A training program for teachers]. Paris, France: UNESCO.

Woolls, B., Weeks, A. C. & Coatney, S. (2013). *School library media manager* (5th ed.). Westport, CT: Libraries Unlimited.

Zamuda, A., & Harada, V. H. (2008). *Librarians as learning specialists: Meeting the learning imperative for the 21st century*. Westport, CT: Libraries Unlimited. 60

# A ඇමුණුම

## ඉෆ්ලා/යුනෙස්කෝ පාසල් පුස්තකාල ප්‍රඥප්තිය (1999)

**සියල්ලන් සඳහා ඉගැන්වීමේ දී සහ ඉගෙනුමේ දී පාසල් පුස්තකාලය**

***පාසල් පුස්තකාලය වත්මන් තොරතුරු සහ දැනුම පාදක සමාජය තුළ සාර්ථක ලෙස ක්‍රියා කිරීමට මූලික වන තොරතුරු සහ අදහස් සපයයි. පාසල් පුස්තකාලය සිසුන් යාවජීව ඉගෙනුම් කුසලතාවලින් සන්නද්ධ කරන අතර පරිකල්පනය දියුණු කර වගකිව යුතු පුරවැසියන් ලෙස ජීවත් වීමට ඔවුනට හැකියාව ලබා දෙයි.***

### පාසල් පුස්තකාලයේ මෙහෙවර

පාසල් පුස්තකාලය සියලු මාදිලි සහ මාධ්‍යවල තොරතුරු ඵලදායීව භාවිත කරන්නන් සහ විචාරාත්මක චින්තකයන් බවට පත්වීමට පාසල් ප්‍රජාවේ සියලු සාමාජිකයන්ට හැකියාව සලසන ඉගෙනුම් සේවා, පොත් සහ සම්පත් ලබා දෙයි. යුනෙස්කෝ මහජන පුස්තකාල ප්‍රඥප්තියේ ප්‍රතිපත්තිවලට අනුව පුළුල් පුස්තකාල හා තොරතුරු ජාල වෙත පාසල් පුස්තකාලය සම්බන්ධ වේ.

ප්‍රබන්ධයේ සිට වාර්තා දක්වාත්, මුද්‍රිත සිට ඉලෙක්ට්‍රොනික දක්වාත් පුස්තකාලයේ සහ ඉන් පරිබාහිරවත් පරාසයක විහිදෙන පොත් සහ වෙනත් තොරතුරු සම්පත් භාවිතයට පුස්තකාල කාර්යමණ්ඩලය සහාය වේ. මෙම ද්‍රව්‍ය පාඨ ග්‍රන්ථ, ඉගැන්වීම් ද්‍රව්‍ය සහ ක්‍රමවේදවලට අතිරේකයන් වන අතර ඒවා පෝෂණය කරයි.

පුස්තකාලයාධිපතීන් සහ ගුරුවරුන් එක්ව කටයුතු කරන විට සිසුන් සාක්ෂරතාවේ, කියවීමේ, ඉගෙනීමේ, ගැටලු විසඳීමේ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවල උසස් මට්ටම් සාක්ෂාත් කර ගන්නා බව සනාථ කර ඇත.

වයස, ජනවර්ගය, ස්ත්‍රී පුරුෂභාවය, ආගම, ජාතිකත්වය, භාෂාව, වෘත්තිය හෝ සමාජ තත්ත්වය පිළිබඳ තැකීමකින් තොරව පාසල් පුස්තකාලය පාසල් ප්‍රජාවේ සියලු සාමාජිකයන්ට සමානව සේවා සැපයිය යුතුය. ප්‍රධාන ප්‍රවාහයේ පුස්තකාල සේවා හා ද්‍රව්‍ය භාවිත කිරීමේ හැකියාවක් නොමැති අය සඳහා විශේෂිත සේවා හා ද්‍රව්‍ය සැපයිය යුතු වේ.

සේවා සහ එකතුන් වෙත ප්‍රවේශය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සහ නිදහස පිළිබඳ විශ්ව ප්‍රකාශය මත පදනම් විය යුතු අතර කිසිදු ආකාරයක දෘෂ්ටිවාදී, දේශපාලනික හෝ ආගමික වාරණයකට හෝ වාණිජ බලපෑමකට යටත් නොවිය යුතුය.

### අරමුදල් ව්‍යවස්ථා සහ ජාල

පාසල් පුස්තකාලය සාක්ෂරතාව, අධ්‍යාපන සහ තොරතුරු මෙන්ම ආර්ථික සමාජීය සහ සංස්කෘතික සංවර්ධනය සඳහා වන සෑම දිගුකාලීන උපායමාර්ගයකටම අත්‍යවශ්‍ය වේ. ප්‍රාදේශීය, කලාපීය සහ ජාතික අධිකාරීන්ගේ වගකීම ලෙස නියත ව්‍යවස්ථා සහ ප්‍රතිපත්ති මඟින් පාසල්

පුස්තකාලයට සහාය දැක්විය යුතුය. පුහුණුවලත් කාර්යමණ්ඩලය, ද්‍රව්‍ය, තාක්ෂණයන් සහ පහසුකම් සඳහා පාසල් පුස්තකාලයට ප්‍රමාණවත් සහ තිරසාර අරමුදල් පැවතිය යුතුය. පාසල් පුස්තකාල මුදල් අය කිරීමක් නොකළ යුතුය.

පාසල් පුස්තකාලය ප්‍රාදේශීය, කලාපීය හා ජාතික පුස්තකාල හා තොරතුරු ජාලාවල අත්‍යවශ්‍ය හවුල්කරුවකු වේ.

පාසල් පුස්තකාලය, මහජන පුස්තකාලය වැනි වෙනත් වර්ගයක පුස්තකාල සමඟ පහසුකම් සහ/ හෝ සම්පත් බෙදහදා ගන්නා විට දී පාසල් පුස්තකාලයේ සුවිශේෂ අභිමතාර්ථ පිළිගෙන පවත්වා ගෙන යා යුතුය.

## පාසල් පුස්තකාලයේ අභිමතාර්ථ

පාසල් පුස්තකාලය අධ්‍යාපනික ක්‍රියාවලියේ අවියෝජනීය අංගයකි.

සාක්ෂරතාව, තොරතුරු සාක්ෂරතාව, ඉගැන්වීම, ඉගෙනීම සහ සංස්කෘතිය මෙන්ම හර පාසල් පුස්තකාල සේවා සංවර්ධනයට පහත සඳහන් කරුණු අත්‍යවශ්‍ය වේ.

- ⋆ පාසලේ මෙහෙවරෙහි සහ විෂයමාලාවේ දක්වා ඇති පරිදි අධ්‍යාපනික අභිමතාර්ථවලට සහාය දීම සහ ඒවා ඉහළ නැංවීම
- ⋆ ළමයින් තුළ කියවීමේ සහ ඉගෙනීමේ පුරුදු සහ විනෝදයත් ඔවුන්ගේ ජීවිත කාලය පුරා පුස්තකාල භාවිතයත් සංවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම
- ⋆ දැනුම අවබෝධය, පරිකල්පනය සහ විනෝදය සඳහා තොරතුරු නිර්මාණයේ සහ භාවිතයේ අත්දැකීම් වෙනුවෙන් අවස්ථා සැලසීම
- ⋆ ප්‍රජාව තුළ සන්නිවේදන මාදිලි වෙත සංවේදිත්වය සහිතව මාදිලිය, ආකෘතිය සහ මාධ්‍ය පිළිබඳ තැකීමකින් තොරව තොරතුරු ඇගැයීම සහ භාවිතය සඳහා වන ඉගෙනුම් සහ ප්‍රායෝගික කුසලතාවල දී සිසුන්ට සහාය වීම
- ⋆ ඉගෙනුම්කරුවන් විවිධ අදහස්, අත්දැකීම් සහ ආකල්ප වෙත නිරාවරණය කරන ප්‍රාදේශීය, කලාපීය, ජාතික සහ ගෝලීය සම්පත් සහ අවස්ථාවලට ප්‍රවේශය සැපයීම
- ⋆ සංස්කෘතික සහ සමාජීය දැනුවත්භාවය සහ සංවේදිත්වය දිරිමත් කරන ක්‍රියාකාරකම් සංවිධානය කිරීම
- ⋆ පාසල් මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට සිසුන්, ගුරුවරුන්, පරිපාලකයන් සහ දෙමාපියන් සමඟ කටයුතු කිරීම
- ⋆ ඵලදායි සහ වගකිවයුතු පුරවැසිභාවයටත් ප්‍රජාතන්ත්‍රවාදය තුළ සහභාගිත්වයටත් අත්‍යවශ්‍ය බුද්ධිමය නිදහස සහ තොරතුරු වෙත ප්‍රවේශය යන සංකල්පය අනාවරණය කිරීම
- ⋆ කියවීම සහ පාසල් පුස්තකාලයේ සම්පත් හා සේවා සමස්ත පාසල් ප්‍රජාව සහ ඉන් ඔබ්බට ප්‍රවර්ධනය කිරීම

  ප්‍රතිපත්ති සහ සේවා සංවර්ධනය කිරීමෙන්, සම්පත් තේරීමෙන් සහ අත්පත් කර ගැනීමෙන්, යෝග්‍ය තොරතුරු සම්පත් වෙත භෞතික සහ බුද්ධිමය ප්‍රවේශය සැපයීමෙන්, උපදේශාත්මක පහසුකම් සැපයීමෙන් සහ පුහුණුවලත් කාර්යමණ්ඩලයක් යෙදවීමෙන් පාසල් පුස්තකාලය මෙම කාර්යයන් සපුරා ගනී.

## කාර්යමණ්ඩලය

පාසල් පුස්තකාලයාධිපති යනු හැකි තරම් ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක සහාය ලබන, පාසල් ප්‍රජාවේ සියලු සාමාජිකයන් සමග කටයුතු කරන, මහජන පුස්තකාල සහ අන්‍යයන් සමග සම්බන්ධීකරණයේ යෙදෙන පාසල් පුස්තකාලයේ සැලසුම්කරණය සහ කළමනාකරණය සඳහා වග කියන වෘත්තීමය වශයෙන් සුදුසුකම්ලත් කාර්යමණ්ඩල සාමාජිකයෙකි. පාසල් පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව ජාතික, නීතිමය සහ මූල්‍යමය රාමුව තුළ පාසලේ අයවැය සහ විෂයමාලාව හා ක්‍රමවේද අනුව විවිධත්වයක් ගනු ඇත. නියත සන්දර්භය තුළ පාසල් පුස්තකාලයාධිපතීන් සිටිනුයේ ඵලදායී පාසල් පුස්තකාල සේවා සංවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට නම් දැනුමේ පොදු ක්ෂේත්‍ර බෙහෙවින් සක්‍රීය වේ. සම්පත්, පුස්තකාලය සහ තොරතුරු කළමනාකරණය හා ඉගැන්වීම මෙම පොදු ක්ෂේත්‍රවලට ඇතුළත් වේ.

වැඩිවශයෙන් ජාලගත පරිසරයක් තුළ ගුරුවරුන් සහ සිසුන් වෙත විවිධ තොරතුරු හැසිරවීමේ කුසලතා සැලසුම් කිරීමේ දී සහ ඉගැන්වීමේ දී පාසල් පුස්තකාලයාධිපතීන් නිපුණත්වය දැක්විය යුතුය. එහෙත් ඔවුන් අඛණ්ඩව ස්වකීය වෘත්තීමය පුහුණුව සහ සංවර්ධනය පවත්වා ගෙන යා යුතුය.

## මෙහෙයුම් සහ කළමනාකරණය

ඵලදායි සහ වගකිව යුතු මෙහෙයුම් සහතික කිරීමට,

- ⋆ පාසලේ විෂයමාලාවට සම්බන්ධ අභිමතාර්ථ ප්‍රමුඛතා සහ සේවා නිර්වචනය කිරීමට සේවා ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතුය.
- ⋆ පාසල් පුස්තකාලය වෘත්තිමය ප්‍රමිතීන්ට අනුව සංවිධානය කර පවත්වා ගෙන යා යුතුය.
- ⋆ සේවාවන් පාසල් ප්‍රජාවේ සියලු සාමාජිකයන්ට ප්‍රවේශය සහිත විය යුතු අතර ප්‍රාදේශීය ප්‍රජාවේ සන්දර්භය තුළ ක්‍රියාත්මක කළ යුතුය.
- ⋆ ගුරුවරුන්, ජ්‍යෙෂ්ඨ පාසල් කළමනාකරණය, පරිපාලකයන්, දෙමාපියන්, වෙනත් පුස්තකාලයාධිපතීන් සහ තොරතුරු වෘත්තිකයන් මෙන්ම ප්‍රජා කණ්ඩායම් සමඟ සහයෝගිතාව දිරිමත් කළ යුතුය.

## ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම

අධ්‍යාපනය සඳහා වගකියන ස්වකීය අමාත්‍යාංශ හරහා රජයන්, මෙම ප්‍රඥප්තියේ මූලධර්ම ක්‍රියාවට නංවන උපායමාර්ග, ප්‍රතිපත්ති සහ සැලසුම් සංවර්ධනය කිරීමට දිරි ගන්වයි. පුස්තකාලයාධිපතීන් සහ ගුරුවරුන් සඳහා වන ආරම්භක සහ අඛණ්ඩ පුහුණු වැඩටසහන් වෙත මෙම ප්‍රඥප්තිය බෙදාහැරීම සැලසුම්වලට ඇතුළත් කළ යුතුය.

## B ඇමුණුම

### පාසල් පුස්තකාලය සඳහා ඇයවැය සැලැස්ම

පාසල් පුස්තකාලය සඳහා අයවැය සැලැස්මක් සංවර්ධනය කිරීමට අදාළව පාසල් පුස්තකාලයාධිපතීන් පහත සඳහන් දෑ අවබෝධ කර ගැනීම අවශ්‍යය.

- ⋆ පාසල් අයවැය ක්‍රියාවලිය
- ⋆ අයවැය චක්‍රය සඳහා කාලසටහන
- ⋆ අයවැය ක්‍රියාවලියට සම්බන්ධිත මූලික කාර්යමණ්ඩලය
- ⋆ පුස්තකාලයේ හඳුනාගත් අවශ්‍යතා
- ⋆ අයවැය වගවීම් ක්‍රියාවලිය

අයවැය සැලස්මක සංරචක පහත දැක්වේ.

- ⋆ නව සම්පත් සඳහා වන මුදල (උදා: පොත්,සඟරා,බහුමාධ්‍ය සහ ඩිජිටල් ද්‍රව්‍ය)
- ⋆ සැපයීම් සහ පරිපාලන ද්‍රව්‍ය සඳහා වන මුදල
- ⋆ ප්‍රවර්ධනාත්මක ඉසව් සහ ද්‍රව්‍ය සඳහා වන මුදල
- ⋆ සේවා සඳහා වන මුදල (උදා - පිටපත් කිරීම්, අලුත්වැඩියාවන්)
- ⋆ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකරණ භාවිත කිරීමේ පිරිවැය, මෘදුකාංග සහ බලපත්‍ර පිරිවැය (පාසලේ පොදු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අයවැයට ඇතුළත් වී නොමැති නම්)
- ⋆ පොදු නීතියක් ලෙස පාසල් පුස්තකාල ද්‍රව්‍ය අයවැය (සියලු වැටුප්, විශේෂ අධ්‍යාපනික වියදම්, ප්‍රවාහන සහ ප්‍රාග්ධන වර්ධන අරමුදල් හැර) පාසල් පද්ධතිය සඳහා සිසුවකුගේ වියදමෙන් 5%ක් විය යුතුය.

කාර්යමණ්ඩල වියදම් පුස්තකාලයේ අයවැයට ඇතුළත් කළ හැකිය. කෙසේ වෙතත්, ඇතැම් පාසල්වල පොදු කාර්යමණ්ඩල අයවැයට එය ඇතුළත් කිරීම වඩාත් උචිත විය හැකිය. පාසල් පුස්තකාලය සඳහා කාර්යමණ්ඩල පිරිවැය ඇස්තමේන්තු කිරීමේ කාර්යයට පාසල් පුස්තකාලයාධිපතීන් සම්බන්ධ විය යුතුය. කාර්යමණ්ඩලය සඳහා පවත්නා මුදල, පාසල් පුස්තකාලය විවෘත කර තැබිය හැකි පැය ගණන සහ ඊට සැපයිය හැකි සේවාවන්ගේ ගුණාත්මකභාවය සහ පරාසය සමඟ සමීපව බැඳී පවතී. නව රාක්කගත කිරීම් හෝ ප්‍රතිසංස්කරණ පහසුකම් වැනි විශේෂ ව්‍යාපෘති සහ වෙනත් සංවර්ධනයන් සඳහා වන අරමුල්වලට වෙනම ඉල්ලීම් කිරීම අවශ්‍ය විය හැකිය.

## C ඇමුණුම

### විමසුම් පාදක ඉගෙනුම සඳහා උපදේශාත්මක ආදර්ශන

විමසුම් පාදක ඉගෙනුම් ක්‍රියාවලිය පිළිබඳ හොඳින් සංවර්ධිත ආදර්ශන කීපයක් පහත දැක්වේ.

- ⋆ මයිකල් මාලන්ඩ්ගේ ප්‍රශ්න නවය (එක්සත් රාජධානිය) මාලන්ඩ්, එම් (1981), ද්විතියික විෂයමාලාවේ තොරතුරු කුසලතා. මෙතුවෙන් පාසල් කවුන්සලය
- ⋆ ස්ට්‍රිප්ලිං සහ පිට්ස්ගේ REACTS ආදර්ශනය (ඇමෙරිකා එක්සත් ජනපදය) ස්ට්‍රිප්ලිං, බී. සහ පිට්ස්.ජේ.(1988) බුද්ධිකලම්බන සහ සැලසුම් -සිතීමේ ක්‍රියාවලියක් ලෙස පර්යේෂණ ඉගැන්වීම, වෙස්ට්පෝට්, **CT** - ලයිබ්රරීස් අන්ලිමිටඩ්
- ⋆ තොරතුරු ක්‍රියාවලිය (ඔස්ට්‍රේලියාව) ඔස්ට්‍රේලියානු පාසල් පුස්තකාල සංගමය සහ ඔස්ට්‍රේලියානු පුස්තකාල හා තොරතුරු සංගමය (2001), අනාගතය සඳහා ඉගෙනීම - පාසල්වල තොරතුරු සේවා සංවර්ධනය කිරීම (2සංස්) කාල්ටන් සවුත්, ඔස්ට්‍රේලියාව, විෂයමාලා සමාගම
- ⋆ විමසුම වෙත අවධානය (කැනඩාව), ඇල්බර්ටා ඉගෙනුම (2003) විමසුම් වෙත අවධානයඃ විමසුම් පාදක ඉගෙනුම සඳහා ගුරුවරුන්ගේ මඟ පෙන්වීමක්. එඩ්මන්ටන්, **BA**- ඇල්බර්ටා ඉගෙනුම, ඉගෙනුම් සම්පත් ශාඛාව
- ⋆ මඟපෙන්වන ලද විමසුම (ඇමෙරිකා එක්සත් ජනපදය) කුල්තාහු, සී.සී. මැනියෝට්ස්, එල්.කේ. සහ කැස්පාරි, ඒ.කේ. (2012) මඟපෙන්වන ලද විමසුම් සැලැස්ම - ඔබගේ පාසලේ විමසුම සඳහා රාමුවක්, වෙස්ට්පෝට් **CT,** ලයිබ්‍රරිස් අන්ලිමිටඩ්
- ⋆ ශ්මිඩ්ට්, ආර් (2013), උසස් පාසල් පර්යේෂණ සඳහා මඟපෙන්වන ලද විමසුම් එළඹුමක්, වෙස්ට්පෝට් **CT** ලයිබ්‍රරීඩ් අන්ලිමිටඩ්

# D ඇමුණුම

## පාසල් පුස්තකාලය ඇගැයීමට අදාළ පරීක්ෂා කිරීම් ලැයිස්තුවක නියැදියක් (කැනඩාව)

මූලාශ්‍රයඃ තොරතුරු සාක්ෂරතාව සපුරාලීම - කැනඩාවේ පාසල් පුස්තකාල වැඩසටහන සඳහා ප්‍රමිති (74-77.පි) ඔටාවා, කැනඩාව, කැනේඩියානු පාසල් පුස්තකාල සංගමය සහ කැනඩාවේ ගුරු පුස්තකාලයාධිපති සංගමය 2003

1. **තොරතුරු සාක්ෂරතාව සහ කියවීම ප්‍රවර්ධනය වෙත නාභිගත වන වැඩසහන් - ඔව් - තරමක් - නැත**

අ. තොරතුරු සාක්ෂර කුසලතාවන්ගේ අඛණ්ඩත්වයක් වෙතට සම්බන්ධිත විමසුම් පාදක ඉගෙනුම

ආ. විෂමාලාව පුරා තොරතුරු සාක්ෂරතා වැඩසටහනෙහි සමෝධානය

ඇ. ගුරුවරුන් ගුරුපුස්තකාලයාධිපතීන්, පරිපාලකයන්, දෙමාපියන් සහ ප්‍රජා සාමාජිකයන් අතර සහයෝගිතාව

ඈ. ශිෂ්‍ය සාධන තක්සේරුවේ දී සහ වාර්තා කිරීමේ දී ගුරුපුස්තකාලයාධිපති සම්බන්ධ වීම

ඉ. පුස්තකාල වැඩසටහන වෙත සියලු සිසුන් සඳහා ප්‍රවේශය

ඊ. කියවීම් සහ සාක්ෂරතා වැඩසටහන සංවර්ධනයට සහාය හා ක්‍රියාත්මක කිරීම

2. **තාක්ෂණික සහ ලිපිකාර කාර්යමණ්ඩලයකින් සහාය ලද, සුදුසුකම්ලත්, නිපුණත්වය සහිත සහ හොඳින් අභිප්‍රේරණය වූ ගුරු පුස්තකාලයාධිපති ඇතුළු කාර්යමණ්ඩල ආදර්ශනය. - ඔව් - තරමක් - නැත**

අ. විෂය අභිමතාර්ථ සහ තොරතුරු සාක්ෂරතා අභිමතාර්ථ, සම්පත් පාදක විමසුම් ව්‍යාපෘති හරහා සපුරාලන විට පන්තිකාමර ගුරුවරුන් සමඟ සහයෝගී සැලසුම්කරණය සහ ඉගැන්වීම

ආ. විමසුම් ව්‍යාපෘතිවල දී සහ අවශ්‍යතා පදනම මත ගුරු පුස්තකාලයාධිපතීන් කාර්යමණ්ඩලයට සහ සිසුන්ට තාක්ෂණය සහ තොරතුරු සාක්ෂර කුසලතා ඉගැන්වීම

ඇ. පළාත් විෂයමාලා අවශ්‍යතා සහ ප්‍රාදේශීය රුචිකත්වයන් මත පදනම්ව සම්පත්වල විවිධත්වයක් සහිතව එකතුව සංවර්ධනය කිරීම

ඈ. මානව සම්පත්වල ඵලදායි කළමනාකරණය (ලිපිකාර, තාක්ෂණික, ශිෂ්‍ය, ස්වේච්ඡා)

ඉ. උපකරණවල ඵලදායි කළමනාකරණය (පිරුළු ප්‍රතිග්‍රහණය සහ නඩත්තුව)

ඊ. පහසුකම්වල ඵලදායි කළමනාකරණය (වෙන් කිරීම්, සැලසුම්, ගෘහභාණ්ඩ, නඩත්තුව)

එ. ලිපිකාර ක්‍රියාවලි (සංසරණය, ප්‍රතිග්‍රහණය, ඇයවැය, ඇණවුම් කිරීම, සූචිකරණය, රාක්කගත කිරීම, වාර්තා කිරීම, දත්ත ප්‍රවේශය)

ඒ. නායකත්වය (සම්පත් පාදක සාමූහික ව්‍යාපෘතිවල දී නව ඉගෙනුම් න්‍යායන් යොදා ගැනීම. නව තාක්ෂණයන් ඉගැන්වීම)

ඔ. සිසු ඉගෙනුමට පුද්ගල උද්යෝගය සහ කැපවීම

උ. වෘත්තීය සංවර්ධනය (උදාඃ වෙබ් පාදක ක්‍රියාකාරකම් සහ අවස්ථා)

**3. පාසලේ අභිමතාර්ථවලට සම්බන්ධිත දිගුකාලීන සැලසුම්වලට අවශ්‍ය කරන අරමුදල් ආදර්ශනයක් -ඔව් -තරමක් - නැත**

අ. විෂයමාලා අවශ්‍යතා සහ සියලු කාර්යමණ්ඩලයේ සහ වැඩසටහන්වල රුචිකත්වයන් මත පදනම් ව ගුරු පුස්තකාලයාධිපති විසින් වාර්ෂිකව සකසන ලද අයවැය වැඩසටහන

ආ. මූලික වියදම සමග දිගුකාලීන සැලැස්ම සඳහා සිසුවෙකුට වාර්ෂිකව වැය වන මුදල ඇතුළත් අයවැය

ඇ. ක්‍රියාත්මක වෙමින් පවතින සහ නව පාසල් වැඩසටහන් ඇතුළත් අයවැය

ඈ. සම්පත්, සැපයීම්, අලුත්වැඩියා, උපකරණ, සේවා ගිවිසුම්, වෘත්තීය සංවර්ධනය සහ ප්‍රාග්ධන වියදම් ඇතුළත් අයවැය

ඉ. පාසල් අවශ්‍යතා හඳුනා ගන්නා සහ ප්‍රමුඛතාගත කරන අයවැය

ඊ. උනන්දුවක් දක්වන්නන්ගේ යෙදවුම් පිළිබිඹු කරන අයවැය

එ. විශේෂ වැඩසටහන් සඳහා අරමුදල් - ලේඛක චාරිකා, කියවීම් වැඩසටහන් ආදිය

**4. සියලු ඉගෙනුම්කරුවන්ගේ විධිමත් සහ අවිධිමත් අවශ්‍යතා සපුරාලීමට ප්‍රවේශම්සහගත ලෙසත් විශේෂඥ ලෙසත් තෝරා ගත් යෝග්‍ය ඉගෙනුම් සම්පත්වල පුළුල් පරාසයක් පුස්තකාලය සතුවීම - ඔව්- තරමක් - නැත**

අ. පාසලේ ඉගෙනුම් අවශ්‍යතා පිළිබිඹු කරන තේරීම් ප්‍රතිපත්තියක් තිබීම

ආ. ආකෘති විවිධත්වයෙහි සමතුලනයක් තිබීම (උදා - මුද්‍රිත, චාරික, වීඩියෝ, ශ්‍රව්‍ය, ඉලෙක්ට්‍රොනික, මාර්ගගත දත්ත පදනම්, අන්තර්ජාලය, වෙනත්)

ඇ. ද්‍රව්‍යයන්හි ප්‍රවේශකත්ව මට්ටම්වල සමතුලනයක් තිබීම

ඈ. ප්‍රමාණවත් පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර

ඉ. ප්‍රමාණවත් දෘශ්‍ය සහ ශ්‍රවණ උපකරණ

ඊ. සිසුවෙකු සඳහා ප්‍රමාණවත් අයිතම සංඛ්‍යාව (ප්‍රමාණාත්මක)

එ. සම්පත් සහ ප්‍රජාවේ ඉගෙනුම් අවශ්‍යතා අතර උසස් සහසබඳතාව උදා - විෂයමාලාව සහ රුචිකත්වයන් (ගුණාත්මක)

ඒ. එකතුව කාලීන වීම සහ මනා තත්ත්වයේ පැවතීම (අපහරණ සහ අඩුව පුරවා ගත්)

ඔ. මධ්‍යම ඒකාබද්ධ දත්ත පදනමකට ප්‍රවේශය
ඕ. ඩිජිටල් පුස්තකාල සම්පත් වෙත ප්‍රවේශය
උ. වෙබ් අඩවි තොරතුරු වෙත ප්‍රවේශය
ඌ. සම්පත්වල ප්‍රවේශය, සම්බන්ධීකරණය සහ බෙදාහදා ගැනිම සඳහා ක්‍රියාපටිපාටි

**5. කාලීන, ඕනෑම අවස්ථාවක පවතින සහ විෂයමාලාවේ අපේක්ෂාවන්ට සහායවන තාක්ෂණයන් පුස්තකාල සතුවීම - ඔව් - තරමක් - නැත**

අ. පුස්තකාල වැඩසටහන තාක්ෂණයන්ගේ ඵලදායී සහ වගකිවයුතු භාවිතය ඉගැන්වීම
ආ. නව හා අර්ථවත් ආකාරවලින් තොරතුරු සෙවීමට, විශ්ලේෂණයට, සංස්ලේෂණයට සහ සන්නිවේදනයට සහාය වීමට ප්‍රමාණවත් සේවා ස්ථාන සහ මෘදුකාංග පැවතීම
ඇ. සතියේ පැය විසිහතර පුරාම තොරතුරු සම්පත් හා ඇතැම් දත්ත පදනම් වෙත පාසලේ සියලු සිසුන් හා ගුරුවරුන් සඳහා ප්‍රවේශය
ඈ. ස්වයංක්‍රීය පද්ධති හරහා මූලික දෛනික පුස්තකාල කටයුතු සංවිධානය හා කළමනාකරණය

**6. පුස්තකාල පහසුකම් සුරක්ෂිත, නම්‍යශීලී සහ ඉඩකඩ සහිත වීම සහ විවිධ ඉගෙනුම් ක්‍රියාකාරකම්වල යෙදීමට හොඳින් සැලසුම් කර තිබීම - ඔව් - තරමක් - නැත**

අ. තනිව, කුඩා කණ්ඩායම් ඉගෙනුම සහ පන්තිකාමර උපදේශකත්වය සඳහා ඉඩකඩ තිබේද
ආ. බිහිවෙමින් පවතින නව තාක්ෂණයන් සහ ව්‍යවහාරයන් සඳහා අනුගතවීමට සැලසුම් කර තිබේද
ඇ. නව සහ සාම්ප්‍රදායික කාර්යයන්, කාර්යක්ෂමතාව, ගුණාත්මකභාවය සහ වර්ධනය සඳහා පුස්තකාල ප්‍රතිව්‍යුහගත සහ වින්‍යාසගත කිරීමේ දී නම්‍යශීලීත්වය සඳහා අවකාශ පැවතීම
ඈ. සුවපහසු ද - ශබ්දය, ආලෝකය, උෂ්ණත්වය, විදුලි රැහැන්, ගෘහභාණ්ඩ
ඉ. උපදේශාත්මක දිනයට පෙර දිනය තුළ සහ ඉන් පසු ප්‍රවේශය පවතී ද
ඊ. පෙනුම ආකර්ෂණීය ද
එ. සුරක්ෂිත ද

## E ඇමුණුම

### පාසල් විදුහල්පතිවරුන් සඳහා පාසල් පුස්තකාල ඇගැයීම පරීක්ෂා කිරීමේ ලැයිස්තුව

පාසල් විදුහල්පතිවරුන් සඳහා පාසල් පුස්තකාල වැඩසටහන පරීක්ෂා කිරීමේ දොළොස් වැදෑරුම් ලැයිස්තුව (ඇමෙරිකා එක්සත් ජනපදය)

මූලාශ්‍රය - **Doug Johnson's Blue Skunk Blog**

මෙම මෙවලමෙහි අභිප්‍රාය පුස්තකාලයාධිපතිගේ හෝ පුස්තකාල වැඩසටහන්වල විධිමත් ඇගැයීමක් ලෙස යොදා ගැනීම නොවේ. ඒ වෙනුවට ඔබගේ පාසලේ සමස්ත වැඩසටහනෙහි ප්‍රධාන බලපෑමක් නිමවීමට ඔබට අතිරේක සම්පත් සහ සහාය අවශ්‍ය විය හැකි ක්ෂේත්‍ර පිළිබඳ පරිපාලකයන්ගේ දැනුවත්භාවය ගොඩනැගීමට සහායවීම මෙහි අභිප්‍රාය වේ.

පසුගිය 20 වසර තුළ තාක්ෂණයෙහි, ඉගෙනුම් පර්යේෂණවල සහ පුස්තකාල වෘත්තියේ සිදුව ඇති ශීඝ්‍ර වෙනස්කම්, පාසල් පුස්තකාල වැඩසටහන්වල බලපෑමෙහි පුළුල් විෂමතා නිර්මාණය කර ඇත. ඔබගේ පුස්තකාල කාලීනව පවත්වා ගෙන යයි ද? පහත දැක්වෙන පරීක්ෂක ලැයිස්තුව ඔබගේ වැඩසටහන නොපමාව ඇගැයීමට යොදා ගත හැකිය.

### 1. වෘත්තීය කාර්යමණ්ඩලය සහ රාජකාරී

- ⋆ පූර්ණ වශයෙන් බලයලත් පාසල් පුස්තකාලයාධිපතිවරයකුගේ සේවය ඔබගේ පුස්තකාලය සතුවේ ද?
- ⋆ එම පුද්ගලයා පූර්ණ වශයෙන් වෘත්තීමය රාජකාරිවල නියැලේ ද? සියලු පුස්තකාල කාර්යමණ්ඩලයට, එනම්, ලිපිකාර, තාක්ෂණික සහ වෘත්තීය, ලිඛිත රැකියා විස්තරය තිබේ ද?
- ⋆ රජයේ සහ ජාතික පුස්තකාල සංගම් මගින් පළ කරන කාලීන වෘත්තීය ප්‍රකාශනවල සඳහන් කර ඇති පරිදි පුස්තකාලයාධිපති තම වෙනස් වන භූමිකාව වටහා ගෙන සිටී ද?
- ⋆ පුස්තකාලයාධිපති තොරතුරු සාක්ෂරතාව සහ තොරතුරු තාක්ෂණයන්හි මෙන්ම අන්තර්ගත ක්ෂේත්‍රය වෙතට මෙම කුසලතා සමෝධානයෙහි කාර්යමණ්ඩල සංවර්ධන අවස්ථා නිරන්තරයෙන් සපයයි ද?
- ⋆ පුස්තකාලයාධිපති වෘත්තීයවේදී සංවිධානයක ක්‍රියාකාරී සාමාජිකයෙක් ද?
- ⋆ පුස්තකාලයාධිපති ගුරුමණ්ඩලයේ පූර්ණ සාමාජිකයෙකු ලෙස සලකයි ද?

### 2. වෘත්තීය සහාය

- ⋆ ලිපිකාර කාර්යයන්ට වඩා වෘත්තීමය රාජකාරිවල ඔහුට/ ඇයට යෙදිය හැකි පරිදි ප්‍රමාණවත් ලිපිකාරමය සහායක් පුස්තකාලයාධිපති සතුවේ ද?
- ⋆ තාක්ෂණික කාර්යයන්ට වඩා වෘත්තීමය රාජකාරිවල ඔහුට/ ඇයට යෙදිය හැකි පරිදි ප්‍රමාණවත් තාක්ෂණික කාර්යමණ්ඩලයක් පුස්තකාලයාධිපති සතුවේ ද?

- සැලසුම්කරණයට සහ නායකත්වයට වගකියන දිස්ත්‍රික් පුස්තකාල පරීක්ෂකවරයකු, නායකත්ව කණ්ඩායමක් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියකු සිටී ද?
- විදුහල්පති, ක්ෂේත්‍ර නායකත්ව කමිටු සහ කාර්යමණ්ඩල සංවර්ධන කණ්ඩායම් පුස්තකාල කාර්යමණ්ඩලය තම කුසලතා හා දැනුම යාවත්කාලීන කරන වැඩමුළු, වෘත්තීයවේ දී රැස්වීම් සහ සම්මන්ත්‍රණවලට සහභාගී කිරීම දිරිමත් කරයි ද?
- පුස්තකාලයාධිපති ඔබගේ දිස්ත්‍රික් වෘත්තීය ඉගෙනුම් ප්‍රජාවන්හි, මෙන්ම අවිධිමත් පුද්ගල ඉගෙනුම් ජාලවල සහභාගිත්වය දරයි ද?

## එකතුවේ ප්‍රමාණය සහ සංවර්ධනය

- පුස්තකාලයේ පොත් සහ ශ්‍රව්‍යදෘශ්‍ය එකතුව විෂයමාලාවේ අවශ්‍යතා සපුරාලන්නේ ද? මූලික එකතුවේ ප්‍රමාණ ස්ථාපිත කර ඇත් ද? එකතුව මනාව අපහරණය කරයිද?
- පවත්නා මාධ්‍ය විවිධත්වය වෙනස් ඉගෙනුම් ශෛලීන් ආමන්ත්‍රණය කරනු ඇත්ද?
- අවශ්‍ය වන විට එකතුවට මාර්ගගත සම්පත් එක් කර තිබේ ද? මෙම සම්පත්වලින් ප්‍රයෝජන ගැනීමට සිසු කණ්ඩායම් සඳහා ප්‍රමාණවත් පරිගණක සහ අන්තර්ජාල ක්ෂේත්‍ර පළල පවතී ද?
- මෑතකදී මුද්‍රිත එකතුවේ ප්‍රමාණය සහ ඩිජිටල් සම්පත්වල සමතුලනය තක්සේරු කර ඇත් ද? මාර්ගගත දායකත්වයන් විසින් ඇතැම් මුද්‍රිත මාධ්‍ය ඉවත් කර එම ස්ථානය අත් කර ගෙන තිබේ ද? පෙර දී මුද්‍රිත ද්‍රව්‍යවලට භාවිත කළ අවකාශය ඵලදායි ලෙස යළි අර්ථ ගන්වා තිබේ ද?
- වෘත්තීය තේරීම් මූලාශ්‍රවලින් නව ද්‍රව්‍ය තෝරා ගෙන එකතුව සිතියම්ගත කිරීම හරහා විෂයමාලාවට සම්බන්ධ කර ඇත් ද?

## 4. පහසුකම්

- පුස්තකාලය පිහිටා ඇත්තේ සියලුම පන්තිකාමරවල සිට ඕනෑම අවස්ථාවක ප්‍රවේශ විය හැකි ස්ථානයක ද? සන්ධ්‍යාවේ සහ සති අන්තවල ප්‍රජා කාර්යයන් සඳහා භාවිත කිරීමට හැකි බාහිර ප්‍රවේශ දොරටුවක් එයට තිබේ ද?
- කල් පවත්නා ගෘහභාණ්ඩ, උපදේශාත්මක ප්‍රදර්ශන සහ තොරතුරු ඇතුළත් පෝස්ටර සහිත ඉගෙනුමට සුදුසු පරිසරයක් පුස්තකාලය සතුවේ ද? ශබ්දය අඩු කිරීමට සහ ඉලෙක්ට්‍රොනික මෙවලම් සුරක්ෂිත කිරීමට පුස්තකාලයේ බිම විදුලි කාන්දුවෙන් තොර පලස් අතුරා ඇත් ද? ඉහළ උෂ්ණත්වයෙන් සහ ආර්ද්‍රතාවෙන් ද්‍රව්‍ය හා උපකරණවලට හානි නොවන ලෙසත් වසන්ත කාලයේ දී ක්‍රියාකාරකම් සඳහා භාවිත කළ හැකි ලෙසත් පුස්තකාලයේ කාලගුණය පාලනය කර තිබේ ද?
- පුස්තකාලය තුළ පොදු උපදේශනාත්මක කලාප, කතන්දර කලාපයක් (ප්‍රාථමික පාසල්වල), ඉදිරිපත් කිරීමේ කලාපයක් (ද්විතීයික පාසල්වල) සහ තනි පුද්ගලයන්, කුඩා කණ්ඩායම් සහ සමස්ත පන්තිවලට වැඩ කිරීමට කලාපයක් පවතී ද?

- ★ පුස්තකාලය තුළ පන්තියක් සමග හෝ තනිව වැඩ කරන සිසුන් හා ගුරුවරුන් සඳහාත් ඉගැන්වීමට භාවිත කිරීමට පුස්තකාලයාධිපතීන් සඳහාත් පරිගණක විද්‍යාගාර හෝ රැහැන් රහිත ලැප්ටොප්/ ජාලපොත් පුස්තකාලය සතුව පවතී ද? බහුමාධ්‍ය සේවා ස්ථාන සහ ඩිජිටල් වීඩියෝ නිෂ්පාදන පහසුකම් පුස්තකාලයේ පවතී ද? පුස්තකාලය ඊට සහාය සපයයි ද?
- ★ ප්‍රමාණවත් සංඛ්‍යාවකින් යුත් ශබ්ද, වීඩියෝ සහ දත්ත රැහැන් සමඟ පුස්තකාලය මුළුමනින්ම ජාලගත කර තිබේද? රවුටර, ගොනු සර්වර්, වීඩියෝ Head ends සහ ස්ථාවර තාක්ෂණික කාර්යමණ්ඩලයක් සමඟ මෙම තොරතුරු ජාලවල කේන්ද්‍රය ලෙස පුස්තකාලය කටයුතු කරයි ද?
- ★ ශිෂ්‍යයන්, කාර්ය මණ්ඩලය සහ පවුල සඳහා සම්බන්ධිත සම්පත් සමඟ පුස්තකාලය ප්‍රයෝජනවත්, යාවත් කාලීන වෙබ් නියෝජනයන් නඩත්තු කරයිද?

## 5. විෂයමාලාව සහ සමෝධානය

- ★ පුස්තකාලයාධිපති ශ්‍රේණි මට්ටමේ සහ /හෝ කණ්ඩායම් සැලසුම් කිරීමේ කණ්ඩායම්වල සක්‍රීය සාමාජිකයෙක් ද?
- ★ පුස්තකාලයාධිපති විෂයමාලා අන්තර්ගතය රචනා කිරීමේ කමිටුවල සක්‍රීය සාමාජිකයෙක් ද?
- ★ පුස්තකාලයාධිපති ශ්‍රේණි මට්ටමේ හෝ අන්තර්ගත ක්ෂේත්‍රයේ වෘත්තීය ඉගෙනුම් ප්‍රජාවේ කොටසක් ද?
- ★ අන්තර්ගත ක්ෂේත්‍රයේ විෂයමාලා විමසුම් චක්‍රයේ කොටසක් ලෙස පුස්තකාල සම්පත් විභාග කරයි ද?
- ★ පුස්තකාල හා තොරතුරු තාක්ෂණ කුසලතා වෙනම ඉගැන්වීමට වඩා එය අන්තර්ගත ක්ෂේත්‍රයේ කොටසක් ලෙස උගන්වයි ද? තොරතුරු ඇගැයීම, පිරිසැකසීම සහ තොරතුරු සන්නිවේදනය ඇගයීමේ සාක්ෂරතා කුසලතා මෙන්ම ප්‍රවේශවීමේ කුසලතා උගන්වනු ලබයි ද?
- ★ මාර්ගගත සම්පත්වල සුරක්ෂිත සහ යෝග්‍ය භාවිතය තොරතුරු හා තාක්ෂණ සාක්ෂරතා විෂයමාලාවේ කොටසක් ද?

## 6. සම්පත් පාදක ඉගැන්වීම

- ★ පාසලේ සහ දිස්ත්‍රික් නායකත්වයේ සහාය ඇතිව පුස්තකාලයාධිපති පෙළ පොත ඉක්මවා යන ඉගැන්වීම් ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරයි ද? උපදෙස් වෙන් කර හඳුනා ගැනීමට සහාය වන ද්‍රව්‍ය සපයයි ද?
- ★ ගුරුවරුන් සහ පරිපාලකයන් උපදේශාත්මක සැලැස්මක් සහ තාර්කික තක්සේරු සම්පත් ලෙස පුස්තකාලයාධිපති දකී ද? පුස්තකාල වැඩසටහන සියලු විෂයමාලා ක්ෂේත්‍ර පුරා විමසුම් පාදක සහ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රියාකාරකම්වලට සහාය වේ ද? පුස්තකාලයාධිපති විචාරාත්මක චින්තන කුසලතා සහ වගකිව යුතු ඩිජිටල් පුරවැසිභාවය

සංවර්ධනයට සහ ව්‍යවහාරයට හැකිවන අවස්ථාවන්ගේ පුළුල් පරාසයක් නිර්මාණය කිරීමට සිසුන් සහ ගුරුවරුන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කරයි ද?

- ගුරුවරුන්ගේ සූදානම ආවරණය කිරීමේ පමණක් යෙදීමට වඩා පන්තිකාමර ගුරුවරුන් සමඟ ඉගැන්වීමේ කොටසක් වීමට පාසලේ නම්‍යශීලී කාලසටහන පුස්තකාලයාධිපතිට අවකාශ දෙයි ද?
- පවත්නා සියලු ශ්‍රේණි මට්ටම් සඳහා පැහැදිලිව රචිත තොරතුරු සාක්ෂරතා සහ තාක්ෂණ ප්‍රමිති ලකුණු කට්ටලයක් තිබේ ද? මෙම ප්‍රමිති ලකුණු පුස්තකාලයාධිපති සහ පන්තිකාමර ගුරුවරයාගේ සාමූහික ප්‍රයත්නයකින් තක්සේරුවට ලක් වේ ද? මෙම තක්සේරුවල ප්‍රතිඵල උනන්දුවන්නන් සමඟ බෙදා හදා ගනී ද?

## 7. තොරතුරු තාක්ෂණය

- පුස්තකාලය එහි පාඨකයන් හට පහත දැක්වෙන නවතම තොරතුරු තාක්ෂණයන් වෙතට ප්‍රවේශය සපයයි ද?
- පුස්තකාලයේ ඇති එකතුව සඳහා මාර්ගගත සූචිය සහ සංසරණ ක්‍රමය
- දිස්ත්‍රික්කයේ පාසල් පුස්තකාල එකතුවල මාර්ගගත ඒකාබද්ධ සූචියට ප්‍රවේශය සහ අන්තර් පුස්තකාල පිරුළු පවත්වා ගෙන යා හැකි මහජන, ශාස්ත්‍රීය සහ විශේෂ පුස්තකාලවල සූචි වෙත ප්‍රවේශය.
- අන්තර්ජාලය වෙත සම්පූර්ණ මාර්ගගත ප්‍රවේශය
- සම්පූර්ණ පෙළ සහිත සඟරා අනුක්‍රමණිකා, විශ්වකෝෂ, සිතියම් පොත්, ගිවිසුම්, ශබ්දකෝෂ, පර්යාය පද කෝෂ, පාඨක උපදෙස් සංග්‍රහ සහ ලිපි වැනි මාර්ගගත විමර්ශන මෙවලම්වල පුළුල් විවිධත්වයක්
- වදන් පිරිසැකසුම්, බහුමාධ්‍ය සහ ඉදිරිපත් කිරීමේ වැඩසටහන්, පැතුරුම්පත්, දත්ත පදනම්, ඩෙස්ක්ටොප් ප්‍රකාශන වැඩසටහන්, ග්‍රැෆික් නිර්මාණ වැඩසටහන්, ස්ථාවර සහ චලන ඩිජිටල් රූප සංස්කරණ මෘදුකාංග වැනි සිසුන්ගේ හැකියා මට්ටමට ගැලපෙන පරිගණකගත ඵලදායිතා වැඩසටහන්වල පුළුල් විවිධත්වයක්
- විකී, බ්ලොග් සහ තොරතුරු බෙදාහදා ගැනීමේ වෙනත් වැඩසටහන් වැනි සහයෝගිත්ව ඉගෙනුම්/ජාලකරණ මෙවලම් සහ මාර්ගගත ඵලදායිතා මෙවලම් හා ගොනු ගබඩා වැනි වලාකුළු පරිගණක සම්පත් වෙත ප්‍රවේශය
- ඩෙස්ක්ටොප් සම්මන්ත්‍රණ උපකරණ හා මෘදුකාංග වෙත ප්‍රවේශය
- විෂයමාලාවට සහාය වන ව්‍යවහාරයන්, අනුකරණයන් සහ උපදෙස් සැපයීම් ඇතුළු අධ්‍යාපනික පරිගණක වැඩසටහන්
- පුස්තකාලයාධිපති විසින් ගුරුවරුන් හට සහ ගුරුවරුන් සමඟ මෙම සම්පත් භාවිතයට අවශ්‍ය කුසලතා උගන්වන්නේ ද?

## 8. විමර්ශන, ජාලකරණය සහ අන්තර්පුස්තකාල පිරුළු

- ★ පාසලේ සිසුන් හා කාර්යමණ්ඩලයට ඵලදායි සහ කාලීන විමර්ශන සේවා සැපයීමට අවශ්‍ය විශේෂඥතාව ඔබගේ පුස්තකාලයාධිපතිට තිබේ ද?
- ★ ඔබගේ පාසල කලාපීය බහුමාදිලි පද්ධතියක හෝ පුස්තකාල සාමූහිකයක සාමාජිකයෙක් ද?
- ★ පාසල් පුස්තකාලයේ එකතුව මඟින් සපුරාලිය නොහැකි සිසු හා කාර්යමණ්ඩල ඉල්ලීම් සඳහා පුස්තකාලයාධිපති අන්තර් පුස්තකාල පිරුළු භාවිත කරයි ද?
- ★ පුස්තකාලයාධිපති ප්‍රාදේශීය සහ කලාපීය වශයෙන් වෙනත් පාසල් සමඟ සාමූහික සැලසුම්කරණය සහ මිල දී ගැනීම් අවස්ථාවල දී සහභාගිත්වය දරයි ද?

## 9. සැලසුම්කරණය/වාර්ෂික ඉලක්ක

- ★ දිගුකාලීන ඉලක්කවල දිස්ත්‍රික් ව්‍යාප්ත කට්ටලයක් පුස්තකාල වැඩසටහනට තිබේ ද?
- ★ පුස්තකාලයාධිපති පාසලේ නායකත්වය සමඟ සහයෝගයෙන් පාසලට සහ විෂයමාලා ඉලක්කවලට ඍජුව බැඳුණු දිගුකාලීන සැලසුම් මත පදනම් වූ වාර්ෂික ඉලක්ක කට්ටලයක් සකසයි ද?
- ★ පුස්තකාලයාධිපතිගේ ඇගැයීමේ කොටසක් වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම මත පදනම් වී ඇත් ද?
- ★ පුස්තකාල වැඩසටහන පාසලේ සැලසුම්කරණ කමිටුවෙහි නියෝජනය වේ ද? දිස්ත්‍රික් තාක්ෂණික සැලසුම්කරණ කමිටුව මත නියෝජනය වේ ද?

## 10. අයවැය

- ★ පුස්තකාල වැඩසටහන් අයවැය, ශුන්‍ය පාදක හෝ අරමුණු පාදක අයවැයක් ද?
- ★ පුස්තකාලයාධිපති, ඉල්ලුම් කර ඇති ද්‍රව්‍ය, උපකරණ සහ සැපයීම් සඳහා පැහැදිලි හේතු ලියා දක්වයි ද?
- ★ වැඩසටහන සඳහා වන නඩත්තු සහ වර්ධන සංරචකයන් දෙකම අයවැයෙන් පිළිබිඹු වේ ද?
- ★ පුස්තකාලයාධිපති වියදම් පිළිබඳ පැහැදිලි නිවැරදි වාර්තා පවත්වා ගෙන යයි ද?
- ★ පුස්තකාලයාධිපති ප්‍රතිපාදන පවත්නා විට ඒවා ඉල්ලුම් කිරීමට ලේඛන සකසයි ද?

## 11. ප්‍රතිපත්ති/ සන්නිවේදන

- ★ තේරීම සම්බන්ධ පාලක මණ්ඩල ප්‍රතිපත්ති සහ යළි සලකාබැලීමේ ප්‍රතිපත්ති කාලීන ද? බලගන්වා තිබේ ද? බුද්ධිමය නිදහස සහ පුස්තකාල පාඨකයන්ගේ පෞද්ගලිකත්වයට සම්බන්ධ මූලධර්ම පිළිබඳ කාර්යමණ්ඩලය දැනුවත් ද? මෙම ප්‍රතිපත්ති ඩිජිටල් සම්පත් දක්වා ව්‍යාප්ත කර තිබේ ද?
- ★ අන්තර්ජාලය සහ තාක්ෂණ භාවිතය සඳහා චෝදනාවලින් සුරක්ෂිත සහ පිළිගත හැකි භාවිත ප්‍රතිපත්තියක් හෝ වගකිවයුතු ප්‍රතිපත්තියක් දිස්ත්‍රික්කයට තිබේ ද?

- ⋆ පුස්තකාලයාධිපති ප්‍රකාශන හිමිකම් නීති පැහැදිලි කරන්නෙකු ලෙස කටයුතු කරයි ද? අන්‍යයන් ඔවුන්ගේ බුද්ධිමය දේපළ වෙත පැවරීමට කැමැති අයිතීන් නිශ්චය කිරීමට පුස්තකාලයාධිපති ඔවුනට සහාය වේද ?
- ⋆ වැඩසටහනෙහි අභිමතාර්ථ සහ සේවා සිසුන්ට, කාර්යමණ්ඩලයට, පරිපාලකයන්ට සහ ප්‍රජාවට සන්නිවේදනය කිරීමේ ක්‍රම පුස්තකාලයාධිපති සතුවේ ද? පුස්තකාලයේ වෙබ් අඩවිය වෘත්තීමය ගවේෂණයට පහසු, කාලීන සහ ප්‍රයෝජනවත් ලක්ෂණ සහිත ද? උනන්දුවන්නන් සමග සන්නිවේදනය කිරීමට පුස්තකාලයාධිපති **සමාජ මාධ්‍යමෙවලම් භාවිත කරයි ද?**

## 12. ඇගැයීම

- ⋆ වැඩසටහනෙහි අභිමතාර්ථ සහ අරමුණු සපුරා ඇති බවත් ඒවා පාසලේ සහ දිස්ත්‍රික්කයේ අරමුණු සපුරා ගැනීමට සහාය වන බවත් පෙන්වන ආකාර නිශ්චය කර වාර්තා කරයි ද?
- ⋆ පුස්තකාලයාධිපති ගුණාත්මක සහ ප්‍රමාණාත්මක මිනුම් ඇතුළත් වාර්ෂික පුස්තකාල වාර්තාවක් පරිපාලකයන්, කාර්යමණ්ඩලය සහ දෙමාපියන් වෙනුවෙන් නිර්මාණය කරයි ද?